ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ ඔක්තෝබර් 19 ඉරිදා 149 වෙළුම 21 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## ජිහාඩ් තර්ජන වතිකානයටත්




ඉස්ලාම් රාජ්‍යය සිය නිල සඟරාව වන "ඩාබික්" (DABIQ) සඟරාවේ හතරවැනි කලාපයේ මුල් කවරය හරහා ලොව කතෝලිකයින් වෙත දරුණු තර්ජනයක් එල්ල කර ඇතැයි විදෙස් වාර්තා සඳහන් කරයි.

වතිකානයේ සා. පීතර චතුරස්‍රයේ පිහිටි ස්ථම්භයේ සිය ඉස්ලාම් රාජ්‍යයේ ධජය පිහිටුවා ඇති ආකාරයෙන් සැකසූ ඡායාරූපයක් පළ කිරීමත් සමඟින් ඔවුන් මෙම තර්ජනය සිදු කර තිබේ. එසේම එම කවරය තුළ "පරාජයට පත් වූ කුරුස යුද්ධය" යන වචනය විශාල අකුරෙන් යොදන්නත් මේ ජිහාඩ් සාමාජිකයින් ක්‍රියා කර තිබෙන බව විශ්ලේෂකයින් සඳහන් කරයි.

මීට අමතරව කතෝලික කාන්තාවන් ලිංගික වහලියන් සේ විකිණීම නිත්‍යානුකූල බවද මෙම සඟරාව සඳහන් කරයි.

දැනට වතිකානයේ ආරක්ෂාව ඉහළ දමා ඇති අතර විදේශිකයනට රැකියා සඳහා ඉතාලියට පැමිණීම අවම කරන්නටත්, අන්‍යාගමික ස්ථාන පිහිටුවාලීම නවතාලීමටත් කටයුතු කළ යුතු බව විදෙස් ආරක්ෂක මණ්ඩල පවසා ඇතැයි වාර්තා වේ.

### ක්‍රිස්තු වර්ෂ 2014 නොවැම්බර් 30 වන දා සිට 2016 පෙබරවාරි 02 දක්වා

# පවුල් හා පැවිදි වර්ෂයක් ප්‍රකාශයට පත් කැරේ

**අද දින (2014. 10. 19) නිමාවන ලෝක රදගුරු සංසද විශේෂ හමුවේ දී පවුල පිළිබඳ සුවිශේෂී කෙටුම්පතක් සම්මත කර ගැනීමට නියමිතව තිබියදී කොළඹ අගරදගුරු වසම 2014 නොවැම්බර් 30 වැනිදා සිට 2016 පෙබරවාරි 02 දක්වා පවුල් හා කැප කළ ජීවිත උදෙසා වර්ෂයක් ප්‍රකාශයට පත් කිරීමට යයි. මේ අතර විශ්ව සභාවද පැවිදි පූජක ජීවිත වෙනුවෙන් කැපකළ වසරක් නම් කරන්නට කටයුතු කරමින් සිටී.**

අගරදගුරු වසමේ වැඩ පිළිවෙල වැඩසටහන් සම්බන්ධීකාරක ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමා හා අගරදගුරු පදවි පැවිදිවරය පිළිබඳ කොමිසමේ සභාපති අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගේ දායකත්වයෙන් සකස් වන අතර පවුල් වසර කමිටු සභාපතිත්වය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් උසුලනු ලැබේ. 2010 වසරේ ප්‍රකාශයට පත් කළ දිව්‍ය සත්ප්‍රසාද දශකයේ තවත් වසරක් ලෙස මෙය පැවැත්වේ.

15 පිටුවට ››



කැපවුනු ජීවිත පිළිබඳ අලුත් ආරකින් ලෝකය දැනුම්වත් කරන්නට 2015 දී සුදු සබය සැරසෙද්දී විවිධ රටවලින් ආ පැවිදි පිරිසක් එකට හිඳ ගත් ඡායාරූපයකි මේ...

## ගුවන් විදුලි නත්තල් බැති ගී තරගය

ඔබ කංඩායමත් නත්තල් බැති ගී තරගයට සහභාගි වීමට කැමති නම් විස්තර ලබා ගැනීමට පහත සඳහන් ලිපිනයෙන් විමසන්න. ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07. දු. අංක 0772 981526

## මරිය වසරේ කනිටු මරිය භටයන්

කොළඹ පදවියේ කනිටු මරිය හමුදා භටයෝ මරිය වසරට සමගාමිව 2014.10.22 දින උදේ 9.00 ට කොළඹ සා. ජෝශප් විදුහලේ බොන්ජින් ශාලාවට එක්රැස් වෙමින් කනිටු මරිය හමුදා හමුව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙදින සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ගරු පියතුමන් විසින් දරුවන් ආත්මික සංහිඳියාවකට මෙහෙයවමින් මරිය හමුදා ක්‍රියාවලිය පිළිබඳ විශේෂයෙන් දැනුම්වත් කරනු ඇත. මේ වන විටත් සෙනාටස් සභාවට අනුබද්ධිත ඉංග්‍රීසි කනිටු ක්‍යුරියාව මගින් අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. කිසියම් අතපසුවීමක් මත ආරාධනා නොලැබී ඇති කොළඹ පදවියේ සියලුම ක්‍යුරියා හා ප්‍රසිඩියාවන්හි කනිටු භටයන් සැමට මෙයින් නැවත ආරාධනා කරමු. **(එම්. එම්. ඒ. සහන් පෙරේරා - කොළඹ කනිටු ක්‍යුරියාව)**

## සුනිල් සාන්ත ගී ප්‍රසංගය

✒ ඇල්ප්‍රඩ් නෙල්සන්

හෙළ ගීයේ පෙර ගමන්කරුවාණන් වූ සුනිල් සාන්තයන්ගේ ජන්ම ශත සංවත්සරයට පෙර සූදානමක් ලෙස 99 ජන්ම සංවත්සරය නිමිත්තෙන් "වරෙන් හීන් සැරේ රිදී වලාවේ" ගීත ප්‍රසංගය ඔක්. 25 දා සවස 6.30 ට නෙළුම් පොකුණේ දී ගීතවත්වේ.

සුනිල් සාන්තයන්ගේ ගීත ඇතුළත් මේ ප්‍රසංගයේදී අයිවෝ ඩෙනිස්, ටී. එම්. ජයරත්න, කීර්ති පැස්කුවෙල්, චරිතා ප්‍රියදර්ශනී, සමිතා මුදුන්කොටුව මෙන්ම නව පරපුරේ කසුන් කල්හාර, අමල් පෙරේරා, ඉන්දිකා උපමාලි, නදීක ගුරුගේ ආදිහු ද ගී ගයති.

සුරේෂ් මාලියද්ද සංගීතයෙන් ද රවිබන්දු විද්‍යාපති නර්තනයෙන්ද, ඉන්ද්‍රසිරි සුරවීර කථනයෙන් ද දායක වන අතර සුනිල් සාන්ත සමාජය වෙනුවෙන් විජිත් කුමාර් සේනාරත්න, ලොයිඩ් ප්‍රනාන්දු මෙය සංවිධානය කරති.

## ශ්‍රී ලංකා බයිබල් සංගමයෙන් "නිසංසලේ දෝතක්"

ලෝක වැඩිහිටි දිනය නිමිති කොටගෙන ශ්‍රී ලංකා බයිබල් සංගමය විසින් "නිසංසලේ දෝතක්" නමින් වැඩිහිටියන් සඳහා විශේෂ වූ වැඩසටහනක් සංවිධානය කර ඇත.

ඔක්. 25 සෙනසුරාදා උදෑසන 9.30 සිට සවස 5.00 දක්වා ජා-ඇල, දඬුගම ශු. මාක් තුමාගේ දේවස්ථාන භූමියේදී පවත්වනු ලබන මෙහිදී වැඩිහිටියන් සඳහා අක්ෂි සායනයක් ද ඇස් කණ්නාඩි 500 ක් නොමිලයේ ලබා දීම, වෛද්‍ය පරීක්ෂණ, ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම් පත් නිකුත් කිරීම ඇතුළු ප්‍රීතිමත් අවස්ථාවන් ද ඔවුනට සලසා දෙනු ඇත.

## ජාතික කතෝලික ගිහි සංවිධාන නව නිලධාරී මංඩලය පත්වේ

**ජාතික කතෝලික ගිහි සංවිධාන මහ සභා රැස්වීමේදී ඉදිරි තෙවසර සඳහා නව නිලධාරි මඬුල්ලක් තෝරා පත්කර ගැණින.**

ගිහි කොමිසමේ සභාපති අති උතුම් නෝබට් ඇම්. අන්ද්‍රාදි නි.ම.නි. හිමිපාණන්ගේ මෙහෙයවීමෙන් පැවැති රැස්වීම හිටපු සභාපති විශ්‍රාමලත් විනිසුරු ප්‍රියන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

සභාපති - වෛද්‍ය මැක්සි ප්‍රනාන්දු පුල්ලේ, උප සභාපති - අර්ඩ්ලි පෙරේරා, ලේකම් - ක්‍රිෂෙන්සියා ප්‍රනාන්දු, උප ලේකම් සෙඩ්රික් ෆොස්ටර්, භාණ්ඩාගාරික - ශිරාන් දිසානායක, කමිටු නියෝජිතයෝ - ඉග්නේෂස් කනගරත්නම්, ලක්ෂ්මන් පොන්වීර, ප්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු.

මෙහි සාමාජිකත්වයට තෝරා ගැනෙන්නේ පදවි මට්ටමින් වන කතෝලික වෘත්තීයවේදින් හා ව්‍යාපාරිකයන්ගෙන් වන අතර අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ එවැන්ජලි ගවුඩියම් (සුවිශේෂයේ ආනන්දය) අපෝස්තලික අනුශාසනා පත්‍රය ගැන ගරු ටෝනි මාටින් පියතුමා සභාව දැනුම්වත් කළේය.

## දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමි අනුස්මරණ දිව්‍ය යාගය ඔක්. 29 දා තේවත්තේ දී

✒ සී. ආර්. ඩික්සන් ඇන්ටනි

දේව සේවක තෝමස් කාදිනල් කුරේ 26 වන අනුස්මරණ දිව්‍ය යාගය මෙවරද සුපුරුදු පරිදි රාගම, තේවත්ත ලංකා අප ස්වාමිදූ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේදී ඔක්තෝබර් 29 බදාදා පෙ.ව. 9.00 ට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරේ.

දේව සේවකයාණන් ශුද්ධවරයට එසැවීමේ කමිටුව, තේවත්ත සිද්ධස්ථාන පරිපාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමන් හා අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමි අනුස්මරණ කමිටුව සමග කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් විසින් මෙය සංවිධානය කැරේ.

15 පිටුවට ››



## කතෝලික වෛද්‍ය කවය

සා. ලූක්, සා. කොස්මස් සහ ඩේමියන් කතෝලික වෛද්‍ය කවයේ වෛද්‍ය එම්. පී. එම්. කුරේ අනුස්මරණ ව්‍යක්ත ප්‍රසිද්ධ දේශනය ඔක්. 25 සවස 7.00 ට ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ ලයනල් අනුස්මරණ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

"Christianity-the Guiding Spirit - Experiences of a Surgeon" යන මැයෙන් මෙවර එම දේශනය පවත්වනු ලබන්නේ වෛද්‍ය ගාමිණී ගුණතිලක විසිනි.

Please Like pope visit sri lanka official facebook page.
www.facebook.com/popevisitsrilanka2015 ■ www.popefrancissrilanka.com

# මරිය වසර තුළ විවිධ අධ්‍යාත්මික ව්‍යායාමයන් දියත් වීම දිරිගන්වන සුළුයි

**අගරදගුරු පදවියේ මරිය වසර තුළ විවිධ අධ්‍යාත්මික ව්‍යායාමයන් දියත් වී ඇති බව දක්නට ලැබීම සැබවින්ම අප සැම දිරි ගන්වන සුළුය. දේව මාතාවන්ට දක්වන ගරුත්වය මෙන්ම අචල ආදරය තුළ පොහොණි වන කතෝලික ජීවිත වල ගැඹුරු අධ්‍යාත්මිකත්වය අප මීසම් අතර මෙන්ම පවුල් වලද වැඩි වර්ධනය කිරීම අප කාගෙත් යුතුකමයි.**

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එලෙස සඳහන් කළේ වත්තල ගල්වැටියේ ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ 128 වන වාර්ෂික මංගල්‍යය සහ ශු. ජපමාල රාජේස්වරියගේ සංගමයේ 39 වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කරන ලද සුබාශිංසන පණිවුඩයෙනි.

**ක්ලැරන්ස් ලෙනාඩ්**



රත්නපුර සාන්ත පේදුරු පාවුලු දහම් පාසලට ආධාර පිණිස පොලක් රත්නපුර මීසම් ධර්මෝපදේශ මධ්‍යස්ථානයේදී පැවත්වින. ගරු දීපානි සොයුරිය ඇතුලු දහම් ගුරුවරුන් කොල කැද පානය කළ අයුරු.

**තියබෝල්ඩ් සමරතුංග**

## ශුභාශිංසන



මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය ඔක්තෝබර් 20 දාට යෙදේ. එතුමනට සමිඳු ආසිරි බහුලව ලැබේවායි ප්‍රදීපය ශුභාශිංසන පිරිනැමේ.



දෙහිගහපිටිය ශා. තෙරේසා දෙවි මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය මිණිපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් පෙරේරා සා.බෙ.නි හිමිපාණන් අතින් සිදුවූ අයුරු. සා. තෙරේසා මුනිවරියගේ ප්‍රතිමාව රැගත් පෙරහරට සිසිල් පැන් වලින් සංග්‍රහ කිරීමට පූජ්‍ය විනීත ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ බුදුනු දහම් පාසල් දරුවන් සහ ප්‍රදේශයේ සැදැහැවත් බෞද්ධ ජනතාව පියවර ගත්හ. දෙහිගහපිටිය මීසම් සේවක ගරු ජූඩ් අමිල ප්‍රනාන්දු පියතුමන්ගේ නායකත්වයෙන් මංගල කටයුතු සිදුවිය.

**සෙව්වන්දි ජයවර්ධන**

## නාවක්කල්ලිය මංගල්ලයෙන් සැදැහැවතුන් අතර ප්‍රබෝධයක්!

නාවක්කල්ලිය කරකාතිව් ග්‍රාමයේ වේලන්කන්නි මෑණියන්ගේ දෙව්මැඳුරේ මංගල්‍යය හලාවත පදවි භාණ්ඩාගාරික අතිගරු ලූක් නෙල්සන් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. තේමාව 'දෙව්මව් සමගින් සමිඳු සොයා යමු' යන්නයි.

පුත්තලම දිසානායක හා කුරිඤ්ඤම්පිටිය මීසම් සේවක ගරු සෙබස්තියන් සෙබමාලේ පියතුමන් විසින් මංගල සැඳෑ මෙහෙය පවත්වන ලදි. පොල් අතු සෙවිලි කර සැදැහැවතුන් තැනූ දේවස්ථානය වෙනුවට නව දෙව්මැඳුරක් අතිගරු ලූක් නෙල්සන් පියතුමා තලවිල මීසම් සේවක ලෙස සිටියදී ආරම්භවිය. තලවිල වත්මන් මීසම් සේවක ගරු නිහාල් පයස් පියතුමා එම කටයුතු ඉදිරියට ගෙනයමින් සිටි.

බහු ජාති ආගමික පවුල් 60 ක් පමණ මෙහි වෙසෙති. ධීවර කර්මාන්තයට සම්බන්ධ මොවුන් සමගියෙන් හා සහයෝගයෙන් කටයුතු කරනු දක්නට ලැබීම සතුටට කරුණකි. මංගල්‍යයට සමගාමීව ආත්මික පෝෂණය ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන් කිහිපයක්ම තලවිල මීසම් සේවක ගරු නිහාල් පයස් පියතුමන්ගේ අනුශාසකත්වයෙන් ක්‍රියාවට නැගුණි. පවුල් හමුව, විවාහ සකස් කිරීම, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාදීම. දේවස්ථාන භූමිය වැඩිදියුණු කිරීම සහ රුක් රෝපණය ඒ යටතේ විය. මෙමගින් පවුල් අතර වටිනාකම් තහවුරුවීම, විවාහ නොවූ පවුල් විවාහගත කිරීම, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම මගහැරී ඇති ළමුන්ට අවස්ථාව ලබාදීම ඇතුළු ආත්මික පෝෂණයට ඉඩ ලැබීම ආශිර්වාදයක් බව ග්‍රාමවාසීහු පවසති. ජාතික දෙව්සත්හලේ පූජක සිසු සහෝදරවරුන් විසින් විශේෂ පවුල් අධ්‍යයන වැඩසටහනක් පවත්වන ලදි.

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**

## දිප්පිටිගොඩ පාතිමා මංගල්‍යය අදයි

දළුගම මීසමට අයත් 'කුඩා බෙත්ලෙහෙම' යැයි ප්‍රකට දිප්පිටිගොඩ පාතිමා දෙව්මැඳුරේ 64 වන වාර්ෂික මංගල්‍යය අද පැවැත්වේ.

දළුගම මීසම් සේවක ගරු ජූඩ් ශ්‍යාමන් හා සහයක පියතුමන්ගෙ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මංගල්‍යය උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට ග්‍රාමයේ කිතුනු - බොදුනු සැම සැදි පැහැදි සිටිති.

**ලියෝ දිසානායක**

## පාතිමා දෙව්මව් ප්‍රතිමාව දියලගොඩට

මරිය වසරට සමගාමීව දියලගොඩ මීසම් සේවක ගරු දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමන්ගේ ඉල්ලීම පරිදි 'හෙරල්ඩ් ඔෆ් ද ගොස්පල්' සංවිධානයේ සම්බන්ධීකාරක මීගමුව - දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමන් ප්‍රමුඛ එම සංවිධානය මගින් පාතිමා දෙව්මව්ගේ ප්‍රතිමාව ඔක්තෝබර් 25 දින දියලගොඩ දෙව්මැඳුරට රැගෙන ඒමට නියමිතය.

එදින සවස 3 ට දියලගොඩ මංසන්ධියේදී ප්‍රතිමාව පිළිග ැනීමෙන් අනතුරුව, පෙරහරින් දෙව්මැඳුර කරා රැගෙන එනු ලබන අතර, එදින සිට 26 වන ඉරුදින සවස දක්වා ප්‍රතිමාව දෙව්මැඳුරේ තබා විශේෂ යාච්ඤා මෙහෙයයන් පවත්වනු ලැබේ.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## කාරුණික ඉල්ලීමයි



එඬේරමුල්ල පදිංචි අන්තෝනිගේ සංජය සඳරුවන්ට අනතුරක් සිදුවීමෙන් දෑසම නොපෙනී ගොස් ඇත. මේ වනතුරු වෛද්‍යවරුන් විසින් සැත්කම් කීපයක් කර ඇත. Lanka Hospital හි ඉන්දිය වෛද්‍ය රාජේශ් පොග්ලා විසින් එක ඇසක හෝ පෙනීම ලබා ගැනීමට අවශ්‍ය සැත්කම සඳහා රු. 375.000 ක මුදලක් නිර්දේශ කර ඇත. මෙම මුදල සපයා ගැනීමට ඔහුට හැකියාවක් නොමැති බැවින් ඔබගේ කාරුණික පිහිට පතයි. ගිණුම් අංක 101954231835 සම්පත් බැංකුව පිළියන්දල. දුරකථන අංක 071-2118745 219/24 තේවත්ත එඬේරමුල්ල වත්තල ඔහුගේ ලිපිනයයි.



මීරිගම ශු. ජපමාල දේවස්ථානයේ 98 වන වාර්ෂික මංගල්‍යය නැගෙනහිර කලාපිය නා හිමි අතිගරු සෑම් කුයින්ටස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවත්විනි. ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමාද මීසම් පාලක ගරු අනුර ශ්‍රී කමල් පියතුමන් ද මංගල්‍ය යාගයට හවුල් විය.

**රේකා දෙනිපිටිය**

## බණ්ඩිරිප්පුව ජයන්තිය අද ගුවනින් පෙ.ව. 11 ට

බණ්ඩිරිප්පුව ජපමාල මාතා සිද්ධස්ථානයේ 125 ජයන්ති මංගල්‍යය ඇසුරෙන් සකස් කළ වැඩසටහන ඔක්තෝබර් 19 ඉරිදා පෙ.ව. 11 ට ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරයවේ. 91.7 හෝ 91.9FM සම්බන්ධීකරණය සුසන්ත හෙට්ටිආරච්චි, නිෂ්පාදනය ජූඩ් අයිවන්.

## කුඩාමලේ තෙරේසා කන්‍යාවගේ දිවිය නූතන දරු පරපුරට ආදර්ශයක්!



"කුඩා අවධියේ සිට ජේසු සමිඳුන්ගේ ආදරයට පාත්‍රවූ කුඩා මලේ තෙරේසා මුනි වරියගේ ජීවිත කථාව කුඩාදරුවනට මහත් ආදර්ශයක් ගෙනදෙන්නක්. ඒ සමිඳුන් තුළ රැඳෙමින් සමිඳුන් වෙනුවෙන් මර්ධන ක්‍රියා කළ කුඩා මලේ තෙරේසා මුනිවරිය අද ශාන්තුවරියකි. ඒ තනතුරට ඇය පත් කළේ සමිඳුන් තුළ දැක්වූ ළබැඳියාවයයි"ද පේරාදෙණිය සාන්ත තෙරේසා මුනිවරියගේ වාර්ෂික මංගල්‍යයට සහභාගි වෙමින් අම්පිටිය ජාතික දෙව්සත්හලේ දර්ශන පීඨයේ ආචාර්ය ගරු ලක්මාල් පෙරේරා පියතුමා පැවසීය.

මංගල්‍යය මහා පූජාව එතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එම මංගල්‍යය මෙහෙයට ගරු පෝල් පෙරේරා, ගරු ස්ටැරඩ් මෙල්ඩර් පියතුමා සමගින් පේරාදෙණිය මීසම් සේවක ගරු ලලිත් තුෂාර අමරසිංහ පියතුමාද සහභාගි වූහ. දිව්‍ය පූජාව අවසානයේදී ශාන්ත තෙරේසා මුනිවරියගේ ප්‍රතිමාව රැගත් රිය පෙරහර සාරානන් ද පිරිවෙන මාවත හරහා ලංකා විදුලිබල මණ්ඩල කාර්යාලය අසලට ගමන් කොට නැවත දේවස්ථානයට වැඩම කරවන ලදි. අවසානයේදී බනිස් දානයක් පැමිණ සිටි සැදැහැවතුන් හට බෙදා දෙන ලදී.

**ජූඩ් ජේ. ප්‍රනාන්දු**

## මරිය හමුදා නවෝදය ඔක්. 22 දා

කොළඹ කනිටු ක්‍යුරියා පාලන සභාව හා සෙසු ක්‍යුරියා පාලන සභාවන් එකමුතුව සංවිධානය කරන මරිය හමුදා නවෝදය වැඩසටහන ඔක්. 22 දින උදේ 9.00 ට කොළඹ ශාන්ත ජෝශප් විදුහලේදි පැවැත්වේ.

ළමා අධ්‍යාත්මික පෝෂණ සහ කුසලතා වර්ධන වැඩසටහන වශයෙන් මෙය පැවැත්වීමට නියමිතය.

කොළඹ සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා සහ අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ද මරිය භටයන් අමතනු ඇත. මරිය වසර තුළ මරියාවන්ට තම උත්තම සැලකිළි දක්වා මරිය භටයන් වසර අවසන් වීමට පෙර තම දූත කාර්යය නව මාවතකට යොමුකිරීමට කනිටු මරිය හමුදා නැවත ඇරඹීම තුළින් තම සේවාව පුළුල් කිරිමටද අරමුණු කර ඇත.

**ආන්ජලෝ සිල්වා**

## සලාපුර පදවියට තේවාචාර්ය තුමන් සිව්නමක්

ඔක්තෝබර් 19 (අද) දින අම්පිටිය ජාතික දෙව්සත්හල් ලංකා අපස්වාමිදුවගේ දෙව්මැඳුරේදී හලාවත පදවියේ සහෝදරතුමන් සිව් නමක් බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දිසනි හිමිපාණන් අතින් තේවාචාර්ය ධූරය ලැබීමට නියමිතය. එතුමන් නම් ගරු ජෝශප් ජීසස්, ගරු ජීවන් දුෂාන්ත, ගරු ධනුෂ්ක හිෂාන් හා ගරු ප්‍රමේෂ් ස්වර්ණ ශ්‍රී යන සහෝදරතුමන්ලාය. ගරු ජෝශප් ජීසස් සහෝදර තුමා බොරලැස්ස මීසමේද, ගරු ජීවන් දුෂාන්ත සහෝදර තුමා වෙන්නප්පුව ජෝශප්වාස් විද්‍යාලයේද, ගරු ධනුෂ්ක හිෂාන් සහෝදරතුමා කල්පිටිය මීසමේ හා ගරු ප්‍රමේෂ් ස්වර්ණ ශ්‍රී සහෝදර තුමා වෙන්නප්පුව දෙවන ජුවාම් පාවුළු උසස් අධ්‍යාපන ආයතනයේද පුහුණුව ලැබූහ.



හංවැල්ල මීසමේ පහත්ගම දේවස්ථානයට අනුබද්ධිත නව මරිය හමුදා ප්‍රසීඩියමක් රොෂාන් ප්‍රනාන්දු ගරු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා ආරම්භ කරන ලදි. මෙම අවස්ථාවට සමාජික සමාජිකාවන් 16 දෙනෙක් සහභාගි වූ අතර මූලික දැනුම්වත් කිරීම අගරදගුරු මරිය හමුදා කොම්ට්සියම් සභාවේ බෙනී ජයමාන්න සොයුරා සිදුකළ අතර ගුරුබෑවිල මරිය හමුදාවේ සභාපති ඕලුගල සහෝදරිය හා උපසභාපති සිසිල් වැලිවිට සහෝදරයා සංවිධානය කළහ. ගිහි ධර්මදූත සේවාවේ ක්‍රියාකාරින්වූ මොරින්, රෝස් සහ ජයන්ති සහෝදරයන්ද මෙම අවස්ථාවට සහභාගිවිය.

**ඩී. ටී. එල්. එම්. ඕලුගල**

## ජාඇල කලාපීය දහම් ගුරු දිනය අදයි

ජා-ඇල කලාපීය දහම් ග-රු දිනය ඔක්තෝබර් මස 19 ඉරුදින ප.ව. 02.00 ට සීදුව සුපුවත් අරණේදී අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ජාඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර වැලිවිට පියතුමා ඇතුළු කලාපීය දිසා අධ්‍යක්ෂ පියතුමන් සහ සියලුම කලාපීය පියවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

ජා-ඇල කලාපයට අයත් තුඩැල්ල කඳාන රාගම සහ වත්තල දිසාවන්ට අයත් දහම් ගුරු මහත්ම මහත්මින් 1500 කට අධික පිරිසක් සහභාගි වන මෙදින ගරු ඩැරල් කුඤ්ඤෝ පියතුමා සහ ගරු කෙනඩි පෙරේරා පියතුමන් විසින් වැඩ සටහන මෙහෙයවනු ලබන අතර කලාපයේ ධර්මාචාර්ය විශේෂ සහ ධර්මාචාර්ය ගෞරව විභාග සමත් ගුරු මහත්ම මහත්මින් අගැයීමකටද ලක් කෙරේ. ජා-ඇල කලාපීය ධර්මෝපදේශ අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා ඇතුලු කලාපීය දහම් ගුරු කමිටුව මෙම උත්සවය සංවිධානය කරයි.

**මෙරිල් ගෝමිස්**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 ඔක්තෝබර් 19 ඉරිදා

# පවුල් සහ පැවිදි වසර

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් ක්‍රි.ව. 2010 දී ප්‍රකාශයට පත් කරන ලද දිව්‍ය සත්ප්‍රසාද දශකයේ තවත් විශේෂ කඩඉම් වර්ෂයක් ලෙස 2015 වසර පවුල් වසර ලෙස නම් කර ඇත. ඒ පිළිබඳව අද අප පත්‍රය මුල් පිටුවේ ප්‍රධාන සිරස්තලය යටතේ විස්තරයක්ද ගෙන එනු ලබයි. මෙම වසරම පැවිදි වසර වෙනුවෙන් නම් කොට අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් 2014 නොවැම්බර් 30 වැනිදා සිට 2016 පෙබරවාරි 02 දක්වා 'ආලේප කළ ජීවිත' මුල් කොට විශ්වීය වසරක් ප්‍රකාශයට පත් කිරීමටද නියමිතයි. ඒ අනුව යමින් කොළඹ අගරදගුරු පදවිය මේ වසරේ ආගමන සමය උදාවත්ම 'මරිය වසර' නිමා කොට පවුල් හා පැවිදි වසර යනුවෙන් නම් කරනු ඇත.

අපි විශ්වීය එඩේරාණන්ගේ මෙකී අත්‍යන්තයෙන්ම වැදගත් වන ප්‍රකාශනය දේශීය වශයෙන් පවුලේ ගැඹුරු ආධ්‍යාත්මයකට නිබඳවම කැප කිරීමට හැකි වන බව කාදිනල් හිමිපාණන්ගේද දැඩි විශ්වාසයයි. පවුල් ජීවිතය නියත වශයෙන්ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හා බද්ධ වන අතර දිව්‍ය සත්ප්‍රසාදයීය සක්‍රමේන්තුව මිනිසියාව හා දෙවියන්වහන්සේ අතරත්, ඔවුන්වහන්සේ තුළ සාංඝිකත්වයට ඇරියුම් ලබන සියල්ලන් අතරත් බද්ධව පවතින බව අපේ කතෝලික පවුල් සංස්ථා අත්විදීම තුළින් ගැඹුරින් අත්දකින්නට සුදුසු කාල පරිච්ඡේදයක් ඉදිරියේදී උදාවන බවත් එයට සාධනීය වශයෙන් ප්‍රතිඋත්තර දීමට මීසම්, පදවි හා කළාපීය මට්ටමින් දැන් දැන් සිටම අවදි වන්න යන කාදිනල් හිමිපාණන්ගේ ආයාචනාවට සංවේදී වීම කතෝලික වැඩිහිටි පරපුරේ වගකීමක් බව මෙහිදි අපිද අවධාරණය කරන්නෙමු.

'නූතන ලෝකය තුළ ශුද්ධ සභාව' නමැති දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ අපෝස්තලික අනුශාසනා පත්‍රයෙහි සඳහන් අයුරින්ම පවුලේ බෙදී යන ආදරය හා පවුලක කුළු ගැන්වෙන ගැඹුරු ආදරය තුළින් වෛරයේ හා මමත්වයේ ලෝකය වෙනස් කරන්නටත් විශේෂයෙන්ම වීර්යත්වය හා දැඩි සන්තෘෂ්ටිය තුළ මව, පියා, දූ දරුවන් හැටියට එකිනෙකාගේ ජීවිත ශුද්ධත්වයට පත්කරමින් ඒ ඒ ජීවිත ජීවත් කරවන්නට දායක වන අයුරු කතෝලික දෘෂ්ඨි කෝණයෙන්ම තේරුම් ගන්වන්නට මේ උදාවන නව වසර තුළදී වැඩිහිටි පරිනත කතෝලික සමාජයට පැවරෙන වගකීම තීව්‍ර වනු ඇත. එහිදි එකී අරමුණු සද්භාවයෙන් බලාත්මක කෙරුමටත්, විපුල ඵල දෙන ක්‍රියා මාර්ගයක් බවට පත් කර ගැනුමටත් වගකීම් පැවරෙන්නේ පැවිදි, පූජක හා සංවේදි ගිහි පාර්ශවයන්ටයි.

එහිදි පවුල් හා පැවිදි වසර තුළදි යෝජිත ක්‍රියාවලින් අතර මීසම් මට්ටමින් පැවැත්වෙන පවුල් දිනයන් වෙත විශේෂ අවධානයක් යොමුවිය යුතුයි. එහිදි 2014 දෙසැම්බර් මස 28 වැනි ඉරිදාට යෙදෙන ශුද්ධ වූ පවුලේ මංගල්‍යය දිනදී කොළඹ අගරදගුරු පදවිය විශේෂ දිනයක් ලෙස නම් කරමින් පැවිදි සොයුරියන්ගේ උපරිම දායකත්වය තුළ යෝජිත වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති බවද සැලයි. අගරදගුරු පදවි පැවිදිවරය පිළිබඳ කොමිසම මේ සම්බන්ධයෙන් ගන්නට යන නව පියවරයන් පිළිබඳව ජනතාව දැනුම්වත් කරන්නට නිසි කල නිසි පියවර ගන්නේ නම් උපරිම ඵල අත්විඳින්නට හැකිවේය යන්න අපගේද විශ්වාසයයි.

'එකට යදින පවුල් එකට සිටී' යන ආදර්ශ පාඨය ජීවත් කරවන වසරක් සේ මෙම වසර දල්වා ලන්නට මීසම් මට්ටමින් අප පවුල් පෙරට එන්නේ නම් ඒ දල්වන එක පහනකින් පහන් දහසක් ඉදිරියේදි ඒ ඒ දරුවන් දල්වාලන බව අපට පසක් නොවේද? සැබවින්ම පසක් වෙන බව නොකිවමනායි. ඒ පවුල් තුළින් පැවිදි ජීවිතයට දරුවන් තෝරා ගැනෙද්දි පැවිදි, පූජක ජීවිතයේ දුබල මිනිස් අඩුපාඩු අකාමකා දමන්නට යම් පිටිවහලක්ද උදාවනු නොඅනුමානයි.

මෙහිදි පවුල් උපදේශනය පිළිබඳව පිළිගත්, විශ්වාසනීය පිළිවෙතක්ද අනුගමනය කළ යුතු බව අප විශ්වාසයයි. ඒ උපදේශනය පිළිගත් ලිංගික අධ්‍යාපනයකට අප දූ දරුවන්ද යොමු කළ යුතු වෙයි. 'ශරීරයේ දේව ධර්මය' දරුවන් උකහා ගන්නේ නම් ලිංගිකත්වයේ උත්තරීතර හා ශුද්ධවත් බව අප දරුවන් අවබෝධ කර ගනු නියතයි. පවුල් වසර මෙයටද කදිම තෝතැන්නක් වනු ඇත. මෙහිදි ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය පරිනත ක්‍රියා මඟකට අවතීර්ණ වනු ඇතැයි කාගේත් විශ්වාසයයි.

නාසරතයේ ශුද්ධ වූ පවුල හැමවිටම අපව පුබුදුවාලමින් යහපත් වූ දෙවියන් වහන්සේගේ ආශිර්වාදයෙන් අපගේ සියලු කතෝලික පවුල් ශක්තිමත් කරමින් ප්‍රේමය ස්වකිය වෛවාහික කුටුම්බයන් අතර බෙදා ගන්නට දරන බලය ආසිරි ගැන්වීමට කැරෙන කාදිනල් හිමිපාණන්ගේ ප්‍රාර්ථනාවට අපිදු සංවේදි වන්නේ නම් 'කතෝලික පවුල රත්තරන්' යන්න ආදර්ශ පාඨයක්ද හැම තැන, හැමවිට කියැවෙනු ඇත.

# 2014 ලෝක ධර්මදූත ඉරුදින වෙනුවෙන්
# අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමා නිකුත් කළ පණිවුඩය

**සිංහල පරිවර්තනය : මොරිස් බොල්ලෑගල**

**මා හිතවත් සොහොයුර, සොහොයුරිය**

අද ජනතාවගෙන් විශාල සංඛ්‍යාවක් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නාඳුනති. මෙම හේතුව නිසා Ad Gentes හෙවත් ජාතින් සඳහා වූ ධර්මදූතික විශ්ව ප්‍රකාශනය ඉතාමත් අවශ්‍යවූවක් හැටියට තවදුරටත් ක්‍රියාත්මක වේ. ශුද්ධ වූ සභාව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ධර්මදූතික වන නිසා, සභාවේ සියලුම සාමාජිකයන් මෙම ක්‍රියාදාමයට සහභාගි වීම සඳහා කැඳවා තිබේය. ඇය බිහි වූයේ ඉදිරිය කරා පියනැගීම සඳහාය.

ලෝක ධර්මදූත දිනයේදි සියලුම මහද්වීප වලට අයත් සැදැහැති විශ්වාසක ජනතාව එම රට රාජ්‍ය තුළ බිහි වූ නව සභා වෙත දක්වනු ලබන සහයෝගයක් වශයෙන් එකමුතුව යාච්ඤා කිරීමට පෙළ ගැසෙන මෙම දවස අතිශයින් වාසනාවන්ත අවස්ථාවකි. එය වරප්‍රසාද වලින් සපිරි ප්‍රීතිමත් උත්සවයකි. එය වරප්‍රසාද ලබා ගැනීමේ මහඟු වකවානුවකි. එසේ වනුයේ දෙවි පියාණන් විසින් එවනු ලැබූ ශුද්ධාත්මයාණන් විසින් එතුමන්ගේ ක්‍රියාවලියට අවනතව කීකරු වන සැම දෙනා වෙත ප්‍රඥාව හා ශක්තිය නොමඳව ලබා දෙන නිසාය. තවදුරටත් එය ප්‍රීති ප්‍රමෝදයේ උදාවක් හැටියට සැලකිය හැක්කේ මෙම ලෝකය තුළ දහම් ආලෝකය පතුරුවාලීම සඳහා දෙවි පියාණන් විසින් එවනු ලැබූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප ධර්මදාන පරිශ්‍රම සියල්ල හසුරුවමින් අප සමග ජීවමානව වැඩවසන බැවින්ය. ජේසු සමිඳුන් සහ ධර්මදූතික ශ්‍රාවකයන් තුළින් මතුවන මේ උද්දාමය හේතුකොට ගෙන ශුද්ධ වූ ලූක් සුවිශේෂයෙහි සඳහන් (10:21-23) බයිබලීය ඡේදය වෙත ඔබ හැමගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

● සුවිශේෂකවරුන් අපට කියාපාන්නේ අප ස්වාමින් වහන්සේ දෙදෙනා බැගින් හැත්තෑ දෙදෙනෙකු නගර හා ගම්මාන වලට යවමින් පවසා සිටියේ දේව රාජ්‍යය දැනටමත් ළඟා වී ඇති බව සහ තමන්වහන්සේගෙද පැමිණීම සඳහා ජනතාව සූදානම් කර තැබීමට කියායි ඒ අනුව දහම දේශනා කිරීමේ කර්තව්‍ය අවසාන කොට එම ශ්‍රාවකයන් පෙරළා පැමිණියේ නිම්හිම් නැති සතුටකිනි. කිසිදාක අමතක කළ නොහැකි මෙම ධර්මදානිය අත්දැකීම් වල මුඛ්‍ය හරය, තේමාව වූයේද ප්‍රීති ප්‍රමෝද යයි. ඒ අතර දිව්‍යමය ඇදුරාණෝ ඔවුන්ට මෙසේද පැවසූ සේක.

"එසේ වුවද දුෂ්ටාත්මයාණන් ඔබට යටත් වන නිසා සන්තෝෂ නොවන්න. ඔබගේ නාම ස්වර්ගයේ ලියා ඇති නිසා සන්තෝෂ වන්න. ඒ පැයේදි උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවී උදම් අනමින් පියාණන් වහන්සේට තුති ප්‍රශංසා කළ සේක. පසුව උන්වහන්සේ ශ්‍රාවකයන් සමග තනිවම සිටියදී ඔවුන්ට කථා කොට ඔබ නරඹන දේ දකින ඇස් භාග්‍යවන්තයැයි වදාළ සේක (ලූක් 10:20-21, 23).

මෙහිදි ලූක් තුමා භූමිකා ත්‍රිත්වයක් අප වෙත ඉදිරිපත් කරයි. පළමුව ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් ඇමතීමයි. ඊළඟට උන්වහන්සේ පියාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමයි. තෙවැන්න නැවතත් ශ්‍රාවකයන් කැඳවා කතා කිරිමයි. මෙහිදි ජේසුස් වහන්සේට අවශ්‍ය වූයේ තම ගෝලයින් මින් ඉහත කිසිදාක අත් නොදුටු මහත් දේ ඔවුන්ට දැනුනු නිසා එතුමාණන් අත් විඳින එම ප්‍රීතිය සතුට ඔවුන්ටද විඳ දරා ගැනීමට සැලැස්වීමයි.

● ජනතාව තුළින් දුෂ්ටාත්මයාණන් පළවා හැරීමේ බලය තමන්ටද ලැබුන බැවින් ශ්‍රාවකයෝ සතුටට පත් වී සිටියහ. එහෙත් ජේසුස් වහන්සේ ඔවුන්ට අනතුරු අඟවමින් පවසා සිටියේ තමන්ට ලැබුණු බලය ගැන උදම් නොඅනා තමන් ලද දයාව ප්‍රේමය ගැන තුටුපහටු වන ලෙසයි. මක්නිසාදයත් ඔබේ නාම ස්වර්ගයෙහි ලියැවී ඇති බැවින්ය. (ලූක් 10:20)

සර්ව දයාබර දෙවියන් වහන්සේගේ ආදරය ගැන ඔවුන්ට අත්දැකීමක් ලබා ගැනීමට උන්වහන්සේ සැලැස්වූවාක් මෙන්ම එම ආදරය කරුණාව අන් අය සමග බෙදා ගැනීමේ හැකියාවද එතුමාණෝ තහවුරු කළ සේක. මෙම අත්දැකීම් සම්භාරය ජේසුස් වහන්සේගේ ළයාන්විත හෘදය සනසාලන සතුටක් වන්නා සේම කෘතෝපහාරයක් ද වෙයි. සුවිශේෂක ලූක් තුමා මෙම ආනන්දජනක ප්‍රීති ප්‍රමෝදය ත්‍රිවිධාකාර එකමුතුවක් තුළින් හුවා දක්වයි. "ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී උදන් ඇනූ සේක." පියාණන් වහන්සේ වෙතට හැරී එතුමාණන්ට තුති ප්‍රශංසා කළ සේක. මාගේ පියාණන් වහන්සේ සියල්ල මට පවරා දී තිබේ. පුත්‍රයාණන් කවරෙක් දැයි පියාණන් වහන්සේ හැර අන් කිසිවෙකු නොදනියි (ලූක් 10:21-22). මෙම ස්තොත්‍ර යාච්ඤාව තුළින් දෙවි මහෝත්තමයාණෝ සැඟවී තිබුන දේ අනාවරණය කළ බව කියැවේ. උන්වහන්සේ සැඟව තිබූ දෙය හා එළිදරව් කළ එම කරුණ කුමක්ද? උන්වහන්සේගේ දිව්‍ය රාජ්‍යය පිළිබඳව ඇති අභිරහස්ය.

ජේසුස් වහන්සේ තුළ පවත්නා දිව්‍යමය ස්වාමිත්වය හා සාතන් පරාජය කිරීමේ ජයග්‍රාහික මහිමයද වේ.

තමන් ගැන පමණක් මහා ඉහලින් උදන් අනමින් හැම දෙයක්ම තමන් පමණක් දන්නවා යැයි සිතන අය වෙතින් දෙවියන් වහන්සේ බොහෝ දේවල් සඟවා තබන සේක. දෙවියන් වහන්සේට කිසිදු ඉඩක් අවසරයක් නොදෙන මොවුහු සියලු දේ දනී යන අන්ධභාවයෙන් මුළා වී සිටිත්. මෙහිදි ජේසුස් වහන්සේ තම සමකාලීනයන් සමහර දෙනෙකුට දුන් තර්ජනාත්මක අවවාද අපට සිහිවෙයි. තවත් අනතුරක් වනුයේ අපේ අවධානය යොමු විය යුතු කුඩා උන් පිරිසක් වෙත අප තුළ පවතිනා ඇල්මැරුනු ස්වභාවයයි. ජේසුස් වහන්සේ විසින් "භාග්‍යවන්තයෝ යැ"යි වදාළ එවැන්නෝ බැහැපත්, නිහතමානි, අසරණ, කොන්කරන ලද, හඬක් නැගීමට තරම් දුර්වල, කම්කටොලු වලින් පිරී අය වන්නාහ. මෙහිදි එකවරම අපේ මතකයට නැගී එන්නේ මරියාය. ජෝශප්ය. ගලීලයේ මස් මරන්නන් සහ ජේසුස් වහන්සේ විසින් දේශනා කරමින් යද්දි අතර මඟ හමු වූ ගෝලබාලයන්ය.

● "පියාණනි, ඔබට ප්‍රියමනාප වූයේත්. එයමය" (ලූක් 10:21). ජේසුස් වහන්සේ විසින් වදාළ ඉත කී වචන එතුමාණන්ගේ චිත්තාභ්‍යන්තරයෙන්ම පැන නැගුණු හැඟීම් බව අප වටහා ගත යුතුය. "ප්‍රියමනාප" යන වචනයෙන් ගම්‍ය වනුයේ දෙවියන් වහන්සේ මිනිස් සංහතිය කෙරෙහි අරමුණු කරගත් ගැළවීමදායක සැලසුම වේ.

පියාණන් වහන්සේ තම පුත්‍රයාණන් වෙත දැක්වූ මෙම ආදරය හා ප්‍රියමනාප භාවය උන්වහන්සේ සමස්ත ලෝක ජනතාව වෙතද පෑම නිසා ජේසුස් වහන්සේ අප්‍රමාණ සතුටට පත් වී සිටි සේක. මරියෝත්තමාවගේ උදාන ගීය තුළින්ද, මෙවැනිම ප්‍රියමනාප භාවයක් ව්‍යංගයෙන් ප්‍රකාශ වන බව සුවිශේෂක ලූක් තුමා සඳහන් කරයි. "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදම් අනයි" (ලූක් 1:47).

8-9 පිටුවලට »



මීසමෙන් මීසමට

# වැරදි දෙස බලා නිහඬව නොසිටිය යුතුය



සමාජයේ යමෙක් වැරදි ක්‍රියාවක යෙදෙන්නේ නම් පළමුව පුද්ගලිව හමුවී එහි ආදීනව පැවසිය යුතුයි. එයින් ප්‍රතිචාරයක් නැති නම් දෙතුන් දෙනෙකු කැටුව ගොස් වරද අවබෝධ කර දිය යුතුය. මෙයිනුත් ප්‍රතිපලයක් නැතිනම් සභාවේ අවධානය යොමු කළ යුතුය. අපරාධයන් දෙස බලා නිහඬව සිටීම අපරාධ වර්ධනයට හේතුවක් වන බව රත්නපුර පදවියේ කුරුවිට පැරඩයිස් සාන්ත ආනා මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය පවත්වමින් රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ පැවසූහ.

රත්නපුර මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් පියතුමාගේ ද සහභාගිත්වයෙන් මංගල දේව මෙහෙය පැවැත්විණ.

**තියබෝල්ඩ් සමරතුංග**

## වැලිවිට විසෙන්ති පාවුලා මංගල්ලය

වැලිවිට සාන්ත මරියා දෙව්මැඳුරේ විසෙන්තිද පාවුලා සමිතිය විසෙන්තිද පාවුලා මුනි මංගල්‍යය නිමිත්තෙන් මීසම්සෙවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙයක් පැවැත්විය.

**සුසිල් හැරිසන්**



ශ්‍රී ලංකා කෝල්පිඟ් සමාජයේ (වමේ සිට) හැටන් ප්‍රාදේශිය නියෝජිත එස්. ජේකොප් ජාතික සභාපති එඩ්වඩ් කුමාරගම (දකුණු කෙළවර) පරිපාලන ලේකම් ලූක් ජෝශප් මඩකලපු ප්‍රාදේශිය කොල්පිඟ් සමාජයේ නායකයින් පසුගියදා හමුවූ අවස්ථාව.

**ඩෝසන් පෝල්**

## නාගොඩට මරිය හමුද ප්‍රසිඩියම් දෙකක්

නාගොඩ සා. ජෝන් ද බැප්ටිස්ට් මහා විදුහලේදි පාසල් දැරියන් 25 දෙනකුගෙන් සමන්විත මරිය හමුදා ප්‍රසීඩියමක් ආරම්භ කරන ලදි.

නාගොඩ මීසම් සේවක ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සාමාජිකාවන් 18 දෙනකුගෙන් යුතු ජ්‍යෙෂ්ඨ කාන්තා ප්‍රසීඩියමක්ද පිහිටුවා ගන්නා ලදී. වසර ගණනාවක් අක්‍රියව පැවති ජ්‍යෙෂ්ඨ කාන්තා ප්‍රසීඩියම ජයග්‍රහණයේ අප ස්වාමිදුවගේ ප්‍රසීඩියම වෙනුවෙන් නම්කරනු ලැබීය. මෙම කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ප්‍රදීඩියම් ආරම්භ කිරීමට පුරෝගාමී වූයේ දැනට නාගොඩ ඉංග්‍රිසි මරිය හමුදා ප්‍රසීඩියමෙ සේවය කරන ග්ලැඩිස් වැලිවිට ගුරු මහත්මියයි. කඳාන ක්‍යුරියා නිලධාරීහු ඒ සඳහා සහය ලබා දුන්නා. ජ්‍යෙෂ්ඨ කාන්තා ප්‍රසීඩියමේ නිලධාරින් මෙසේය. සභාපතිනි කාන්ති පෙරේරා, උප සභාපතිනි හිරෝමලි සින්තියා, ලේඛිකා මොනිකා අල්මේදා භාණ්ඩාගාරිකා අයිරා වීරරත්න.

**ඩල්සි මෙන්ඩිස්**

## භා. ජුසේ වාස් පියා ශුද්ධවරයට ඔසවනු ලැබීමේ පුවත අසා ජනතාව සතුටින් ඉපිලයති

සලාපුර රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් විසින් එවන ලද භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට ඔසවනු ලැබීම පිළිබඳ නිල නිවේදනය ගරු ලෝරන්ස් ආනන්ද පියතුමන් විසින් උල්හිටියාව මීසමේ උල්හිටියාව හා කඩවත යන දේවස්ථානවලදී ඉරුදින දිව්‍ය පූජාව අවසානයේදී ප්‍රාකශයට පත්කර ලදි.

ඉන් අනතුරුව එම දෙව්මැඳුරුවල ජනතාව රබන් වාදනය කරමින් රතිඤ්ඤා පත්තුකරමින්, දෙව්මැඳුරේ සීනු නාද කරමින් තම ප්‍රිතිය ප්‍රකාශ කළහ. මීසම් සේවක ගරු බෙනට් ශාන්ත සහ සහයක ඇන්ටන් නිරෝෂන් පියතුමන් ජන වන්දනා කමිටුව හා එක්වී මෙදින ජනවන්දනා පිළිවෙත ඉතා අර්ථාන්විතව සංවිධානය කර තිබුණි.

**ගොඩ්ෆ්‍රි ගාල්ලගේ**



මාරවිල කුරුස පල්ලියේ වාර්ෂික මංගල්‍යයට පසු දේවස්ථානය අසල මහ බත් දානයක් පවත්වනු ලැබීය. මාරවිල සහයක ගරු කීර්ති ප්‍රනාන්දු සහ ගරු රිචඩ් පීරිස් යන පියතුමන් විසින් ආශිර්වාද කරන ලද මේ බත් දානය බෙදීමට රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන ඇමැති දයාශ්‍රිත තිසේරා මහතාද එක්විය. මාරවිල සුමිත් තුෂාර පෙරේරා මහතා ඇතුළු කුරුස පල්ලිය අසල තරුණ කැල මේ සඳහා දායකත්වය දැක්වූහ.

**කටුනේරිය රෙක්ස් හැරිසන්**

## දළුගම 150 ජයන්ති සූදානමට පැවැත්වූ දින 25 ක ධර්ම විවේකය නිමාවේ



ධර්ම විවේකය තුළ කිතුනු අනුගාමිකයන් වශයෙන් අනාවරණය වූ කිතුනු ප්‍රතිපත්ති මත පිහිටා ජීවිතය ගෙන යමින් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයට සාක්ෂි දැරිය හැකි බව දලුගම සාන්ත ෆ්‍රැන්සිස් දෙව්මැඳුරේ 150 වන ජයන්ති මංගලෝත්සවය නිමිතිකොටගෙන දින 25 ක් පුරා පැවති ධර්ම විවේකය නිමා කරමින් දලුගම මීසමේ පසුගිදා පැවති දිව්‍ය පූජා යාගයේදි වෙන්නප්පුව නාසරෙත්හි නිර්මල මරිය නිකායික ගරු සරත් පෙරේරා පියතුමා ප්‍රකාශ කළේය.

ධර්ම විවේකය සමාප්ත කරමින් ශ්‍රී කුරුසිය සහ ශුද්ධ බයිබලය ගරු උදාර පියතුමන් විසින් මීසම් සේවක ගරු ජූඩ් කාමන් ප්‍රනාන්දු පියතුමන් වෙත ලබාදීමෙන් අනතුරුව රැස්ව සිටි ජනතාව ශ්‍රී කුරුසියෙන් ආශිර්වාද කිරීම මීසම් සේවක ගරු ජූඩ් ශ්‍යාමන් ප්‍රනාන්දු පියතුමන් විසින් කරන ලදි. දිව්‍ය යාගය අවසානයේ ජයන්ති මංගලෝත්සවය වෙනුවෙන් සංවිධානය කෙරුණු මහා ධර්ම විවේකයේ සමරු එළකය ගරු ගාමිණී සිල්වා නි.ම.නි පියතුමන් විසින් නිරාවරණය කරනු ලැබිණි.

සටහන - **ජී. ඩී. සංජුල ජනිත්**

සේයා - **ඉසුරු ඩි අල්විස්**



වන්නි මඩු මාතා මංගල්‍යය කටුලන්ද දෙව් මැඳුරේදී පැවැත්විය. මඩම්පැල්ල මීසම් සේවක ගරු ලක්නාත් කුරේ පියතුමන්ගේ ආරාධනයෙන' පැමිණි ගරු ජොෂප් වසන්ත පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් ගරු වජිර සහෝදර තුමාගේ සහය ඇතිව මංගල්‍යය පවත්වන ලදි. දේව මෙහෙයෙන් පසු ගරු ගක්නාත් කුරේ පියතුමා බැතිමතුන් ආසිරි ගැන්වූ අයුරු.

**එච්. ඒ. කල්දේරා**

## "ඕ පොසිටිව්" වකුගඩුවක් පිරිනමා ජීවිතයක් බේරා ගනිමු

වත්තල පදිංචි ජේ. ජයවර්ධන (52) මයා දරුණු වකුගඩු රෝග යකින් පෙලෙන බැවින් වකුගඩුවක් බද්ධ කළ යුතු බව ජාතික රෝහල් විශේෂඥ වෛද්‍ය ඒ. එල්. එම්. නසාර් මහතා නිර්දේශ කර ඇත. 'ඕ පොසිටිව්' වකුගඩුවක් පරිත්‍යාග කිරීමට සතුටු අය වෙතොත් 0775555200 අංකයට අමතන්න. මූල්‍ය ආධාර වත්තල කොමර්ෂල් බැංකුවේ අංක 8264001689 එන්. ජයවර්ධන ගිණුමට බැරකරන ලෙස බිරිඳ ඉල්ලා සිටි.

## මැල්කොළණිය මංගල්ලයදා නියඟය නිමාකරමින් ආසිරි මල්වැසි වැටේ

සේතාපොළ මීසමට අයත් මැල්කොළණිය ශු. ජපමාල දේවමාතා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා මාරවිල ශාන්ත පාවුළු දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු සුමේධ කෝලිත පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මැල්කොලණිය කාන්තා සමිතියේ කීප දෙනෙකුගේ අදහසක් අනුව මෙයට වසර විස්සකට පමණ පෙර ඉදිකරන ලද මඩු මාතා දෙව්මැඳුරේ මෙවර මංගල්‍යය කටයුතු මීසම් සේවක ගරු සම්පත් ප්‍රසංග සහයක ගරු ප්‍රසාන් ගෝමස් පියතමන්ගේ මූලිකත්වයෙන් මැනවින් සංවිධානය කර තිබිණි.

මෙදින වසර දෙක්ක පුරා දැඩි නියඟයෙන් පීඩා විඳි ජනතාව වැසි සමය ආරම්භ වු බව පසක් කරමින් ආසිරි මල් වර්ෂාවක් මංගල මොහොතේ දී පතිත වීම විශේෂ සිදුවීමක් විය. ශු. ජපමාල මාතා ප්‍රතිමාව රැගෙන වීදි සංචාර කිරීමෙන් අනතුරුව ප්‍රතිමාවෙන් ආසිරි ගන්වනු ලැබීය. සල්පිලක්ද පවත්වනු ලැබීය.

**ඇන්ටනි මෙරිල්**

## කොස්හේන ජපමාල මාතා දේවස්ථානය

පවුල් 40 කින් යුත් කොස්හේන ශු. ජපමාල මාතා දේවස්ථානයේ ආරම්භය දිව යන්නේ 2000 වසරේ සාමය උදෙසා උතුර දකුණ යා කරමින් ලංකාව පුරා ශු. මඩු මාතා ප්‍රතිමාව වැඩම කරද්දී කුලියාපිටිය දේවස්ථානයට වැඩම කිරීම සනිටුහන් කරමින් එතුමියට කැප කරන ලද දේවස්ථානය ලෙස මෙම කොස්හේන ශු. ජපමාල මාතා දේවස්ථානය කැපකිරීමයි.

එවක් පටන් මෙම දේවස්ථාන සංඝයේ කිතුනු ජනතාව ශු. ජපමාල මාතාවන්ට ඉතා අලංකාර දෙව්මැඳුරක් ගොඩ නැගීමට ඇප කැප විය. දැනට ඉදිකරමින් පවතින දෙව්මැඳුරට කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් අතින් 2009 වසරේදී මුල්ගල තබන ලදී. ඉන් පසුව එම දෙව්මැඳුරේ අත්තිවාරම පමණක් සාදා නිමකර කාලයක් තිබියදී මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් පියතුමාගේ පැමිණීමත් සමග එතුමන්ගේ දිරිගැන්වීම හා මඟපෙන්වීම මත එහි ඉදිරි පියවර ගොඩනැගීම සඳහා දේවස්ථාන ජනතාව උනන්දු වී ඉදිකිරීම් කටයුතු මේ දක්වා සිදුකරමින් සිටි.

එහි ඉදිරි වැඩකටයුතු කර ගැනීම සඳහා දේවස්ථාන ජනතාව සංගීත ප්‍රසංගයක් පැවත්වූහ. එම සැදැහැවත් ජනතාව ජපමාල මාතාවගේ බලවත් මැදිහත් පිහිට විවිධ සිද්ධීන් තුළ දුටු අතර, ඒ තුළින් ඔවුන්ගේ විශ්වාසය ශක්තිමත් විය. ඔවුන් මෙම කාර්යය සඵලමත් කර දෙන මෙන් ශු. ජපමාල මාතාවන්ගෙන් ඉල්ලාවූ බාරය ඉතා අනගිභවනීය එකකි.




ජපමාල මාසය වන ඔක්තෝබර් මාසය පුරාවට සැම දවසක දේවස්ථාන සංඝය දේවස්ථාන භූමියට එකතු වී ජපමාලය උච්චාරණය කිරීමටත් ඔක්තෝබර් 31 වන දින පහළොස් පන්තිය උච්චාරණය කිරීමෙන් පසුව දිව්‍ය පූජාවක් ද මුළු මීසම් ජනතාව සමග එක්වී කොස්හේන ශු. ජපමාල මාතාවන්ගේ දෙව්මැඳුරේදී උත්සවශ්‍රීයෙන් පැවැත්වීමටද කටයුතු කර ඇත. සියලු වැඩ කටයුතු සාර්ථක කර ගැනීමෙහි ලා මීසම් සේවක ගරු සිඩ්නි රොෂාන් සහයක ගරු ගෝමි දිවාකර පියතුමන්ගේ පූර්න ආශිර්වාදය ඇතිව මේ කටයුතු සංවිධානය කර ඇත. ඔක්තෝබර් 31 දින පැමිණෙන සියලු දෙනාට රාත්‍රි ආහාරය සැපයීමට බලාපොරොත්තුවේ.

**රීටා සේනානායක, ප්‍රසාද් රත්නායක**

## පවුල් දැනුවත් කිරීමේ විශේෂ වැඩ සටහනක්

කඳාන සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ පවුල් අපෝස්තලික සේවා සමිතිය මගින් කිතුනු පවුල් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් කඳාන සිද්ධස්ථානයේදී පැවැත්විය. මෙම දැනුවත් කිරීමේ වැඩ සටහනට මීසමේ කිතුනු පවුල් යුවළ 33 ක් සහභාගි වූහ.

අගරදගුරු පදවි පවුල් සේවා අදියුරු ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමා සමග දේශක යුවලක් එය මෙහෙය වූහ. කඳාන සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමා පූර්ණ සහය ලබාදුන් අතර සමිතියේ සමාජික සමාජිකාවන් වැඩසටහන සංවිධානය කරන ලදි.

**ඇල්. ඩී. පැට්‍රික්**

## ඉලිප්පදෙණිය මංගල උලෙළ

කංජුක්කුලිය මීසමට අයත් ඉලිප්පදෙනිය වික්ෂෝප දේවමාතාවන්ට කැපකර ඇති දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය ඉකුත්දා පැවැත්විණි.

රත්නපුර පදවියේ ගරු සර්ජියස් ප්‍රනාන්දු පියතුමාගේ මූලිකත්වයෙන් මීසම් සේවක ගරු ජූඩ් ඩයස් හා සහයක ගරු දිනේෂ් දුමින්ද පියතුමන්ගේ සහභාගිත්වයෙන් මංගල දිව්‍ය යාගය පැවැත්වූ අතර නුවාන කාලයේ ගරු ජස්ටින් වර්ණකුල පියතුමා හරබර දේශන හා දිව්‍ය යාගයෙන් ජනතාව පුබුදු කරවිය.

**අනුර ශාන්ත පීරිස්**

මරිය වසර නිමිත්තෙන් නැසරැත් පහනින්...

## නමෝ නමෝ මරියේ



සැබෑ ප්‍රේමයේ දෙව් කුමරිය ඔබවේ
සගපුරේ කිරුළ පැළඳි දෙව් රැජිණියේ
මනු ලොවේ අපේ මරිය අම්මා වේ
නමෝ නමෝ මරියේ ඔබට ජය ජය වේ

අදමිටු ලොව තුළ පවිටු චේතනා
අප සිත් අඳුරට හෙළනා මොහොතේ
ඉන් මිදෙනට වරදෙනු අම්මේ
පමා නොවී අප රැකගනු මැන මරියේ

නපුරා අභියස අවියක් වනු මැන
ජපමාලය අප වටකර මරි මව්නේ
දෙව්පුතු නැළවූ දෑතින් අප ඔසවා
ඔබ තුරුලට වඩවා ගනු මැන අම්මේ

සුරලොව සිට ඔබ නිරන්තරෙන්
අප වෙත බලනු මැන මරි මව්නේ
එක මොහොතක්වත් අප අත්නාරිනු මැන
ඔබ දෙනයන තුළ අප සඟවා ගනු මැනේ

**කැලිස්ටා පෙරේරා - ඇටියාවල**

## මරි මව් රැජිනිය



ජම්ම පාපයෙන් නිදොස් වූ කුමරිය
දෙව් පිය අණ පිළිගත් දූ කුමරිය
ජුසේ තුමන් හා සරණ වූ කුමරිය
ජේසුගෙ මව වූ මරි මව් කුමරිය

කානා නුවරදී යුවළට සරණය
වූවා සේ ලෝ දන හට සරණය
අප සැම හට ජපමාලය සරණය
දෙව් මව් අයදින සැම හට සරණය

ලොවටම සාමය ගෙන දුන් රැජිණිය
වසරෙම ගයනෙමු ඔබෙ ගුණ රැජිණිය
නිති සරණය අප හට දෙන රැජිණිය
සුරලොව දිනූ අප මරි මව් රැජිණිය

**ශ්‍රියානි මානෙල් පෙරේරා - ගිරිඋල්ල**



## කානාවේ මව් මරියනී

නමෝ කන්නි මව් මරියනි
විපුල වරප්‍රසාද ලත් උත්තමාවියනි
සත් කඩු පහරින් හද ඉරාගෙන
යකුගෙ තෙද පය පාමුලේ දරාගෙන

ලෝ සත වෙත කරුණා දයා කොට
ඉවසීම බැහැපත්කම මුදුන් පමුණුවා
සැමට ප්‍රේමය බෙදා දෙන්නට
නිමක් නැත ඔබේ ප්‍රේමය මහිලාවියේ

පළමු සත්ප්‍රසාද නිවහන වූ
ආශිර්වාද ලත් ඔබේ ගර්භය
පාපි සැමට ගැලවීම ලැබ දෙන්න
කැප කළාවූ මව් මරියනී

**බර්නි (ජී. වයි. බර්නදෙත්) - එඬේරමුල්ල**

## දයාබර මෑණී



සෙනෙහෙබර මව් වෙනි
දයා පිරිපුන් සයුරෙනි
කරුණා නිධානෙනි
අපට කරුණා කළ මැන මෑණී

දයා ඇති මවුවරු
තම දරුවන් සුරකින යුරු
අති දයාබර මෑණී
ඔබ සුරතෙ අප
රඳවා ගත මැන මෑණී

මෑණියනි ඔබ දයා
සයුරෙ අප ගිල්වා
කරුණා ජලයෙන් නාවා
අප හද පිරිසිදු කරවා
ඔබ සුරතින් අප ගෙන සුර මඟ පෙන්වා දුන මැන

**ඩී. ජේ. ප්‍රනාන්දු - දියලගොඩ**

# සුරලොවට නැගීමට සුදුසු ඉණිමඟ වන ශුද්ධවූ ජපමාලය



**කතෝලිකයන්ගෙන් බහුතරයක් මරුද මඩු සිද්ධස්ථානයට එක් වරක් හෝ ගොස් ඇතැයි පූර්වාමානිකව සිතිය හැකිය. මඩු සිද්ධස්ථානයේ දී යැදෙන, පිදෙන, ගැයෙන විවිධ වූ යාච්ඤාරාධනා අතරෙන් මරුද මඩු දේව මාතාවන්ගේ පිහිට ප්‍රාර්ථනා කරමින් කියැවෙන ජපමාල ප්‍රාර්ථනාව ඉතාමත් සුමධුරය, මධුර මනෝහරය. එම ජපමාල ප්‍රාර්ථනාවේ "අප මෝක්ෂයට ඇදගනු පිණිස ජපමාලය නමැති ශුද්ධවූ දාමය සුරලොවින් නරලොවට එවා වදාළා වූ ශු. ජපමාල මාතාවෙනි" යනුවෙන් සඳහන් වී තිබේ.**

සැබැවින්ම අප ස්වර්ගය හා සම්බන්ධ කරනු පිණිස දේවමාතාවන් විසින් පව්කාර වූ අපට ලබා දුන්නා වූ ස්වර්ගීය ඉනිමඟ වන්නේ "ජපමාලය" බව පිරිසිදු කන්‍යා මරියතුමිය විසින්ම එතුමියගේ ශුද්ධවූ දර්ශනවීම් තුළින් සනාථ කර ඇත. ජපමාලය අන් අයට ද, හඳුන්වාදෙමින්, නිරතුරුව ජපමාලය උච්චාරණය කරන ලෙසට ඕතුමිය අපගෙන් ඉල්ලා සිටින්නේ එම නිසා ය.

ලූර්දු, පාතිමා, පොන්ට්මේන්, ගුවාඩාලුපේ, ගරබන්ඩාල් යනාදි විවිධ වූ ස්ථානවල විවිධ වූ ආකාරයෙන් දර්ශනය වෙමින් මරියතුමිය ඉල්ලා සිටියේ පව්කාරයන් මුදා ගැනීම සඳහා ද, ලෝක සාමය උදෙසා ද, ශුද්ධවූ සභාවේ චිර පැවැත්ම උදෙසා ද දිනපතා ශුද්ධවූ ජපමාලය උච්චාරණය කරන ලෙසටය. භක්තිවන්ත ලෙස ජපමාලය උච්චාරණය කරමින් එහි අභිරහස් ගැන භාවනා කිරීම යහපත් බව ප්‍රකාශ කරනු පිණිස මරියතුමිය ශු. ජපමාලයක් අතින් ගෙන මසබියෙල් පර්වතයෙහි දර්ශනය වූවාය. එතුමිය මෙලොවට දර්ශනය වූ ඇතැම් අවස්ථාවලදී ජපමාලය එතුමිය අතෙහි තබාගෙන, එම දර්ශනය දුටු අය සමඟ එතුමිය ද ජපමාලය උච්චාරණය කර ඇති බවට සභා ඉතිහාසය සාක්ෂි දරයි. එබැවින් ජපමාලය ක්‍රිස්තුස් වහන්සේ කේන්ද්‍ර කර ගනිමින් මරියතුමියගේ මධ්‍යස්ථභාවය තුළ අප උන්වහන්සේ හා සම්බන්ධිකරණය කරන ස්වර්ගීය ඉනිමඟකි.

ක්‍රි.ව. 431 දී පවත්වන ලද "එපීස" මන්ත්‍රණ සභාව විසින් මරිය තුමිය "දේව මාතාවන්" ලෙසට සමස්ත කතෝලික සභාවට ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ශු. සභා මාතාව කන්‍යා මරියතුමියට "දේව මාතාවන්" ලෙසට සුවිශේෂී වූ ගෞරවයක් සහ භක්තියක් දක්වනු ලැබූ අතර ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමේ සිට උන්වහන්සේගේ කුරුසියේ යාගය දක්වා ද, මේ ලෝකයේ මතු පැවැත්මේ වර්තමානය සහ අනාගතය දක්වා ද එතුමිය සුරලොව සහ මෙලොව අතර අප සම්බන්ධ කරන උතුම් වූ මධ්‍යස්ථකාරිය ලෙසට පිළිගනු ලැබ සිටින්නීය. එබැවින් එතුමිය විසින් මෙලොව පව්කාර වූ අප වෙත තිළින කරන ලද ශු. ජපමාලය සුරලොවට නැගීමට සුදුසු වූ ඉනිමඟ ලෙසට හැඳින්වීම නිවැරදිය.

ශුද්ධවූ ජපමාලය උච්චාරණයට ඉතාමත් පැරණිතම ඉතිහාසයක් ඇත. ශු. ජපමාලයේ අඩංගු වී තිබෙන සියලුම යාච්ඤා දෙව් පියාණන් වහන්සේ ද, දෙව් පුත්‍රයාණන් වහන්සේ ද, ශුද්ධාත්මයාණන් වහන්සේ ද විසින් සම්පාදනය කර තිබේ. ඒ බවට පහත දක්වන කරුනු සාක්ෂි දරයි. ශු. ජපමාලය ආරම්භයේ දී උච්චාරණය කරනු ලබන "විශ්වාස ලක්ෂණය " යාච්ඤාව ශුද්ධාත්මයාණන් විසින් මෙහෙයවනු ලදුව කතෝලික අප විසින් විශ්වාස කළ යුතු කරුණු 12 ක් අඩංගුව ඇති අපෝස්තුළුවරුන්ගේ කාලයේ පටන් පැවත එන යාච්ඤාවකි.

එලෙසම ජපමාල පන්ති අතර උච්චාරණය කරනු ලබන "පිතා පුත්‍රයා" යාච්ඤාව ශුද්ධවූ ත්‍රිත්වයට පිදෙන තුති පිදීමේ යාච්ඤාවය. "අති උස් තැන්හි දෙවිඳුනට පිදෙන මහිමය" (ශු. ලූක් 2:14) ශු. ත්‍රිත්ව යාච්ඤාවෙන් කියැවෙයි.

"ස්වර්ගයෙහි වැඩ සිටින" යාච්ඤාව

කලමුල්ල
ඊ. පී. රේමන් සිල්වා විසිනි

අපගේ ස්වාමිදරුවාණන් වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් උන්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයෙහිදී අපට උගන්වා වදාළ යාච්ඤාවය.

"නමෝ මරිය" යාච්ඤාවේ මුල් කොටස සමන්විත වන්නේ දෙව් පියාණන් වහන්සේ විසින් ගාබ්‍රියෙල් දේවදූතයා තුළින් මරිය තුමියට පවසන ලද වචන එනම් "විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගලම් වේ. සමිඳාණන් ඔබ සමඟය." (ශු. ලූක් 1:28) සහ මරිය තුමිය ශු. එළිසබෙත් තුමිය බැහැදැකීමට ගිය අවස්ථාවේදී ශු. එළිසබෙත් තුමිය ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව මහ හඬින් උදම් අනමින් "ඔබ වනිතාවන් අතරින් අතිශයින් ආශිර්වාද ලද්දීය. ඔබ කුස ඔත් දරු ඵලය ද ආශිර්වාද ලද්දේය." (ශු. ලූක් 1:41-42) යන වචන වලිනි.

නමෝ මරිය යාච්ඤාවේ දෙවන කොටස සමන්විත වී ඇත්තේ ක්‍රි.ව. 431 දී පැවැත්වූ "එපීස" මන්ත්‍රණ සභාව විසින් මරිය තුමිය "දේව මාතාවන්" බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ශුද්ධාත්මයාණන් විසින් මෙහෙයවනු ලැබූ ශුද්ධවූ සභාව විසින් "සාන්ත මරියනි, දේව මෑණියනි. පාපි වූ අප උදෙසා දැනුත් අපගේ මරණ වේලේදීත් යාච්ඤා කළ මැනව" යන වචන වලිනි. ඒ අනුව "නමෝ මරිය" යාච්ඤාව ශු. කන්‍යා මරියතුමියගේ දේව වරප්‍රසාද ජීවිතය සිහිපත් කරමින් සහ එතුමියගේ මැදිහත්කම ප්‍රාර්ථනා කරමින් උච්චාරණය කරන යැදුමකි.

එබැවින් ශුද්ධවූ ජපමාලයේ අඩංගුව පවතින "පිතා පුත්‍රයා", "විශ්වාස ලක්ෂණය", "ස්වර්ගයේ වැඩ සිටින" සහ "නමෝ මරිය" යනාදි යාච්ඤා දේව සැලැස්ම තුළ මුල් කිතුනු සභාවේ සිට අද දක්වාම උච්චාරණය කරනු ලබන යාච්ඤාවන් ය.

කතෝලික සභාවේ ඉගැන්වීම්වලට එරෙහිව ඇල්බිජෙන්සියන්වරුන් විසින් මිථ්‍යාදෘෂ්ඨික ඉගැන්වීම් පතුරුවා හරිමින් කිතුනුවන් නොමඟ යැවීමට ක්‍රියා කළ එක්තරා කාල වකවානුවක දී ශු. දොමිනික් තුමා මේ සම්බන්ධයෙන් ඉතාමත් කනස්සල්ලට පත් වී එතුමා විසින් විවිධ පශ්චත්තාප ක්‍රියාවන් සහ යාච්ඤාවල යෙදෙමින් දෙවිඳුන් ඉදිරියේ කන්නලව් කරන ලදි.

දිනක් එතුමා ගැඹුරු යාච්ඤාවේ යෙදී සිටින විට සිහි මුර්ජා වී ඇද වැටුන අතර, එම අවස්ථාවේ දී ශු. මරිය තුමිය ශු. දොමිනික් තුමාට දර්ශනය වී "මෙවැනි ක්‍රියාවන් මැඩපවත්වන්නට නම් ශු. ජපමාලය නොකඩවා උච්චාරණය කළ යුතු බව පැවසුවාය. ඒ අනුව ශු. දොමිනික් මුනිතුමා නොකඩවා ශු. ජපමාලය කියමින් ද, දේශනා කරමින් ද සිටින විට ඇල්බිජෙන්සියන්වරුන්ගේ තර්ජන සහ මිසදිටු ක්‍රියාවන් නැවැත්වීමට උන්වහන්සේට හැකිවිය.

ක්‍රි.ව. 1214 දී මරියතුමිය විසින්ම වර්තමාන භාවිතයේ පවත්නා ආකාරයට ජපමාලය උච්චාරණය කරන ලෙසටත් සැම ජපමාල පංතියක් අවසානයේ දී "අභිරහසක්" මෙනෙහි කිරීමටත් ශු. දොමිනික් තුමාට උපදෙස් දුන්නාය. ඒ අනුව වර්තමානයේ දී අප විසින් උච්චාරණය කරනු ලබන ශු. ජපමාලය දැනට අවුරුදු 800 ක කාලයක් මුළුල්ලේ සමස්ත කිතුනු සභාව විසින් භාවිත කරමින් පවතී.

තවද වර්ෂ 1917 දී "පාතිමාවේදී" ලුසී, ෆ්‍රැන්සිස් සහ ජසින්තා යන දරුවන් තිදෙනෙකුට ශු. මරිය තුමිය දර්ශනය වූ අවස්ථාවේදී සැම ජපමාල පන්තියක් අවසානයේ දීම "අහෝ මාගේ ජේසුනී, අපගේ සැම පාපවලට සමාව දුන මැනව. නිරාගින්නෙන් අප ගලවා ගත මැනව. සියලු ආත්මයන්ද විශේෂකොට ඔබගේ දයාව ඉතා උවමනා ආත්මයන් ද ස්වර්ග රාජ්‍යයට ගෙන්වා වදාළ මැනව." යන යාච්ඤාව පව්කාරයන්ගේ සිත් හැරීමටත්, නිරාගින්නට වැටෙන ආත්මයන් ගලවා ගැනීමට සහ ශුද්ධිකගිනිස්ථානයේ ආත්මයන් උදෙසා ද යාච්ඤා කරන ලෙසද ඉගැන්වූවාය.

ශු. ජපමාලය උච්චාරණයේ දී සැම පන්තියක් අවසානයේ භාවනා කරනු ලබන "අභිරහස" යනු කුමක් ද? ජේසුස් වහන්සේගේ මාංශගතවීම, උත්පත්තිය සහ ළමා කාලය (සොම්නස් අභිරහස් පහ ලෙසට ද (උන්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ දුක්ප්‍රාප්තිය (දොම්නස් අභිරහස් පහ ලෙසට ද) උන්වහන්සේගේ උත්ථානය, අහස් නැගීම, ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීම, මරිය වහන්සේ ආත්ම ශරීර පිටින් ස්වර්ග යට ඔසවනු ලැබීම සහ එතුමිය ස්වර්ග රාජ්‍යයේ රාජිණිය ලෙස ඔටුනු පැළඳවීම (මෝක්ෂ අභිරහස් පහ) ලෙසට ද මෙම අභිරහස් කාණ්ඩ තුනට ඇතුළත්ව ඇත.

තවද 2002 වර්ෂයේදී ශු. දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ විසින් "ආලෝකයේ අභිරහස්" නමින් තවත් පංති පහක් මුල් ශු. ජපමාලයට එකතු කර තිබේ.

ජන වන්දනාව

## ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

### විශ්වාසිකයන්ගේ යැදුම් 2014 ඔක්තෝබර් 19 ඉරුදින දේව මෙහෙයට



- ✤ සුබාරංචිය අන් අයට ප්‍රකාශ කිරීමට හා ඒ වෙනුවෙන් සාක්ෂ්‍ය දැරීමට අපට පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙහිදී අපගේ දුර්වලතාවයන් හෝ පාපයන් නිසාවත් විවිධ වූ අනෙකුත් බාධාවන් නිසාවත් පසු නොබැස, පූර්ණ අවබෝධයකින් යුතුව දෙවි සමිඳුන්ගේ ශක්තිය මත යැපෙමින් දිවි ගෙවන්නට අපට හැකිවන පිණිස,
- ✤ 'දයා කරුණාව සියලු බාධාවන් ජයගනී' යන සත්‍යතාව මැනවින් අවබෝධ කර ගෙන විවිධ වූ හේතූන් නිසා නොමඟට යොමුවුනු අපගේ සහෝදර ජනතාවට, නව ජීවිතයක් සහ බලාපොරොත්තුවක් ගෙන දීම සඳහා සංවේදීව සහ පරිත්‍යාගශීලීව ක්‍රියා කිරීමට අප සැමහට හැකියාව ලැබෙන පිණිස,
- ✤ ශ්‍රී ලාංකික කතෝලික සභාවට අන්‍යාගමික සහෝදර ජනතාව සමඟ සුහදතාවයෙන් අත්වැල් බැඳ ගනිමින්, අද ලෝකයෙහි පැතිර යන හිංසනය, භේදය, අන්තවාදී ආකල්ප යනාදිය දුරු කර සැබෑ සාමය හා සංහිඳියාව ඇතිකරලීම සඳහා පලබර සංවාදයක යෙදීමට හැකියාව ලැබෙන පිණිස,
- ✤ කතෝලික සැදැහැවතුන් සැමදෙන භාග්‍යවත් ජුසේ වාස් පියතුමන්ගේ අඩි පාරේ යමින් රෝගී දුක්ඛිත ජනතාවගේ අවශ්‍යතාවලට සංවේදි වෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන්හිදී සහය වෙමින් ඔවුන් ඇදහිල්ලෙහි පැවැත්ම තුළ ශක්තිමත් කරන පිණිස,

# විපුල ප්‍රසාද ලත් මරි මවුනි ඔබට සදා ප්‍රශංසා වේවා!



දෙව්මව් ආදරය අත්දුටිමි

**මේ මරිය වසරයි. සමිඳු මැණියන්ගේ අනුහසින් ලත් සුවිශේෂ අත්දැකීමක් පෙරටු කරගෙන ජපමාලය නමැති අවියෙහි ප්‍රාතිහාර්යාත්මක බව විදහා පෙන්වීමටත් ජපමාලය කෙරෙහි භක්තිය වැඩි වර්ධනය කිරීමටත් මා මෙය ඔබ ඉදිරියෙහි තබමි.**

"ජේසුස් වහන්සේගේ මැණියන් වූ මරිය තුමිය ද උන්වහන්සේගේ සහෝදරයන්ද සමඟ එක්සිත්ව නොකඩවා යාච්ඤාවේ නිරත වූහ. (ක්‍රියා 1:14) මෙයින් අපට ඒත්තු ගන්වනුයේ මරියතුමිය ශු. සභාවේ පටන් ගැන්මේ සිට එදත්, අදත්, හෙටත් ශු. සභාව තුළ නිරන්තරයෙන් වැඩ වසන බව නොවේ ද? එය අප දහමෙහි පිළිගත යුතු සත්‍යතාවයකි. මෙය ඔබ හමුවේ තබන මා ශල්‍යකර්මයක අනිටු විපාක වශයෙන් අවුරුදු සයක කාල පරාසයක් පුරා වම් පාදයෙහි හට ගැනුණු තුවාලයකට පිළියම් සෙවීමට ගාල්ල, කොළඹ, මීගමුව තුළ නොයෙකුත් ආරෝග්‍යශාලාවල වෛද්‍යවරුන්ගෙන් පිහිට පැතීය. අනේක වේදනා, සිත් තැවුල්, කොන් කිරීම් සමඟ අවලංගු කාසියක් බවට පත්වූවා මිස කිසි පිළිසරණයක් නොමැති විය. සමහර වෛද්‍යවරුන්ගේ නිගමනය වූයේ මා පාදය වෙන් කිරීමයි.

මාගේ විශ්වාසය චංචල විය. නමුත් සමිඳු මා සමඟ සිට මා දිරිමත් කරවිය. මා හට ශු. ජෝබ් තුමාගේ කතා පුවත නොයෙක්වර සිහිගැන්විය. ඔහුගේ වදන් මා තුළ දෝංකාර විය. අනේක පීඩාවට පත් වූ මම යාච්ඤාව තුළ පිළියමක් සෙවීමට උත්සුක වීමි. දෙවිඳු අභියස කල් ගෙවීමට මා සිත පෙළඹීය.

මරිය වසර ප්‍රකාශයට පත් කිරීමත් සමඟ මා තුළ ප්‍රබෝධයක් ඇති විය. නිරන්තරයෙන් මරි මවුගේ පිහිට පැතීමට සිත පෙළඹවීය. මරිය තුමී ඇයගේ ඥාති සොහොයුරියට දැක්වූ අසීමිත වූ ප්‍රේමය, සහෝදර දයාව පිළිබිඹු කරන කැඩපතකි "ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දීය" (ශු. ලූක් 1:42) එළිසබෙත් තුමියගේ කියමන අපට ආදර්ශයක් නොවේ ද?

"එක්ව යදින පවුල එකට සිටින පවුලයි" එදා අප පවුල් පරිසරය තුළ තිබූ වාතාවරණයයි. සවස පවුල ඒකරාශී වී දේවමාතා පිළිරුව මල්දමින් සරසා ජපමාලය උච්චාරණය කිරීම, ගැයීම හා වැයීම අප මනසෙන් තවම ගිලිහී නැත. කතෝලික පරිසරයක හැදුන වැඩුන මා හට එදා සවස් භාගයෙහි ඒ මිහිරි අත්දැකීම අදත් මනසෙහි රැව් පිළිරැව් දෙයි. එදා සා. සභාවට දේව කැඳවීම් සුලභව ලැබුනේ මරි මවුගේ මැදහත් වීමෙනි. මෙම පෙළඹීම තුළ මා ජපමාලය අභිරහස් සියල්ල උච්චාරණය කිරීමට ඉටා ගතිමි. කිසිම වෛද්‍යවරයෙක් වෙත මා නොගිය බැවින් මාගේ පාද තුවාලය වැඩි වෙන ලකුණු දිස් වූවත් මා දන්නා පිළියම් එයට කරන ලදි. ජපමාලය කෙරෙහි භක්තිය වැඩි වර්ධනය විය. භාග්‍යවන්ත අම්මා තම මාතෘත්වය වටහා ගත්තේ දෙවියන් වහන්සේට පුදන පූර්ණ ආත්ම තිළිණයක් ලෙසය. එවැනි මවක් තම බලාපොරොත්තු බිඳුන දියණියව මඟ හරීද? මෙම වකවානුව තුළ කැගල්ලේ මා සොහොයුරියක හට පාද තුවාල සුව කරන වෛද්‍යවරයකු ගැන දැනගැනීමට ලැබ ඒ ගැන මා දැනුම්වත් කළේ ය. සියලුම කිතුනුවනගේ මව වන මරි මවු අප දෙස ජ්වලිතව බලා සිටින බව නොරහසකි. මව්තුමිය ගේ අසීමිත දයාව හා ධෛර්යය මත මා එම වෛද්‍යවරයා වෙත යොමු වීමි. මම පොරොන්දු වූ ලෙස ජපමාලය නොකඩවා උච්චාරණය කළෙමි.

අප භාග්‍යවන්ත අම්මා සැබෑ කැපවීමකට ම දායක වෙමින් සේවක ස්වරූපය වැළඳ ගත්තේ ඉශ්රායෙල් ජනතාව එදා පැතූ විමුක්තිය උදා කරනු පිණිසය. මරි මවු අදත් සාන්ත සභාව තුළ නිරන්තරයෙන් වැඩ වසමින් සියලුම කිතුනුවනගේ මව වෙමින් සමිඳාණන් වහන්සේ අභියස අප වෙනුවෙන් අයදින යාච්ඤාවේ උල්පත වන්නීය. ක්‍රම ක්‍රමයෙන් මා පාදය නිට්ටාවටම සුව වීමට හේතු පාදක වූයේ මරිය තුමී වෛද්‍යවරයා තුළින් මා හට පෙන්නූ අනුහස නිසා බව මාගේ හැඟීමයි. අද මා සම්පූර්ණ සුවය අත්දකිනුයේ ශුද්ධවු ජපමාලය බලගතු අවියක් වන නිසාය.

දේශපාලනික, ආර්ථික, සදාචාරාත්මක හා ආධ්‍යාත්මික නවෝදයක් අප ලක් දිවයිනට අවැසිව සිටින මෙම වකවානුවේ විශේෂයෙන් මේ මරිය වසරේ අපි දෙව් මව් වටා රොක් වෙමු. යදිමු ජපමාලය. පතමු ඇයගේ පිහිට අප ලක් වැසි දනහට. මා පීඩාවට පත් වූ මොහොතේ සිට අද දක්වා මා වෙනුවෙන් සමිඳු අභියස මැදහත් වූ සියලු දෙනාවම මම අද සිහිපත් කරනුයේ හද පිරි බැතියෙනි.

**✍ ගරු ෆෙලිෂිටා ප්‍රනාන්දු පැව්දිසොයුරිය**
රත්මලාන




*ශුද්ධවු සභාව තුළ පූජක, පැවිදි, තාපස පැවිදි සොයුරියන් දෙවියන් වහන්සේ විසින්ම විශේෂ ආලේපනයක් තුළ දේව රාජ්‍යය සඳහා තෝරා ගෙන ඇත.*

**(ගෝනවල - ලූෂන්)**

# ජීවිත වෙනසකින් දේව රාජ්‍යයේ වටිනාකම් පතල කරමු

ක්‍රිස්තුස් වහන්සේගේ දේශනා තුළින් ද, පුරාණ ගිවිසුමේ දිවැසිවරුන්ගේ දේව වචනය ප්‍රකාශ තුළින් ද ලොවට හඬගා පැවසූ වදන් ;දේව රාජ්‍යයේ වටිනාකම් තේරුම්ගෙන ජීවිත පෙරළියකට හෙවත් ජීවිත වෙනසකට අපව කැඳවීමකි. "වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳාණන් වෙත හැරී එන්න." (ජෝවෙල් 2:12). එබැවින් ආබ්‍රහම් අපගේ පියාණෝ යැයි සිතින් කියා නොගෙන සිත් හරවා ගත් බව දැක්වෙන ලෙස හැසිරෙන්න. "එවක් පටන් ජේසුස් වහන්සේ පසු තැවී සිත් හරවා ගන්නා. දේව රාජ්‍යය ආසන්නය..." (ලූක් 3:8) කියා දේශනා කරන්න පටන් ගත් සේක.

**01. දේව රාජ්‍ය හෙවත් ස්වර්ග රාජ්‍යය යනු කුමක් ද?... එය සමාන කළ හැක්කේ කුමන කාරණාවලට ද?**

i. දේව රාජ්‍ය හොඳ බීජ වපුළ මිනිසෙකුට සමානය. මිනිසා නිදා සිටියදී ඔහුගේ සතුරා අවුත් තිරිඟු අතර කිරිඳි වපුරා ගියේය. (මතෙව් 13:24)

ii. දේව රාජ්‍ය මිනිසෙක් සිය කෙතෙහි වපුල අබ ඇටයකට සමානය. එය සියලුම බීජ වලට වඩා කුඩා වුවත්, වැඩුනු කල හැම පැළ වර්ගයකටම වඩා විශාල වී.... (මතෙව් 13:31)

iii. දේව රාජ්‍ය ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් සහමුලින්ම පිපෙන තුරු එහි දමන ලද මුහුන් පිඩකට සමානය. (මතෙව් 13:33)

iv. දේව රාජ්‍යය කෙතක සඟවා තිබුණු නිධානයකට සමානය. (මතෙව් 13:44)

v. දේව රාජ්‍යය අගනා මුතු ඇට සොයා ගිය වෙළෙන්දෙකුට සමානය. (මතෙව් 13:43)

vi. දේව රාජ්‍යය මුහුදේ හෙලන ලද සියලු වර්ගවල මසුන් හසුකර ගත් දැලකට සමානය. (මතෙව් 13:47)

**02. ඉහත දැක් වූ උපමා තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් තේරුම් ගන්නේ කෙසේද?...**

දේව රාජ්‍ය වනාහි මුළු මිනිස් සංහතියටම පොදු වූ රාජ්‍යයකි. ලෝකය තුළ යහපත් හා අයහපත් මනුෂ්‍යයෝ දෙවර්ගයම වෙසෙති. අයහපත් යැයි සැලකෙන මනුෂ්‍ය වර්ගයාට නැවත යහමඟට යොමු වීමට අවශ්‍ය යැයි සිතෙන හැම විටම අයහපත දුරලා යහපත වෙත සිත් යොමු කොට ජීවත් විය හැකිය. අපගේ ජීවිතයේ සෑම තත්පරයක්ම ආදරය, කරුණාව, මෛත්‍රිය, දයාව, සමාව දීම සහ සංවේදී වීම යන මුතු ඇට වලින් සරසා ගත යුතුය. තවද අපගේ මුළු ජීවිතයේම අඩිතාලම විය යුත්තේ ද ආදරය, ප්‍රේමය නමැති මහාර්ඝ නිධානයයි. එම නිධානය ලබා ගැනීමට අප සතු හැමදේම පරිත්‍යාග කළ යුතුව ඇත. කිරිකැටි බිළිඳුන් තුළ හට ගන්නා වූ අබ ඇටයක් පමණ වූ විශ්වාසය දවසින් දවස අප වැඩෙත්ම දේව රාජ්‍යයේ අමිල වූ මිනිස් වටිනාකම් තුළින් වර්ධනය කර විශ්වාසයේ මහා පර්වතයක් බවට පත් කර ගත යුතුමය. අප ජීවිතයම මා ඇලකින් වට වූ ජීවිත රටාවකි. මෙම මා ඇල තුළ සැඟ වී නොසිට ආදරයේ සෙනෙහසේ අසිපත් තුළින් එය බිඳ දමා පිටිනැලි තුනක් සහමුලින්ම පිපෙන තුරු දමන ලද මුහුන් පිඩක් වීමට වෙර දැරිය යුතුය.

**03. දේව රාජ්‍යයේ වටිනාකම් මොනවාද?...**

ක්‍රිස්තු ස්වාමිදරුවාණන් තම පළමු දේශනාව තුළින් දේව රාජ්‍යයේ වටිනාකම් අපට කියා දුන්නේ මෙලෙසිනි.

- ★ බැගෑ සිතින් දෙව් සරණ පතන අය..
- ★ නිහතමානි ගුණ ඇති අය...
- ★ යුක්තියට සාපිපාසා ඇති අය....
- ★ නිර්මල සිත් ඇතිව ජීවත් වීමට වෙර දරන අය....
- ★ සාමය ඇති කිරීමට උත්සාහ කරන අය
- ★ යුක්තිය උදෙසා පීඩා විඳි අය..
- ★ දයාව පතුරන්නට වෙර දරන අය...
- ★ ජේසුස් වහන්සේ වෙනුවෙන් නින්දා අපහාස වලට ගොදුරු වන අය..

ඉහත වටිනාකම් අප තුළ ඇත්දැයි අපටම සිතා බැලීමට කාලය උදා වී ඇත.

☛ ලබන සතියට

**✍ ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමා**
හාල්දඬුවන - දන්කොටුව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## තෙවන සතිය ඉරිදා උදා යාම යැදුම

### 93 වැනි ගීය

**පසුගිය සතියෙන්**

**ආදියේ පටන් :** අනාදියේ සිට දිස්වන දෙවියන් වහන්සේගේ පැවැත්ම ශුද්ධ බයිබලයේ මූලික ඉගැන්වීමකි. ඒ හා සම්බන්ධව දැක්වෙන උන්වහන්සේගේ රාජකීයත්වය සදාතනික වන්නේය. (උත්. 1:11, යෙසායා 41:4, 44:6, එළිදරව්ව 1:8)

**සමුදුර රළ පතර... ගිගුම් දෙන්නේය :** පුරාතන ලෝකයේ මැවීමේ කතා හෙවත් දේව කතාවල මුහුදේ රළ පතර සහ ව්‍යාකූලත්වය අයහපතේ බලවේග සංකේතවත් කරයි. දෙවියන් වහන්සේගේ මැවීමේ ක්‍රියාව විස්තර කෙරෙන්නේ එම බලවේග අභිබවා යමින් පිළිවෙල සහ යහපත්කම ඇති කරන ක්‍රියාවලියක් සේය. (උත්. 1:2, යෙසායා 41:4, ගීතා 29:3, 104:7-9)

**ඔබේ අණ පනත් සදාතනිකයඃ** දෙවියන් වහන්සේගේ ආඥාවන් සෑම යුගයකටම බලපාන විශ්ව ගුණයකින් යුක්තය (ගීතා 119:89-90) දෙවි සමිඳාණන්ගේ ශික්ෂා පද හෙවත් අණ පනත් සෑම පරපුරකටම මාර්ගෝපදේශයක් වන්නේය (ගීතා 119:113-120)

**යැදුම :**
මුළු විශ්වයේ ස්වාමින්ද්‍රයාණන් වන දෙවි පියාණන් වහන්ස, මෙම ලස්සන ලෝකය නිර්මාණය කොට එය නිති සුරකින ඔබවහන්සේට තුති ප්‍රශංසා කරමු. අපගේ දෛනික ජීවිතයේ දී ඔබවහන්සේගේ ප්‍රඥාව හා බල මහිමය මැවිල්ල තුළින් දකින්නට ද ඔබවහන්සේගේ අභිමතය පරිදි සාධාරණත්වයේ සහ සහජීවනයේ පැවැත්මක් ඇති කර ගැනීමට ද අපට මඟ පෙන්නුව මැනව.




මරිය වසර

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

# සුදුවරයට එසවීම පිළිබඳව ජනතාව දැනුම්වත් කළ යුතුයි



**කතුතුමනි,**

සුදුවරයට පත්කිරීම පිළිබඳව සභාවේ ක්‍රමවේදය ගැන කිතුනු ජනතාවට නිසියාකාර අවබෝධයක් තිබිය යුතුය.

ඉතා දුක්වේදනා විඳීමත් ජනතාවට ශුභාරංචිය පතුරුවා හැරීමේදි දිවි පුදමින් බොහෝ කිතුනු අනුගාමිකයන් සාන්ත සභාව විසින් භාග්‍යවරයට ඔසවනු ලැබ ඇත.

මෙම අවස්ථාවේදි පවා ශුද්ධවන්ත භාවයට පත්කරනාලෙස කිතුනුවන් ඉතා සංවේදිව අධ්‍යාත්මික මෙහෙයන් තුළ රැ‍ඳෙමින් සිටිනු දක්නට ඇත. සාන්ත සභා සුදුවරයට පත් කිරීමේ ක්‍රමවේදය නිසියාකාරව කිතුනු ජනතාව අතරට පත් කිරීම සභාවේ දූත කාර්යය ලෙස මම සිතමි. අධ්‍යාත්මික වශයෙන් මෙන්ම සුදුවරයට එසවීමේ ක්‍රියා පරිපාටිය ගැන ජනතාව තවත් පොහොනි කරන්නේ නම් ඉතා අගනේය. එය යුගයේ

අවශ්‍යතාවයක් ලෙස හැඳින් විය හැක.

**ඩී. අර්නස්ට් සමරතුංග**
රාගම

# දහමෙන් ගුරුවරුන් හා දරුවන් රැකේවා!

**කතුතුමනි,**

දහම් ගුරුවරුන් ධර්මයේ ජීවනාලිය බඳුය. ඔවුන් දරුවන්ට සිප් සතර පහදා දී දෙවියන්ගේ ආදරය සිසුන්ට ලබා දේ. අතීත දහම් ගුරුවරුන් දෙවියන්ගේ දේව දූතයන් බඳුයි. එහෙත් අද මේ දේවස්ථාන වල සමහර දහම් ගුරුවරුන්ට සිදුවූයේ කුමක්ද?

දහම් සාරිය විලාසිතාවක් ලෙස අඳියි. නාබිය සහිතව බඩ වියතක් තරම් පෙන්වා හැට්ට කර රූපසුන්දරියන් තරමට කපා ශරීරය නිරාවරණය කරති. ලොකු දූ පුතුන් සිටිනා මව්වරුන්ද මෙලෙස හැසිරීම කාට කියන්නද? වැටත් නියරත් ගොයම කා නම් කාට පවසම් ඒ අමාරුව.

මෙම දහම් ගුරුවරු සාමාන්‍ය දිනවල ගවුම අඳින විට එක්කෝ එය කොටය නැතිනම් උඩුකය නිරාවරණය වී ඇත. කුඩා දරුවන් වයස අවුරුදු 5-16 අතර බාල පරපුරට දෙවියෝ බලත්වා. මා මෙය ලියන්නේ සියලුම දහම් ගුරුවරුන්ට නොව තොප්පිය හරි අය දමා ගනිත්වා. අප වර්තමාන දහම් ගුරුවරුන් අඳින ඇඳුමට හා හැදියාවට නීතිරීති පද්ධතියක් ඇමීමට සභා පාලකයන්ගේ අවධානය ලක්කෙරේවා!

**අමිත් සුබසිංහ**
කොළඹ

# සැරදේවා ජාතියේ පෙර ගමන්කරුවාණනි!

**කතුතුමනි,**

ලෝක ගුරු දිනය ඔක්තෝබර් මස 6 දිනට යෙදී තිබිණි. වර්ෂ 1990 දී කොස්ටරිකාවේ පැවති ලෝකගුරු සම්මේලනයේදී ලෝක ගුරු දිනයක් පැවැත්වීම පිළිබඳව යෝජනා කළේ ශ්‍රී ලාංකිකයෙකි. අන්තර් ජාතික ගුරු සම්මේලනය මේ යෝජනාව පිළිගෙන ඒ සඳහා ඔක්තෝබර් 6 දින යොදා ගැනිණ. ඉන්පසු සෑම වසරකම මෙදින ලෝක ගුරු දිනය ලෙස උත්සවශ්‍රීයෙන් සමරති.




ගුරුවරයා ගුරුවරිය යනු සමාජයක් නිසි මං ගන්වන, එඩිතර, බුද්ධිමත් අනාගත පරපුරක් බිහිකරන පෙරගමන් කරුවෙකි. පාසල සමාජයේ යහපත උගන්වන ජීවිතය හැඩගස්වන තෝතැන්න නම් එහි මුරදේවතාවා ලෙස ගුරුවරයා හඳුන්වා දීම සැබෑය. විෂයයන් ඉගැන්වීම පමණක් නොව සදාචාරය සංවර බව විනයගරුක බව මුල්කරගෙන පාසල් දූ පුතුන් තමන්ගේම දරුවන් ලෙස සලකා සෑම දරුවෙක්ම එක ලෙස සලකමින් ගුරුකම රස්සාවකට වඩා උතුම් සේවයක් ලෙස සැලකූ ගුරුවරු එදා සිටියහ. එනිසාම පාසල තුළින් සමාජයට බිහිවූයේ හික්මීම විනයගරුක යුක්තියට සාධාරණයට හිස නමන බුද්ධිමත් පිරිසකි.

අද ඒ සියල්ල උඩු යටිකුරු වී ඇත. මුදල් මත සියල්ල තීරණයවී ඇති සමාජයක් බිහිවීම නිසා ගුරු සේවයේ ගෞරවයද සිඳී ගොස් ඇත. එදා සමාජයේ දේවත්වයෙන් සැලකූ ගුරුවරයා අද ටියුෂන් මුදලාලිලා වී ඇත. ඇතැම් ගුරුවරු තම පෙන්වාදී නිවරදි කරගැනීමට ගුරුවරයා සහය විය යුතුය. ඇතැම් ගුරුවර ගුරුවරියන්ගේ නොහොබිනා හැසිරීම් නිසා ඇතැම් සිසුන්ට ඉගෙනීම පවා එපාවී තම ජීවිත පවා විනාශ කරගත් අවස්ථා අද අසන්නට ලැබීම ඉතා කණගාටුදායකය. අද දේශපාලනයද පාසල තුළට ඇතුල්වී ඇති නිසා ගුරුවරුන් දේශපාලනය තුළ කල්ලි ගැසී ඇත. මේ නිසා සිදුවන්නේ විනාශයක්මය. ගුරු සිසු සබඳතා පිරිහී ගොස් ඇත. උගත්කම වියගරුක බව මුල්කරගෙන ගුරු වෘත්තියට සුදුස්සන් තෝරාගත යුතු වුවද අද සිදුවන්නේ දේශපාලන ඕනෑ එපාකම් මතය. එනිසා දරුවන්ට සිදුවන්නේ අයහපතකි. ගුරු වැටුපට සරිලන සේවයක් නොකරති. තම පුද්ගලික සමාජ ආර්ථික ගැටලු හමුවේ වුවද තම සේවය කැපවීමෙන් කරන ගුරුවරුද නැත්තේ නොවේ. සැමවිටම ගුරුවර ගුරුවරියන් පාසලේදි මෙන්ම සමාජයේදීත් සිසු දරුවන්ට ආදර්ශමත් විය යුතුය. පූර්ණ විශ්වාසයකින් බලාපොරොත්තු සහිතව දෙමව්පියෝ, ගුරුවරයාට බාරදෙන දරුවා ශාරීරිකව මානසිකව අධ්‍යාත්මිකව සමාජයේ ප්‍රසාද ලබමින් වර්ධනය වීමට මඟ හෙලිකර දිය යුත්තේ ගුරුවරයාය.

දරුවකුගේ වරදක් දුටු විට එය ඉතා ආදරයෙන් දෙගුරු සිසු ප්‍රශ්න නීතිය ඉදිරියට ගිය අවස්ථා ද අද අසන්නට ලැබේ.

මේ සියලු සත්‍යතා හමුවේ ගුරුවරයාගෙන් සිසු දරුවන් තුළ ගුරු භක්තිය යළි නැංවීමට පියවර ගත යුතුය. ලෝක ගුරු දිනය උත්සව පැවැත්වීමට පමණක් සීමා නොකර ගුරු වෘත්තියේ ශ්‍රේෂ්ඨත්වය සුරැකීමටත් සමාජයේ ගරුත්වය ලැබීමටත් සුදුසු වටපිටාවක් ඇතිකරවන්නේ නම් එය ගුරු පරපුරටත් සමාජයටත් වාසනාවක් වනු ඇත.

**ඩොරින් පෙරේරා**
මොරටුව

# සිසු දරුවන්ගේ දෙමව්පියන්ට විවෘත හසුනක්!

**කතුතුමනි,**

වත්මනේ අප ජීවත් වන ජන සමාජය තුළ සිදුවෙමින් පවත්නා සමාජ විෂමතාවන් ගැන අමුතුවෙන් විස්තර කළ යුතු යැයි නොසිතමි. මේ සමයේ සිදුවන සමහර සිදුවීම්, පාසල් වියේ පසුවන සිසු දරුවන් පාදකකොට සිදුවීමේ ප්‍රවණතාවක් නන් දෙසින් වාර්තා වේ. එසේ වාර්තා නොවන ලෙස පාසල් තුළ යටපත් කර සඟවනු ලබන සිදුවීම්ද අපමණයි.

බොහෝ විට පාසල් වල හෝ පාසලින් පරිබාහිර උපකාරක පංති තුළ හෝ වෙනත් නිදහස් ස්ථාන වල නොමනා ලෙස, අනිසි ක්‍රියාවල යෙදී අසුවන සිසුන් ජ්‍යෙෂ්ඨ අංශයේ ඉගෙනුම ලබන නව යොවුන් වියේ දරුවන් බව, පැහැදිලියි. 'ඔය ඉතිං වයසේ වැරැද්දනේ' කියා සමහර විට මෙවැනි සිදුවීම් අප සාධාරණීකරණය කරන්නට යත්න දැරුවද දැන් තත්ත්වය සහමුලින්ම වෙනස් වී ඇති බව කණගාටුවෙන් යුතුව සඳහන් කරමි. එනම් මේ වනවිට කනිෂ්ඨ අංශයේ මෙන්ම ප්‍රාථමික අංශයේ ඉගෙනුම ලබන සිසුන් අතරද විවිධාකාර නොමනා අපචාර ක්‍රියාවන් සිදුවන බවත් එවැනි සිද්ධීන් මෙවන් ලිපියකින් ලියා විස්තර කළ නොහැකි තරමට බරපතල බවත්, සමහර විට මේ වයසේ පසුවන අපේ දරුවන්ගේ දෙමාපියන් නොදන්නවා විය හැකිය.

එහෙයින් දෙමාපියෙනි! ඔබේ දුවා දරුවන් ගැන නිරතුරුවම සුවිශේෂි අවධානයෙන් සිටින්න. ඔවුන් ඇසුරු කරන මිතුරු මිතුරියන් ගැන විමසිලිමත් වන්න. නිතර දරුවන් හා සුහද සංවාදයක යෙදෙමින් ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු විමසන්න. පාසල් බාහිර වැඩ කටයුතු වලට, ක්‍රීඩා කටයුතු වලට, මෙන්ම උපකාරක පංතිවලට යැවීමේදී විශේෂ අවධානයෙන් සිටින්න. ඔබ ඔබේ දරුවන් ගැන නිරන්තරයෙන්ම සොයා බලන බව. ඔවුනට දැනෙන ලෙස කටයුතු කරන්න උත්සුක වන්න.

**ජූඩ් සේනාධීර**
මට්ටක්කුලිය

# දොර කෝ?

**කතුතුමනි,**

ආගමික අයිතීන් පිළිබඳව විවිධ බල සේනා සටන් කරන යුගයක, කතෝලික සභාවට විවිධ කාලීන අභියෝග එල්ලවන අවස්ථාවක, පැරණි දේශීය කිතුනු සභා ඉතිහාසය ගැන සෙවීමේදී සීගිරිය මුදුනේ කාශ්‍යප රජ සමයේ කුරුසියක් සිටුවීම චූල වංශයේ සඳහන් 'දල්හා' කතෝලික දේවස්ථානය ගැන හෙළිකිරීම පසුගියදා ප්‍රදීපයෙත් සඳහන් කර තිබීම ප්‍රශංසනීයයි.

මේ ආගමික සත්‍යතාවයන් සඟවා තබාග ැනීමට, ආගමික මති මතාන්තර අතරට කැළෑ නීතියේ සවිය යොදාග ැනීම නම් ඉතා අහිත කරය. මන්ද පැරණි කිතුනු සභා ඉතිහාසය ගැන සෙවීමේදී අධ්‍යාපනඥයින් පාට පාට කණ්නාඩි දමාගත් චින්තකයින්, අනුවර්තකයින්, තම පුද්ගලික න්‍යායපත්‍ර තුළින් තොරතුරු ඉදිරිපත් කරන්නට, යටපත් කරන්නට ගොස්, සත්‍ය තොරතුරු ඉරිතලා ගොස් ඇති බව නම් රහසක් නොවේ. දිගාමඩුල්ලේ ජනවහර ජන ආගම, මන්නාරම් සුදුවැල්ලේ ඇති කතෝලික උරුමය ඊට නිදසුන්ය.

ආගමික සංහිඳියාව ගැන වැඩියෙන් කථාකරන මේ කාලයේ ඒ අසිරිමත් අතීතාවලෝකනය ගැන දැනගැනීමට අපට ඉතා උවමනාවක් ඇති බව සඳහන් කළයුතුය. මේ ගැන කිතුනු ජනතාව මහත් පිපාසයෙන් සිටින බවද කිව යුතුය. බහු වාර්ගික., බහු ආගමික ශ්‍රී ලංකාවේ මෙය අපට ඇති උතුම් මානව අයිතියකි. ඒ නිසා මේ ආගමික සහජීවනයේ විවිධත්වය තුළ ඒකත්වයේ විචිත්‍රවත් බව, පෙන්වන ඉතා වැදගත් උතුම් නිර්මාණයක් බෞද්ධ ආගමිකයෙකු වූ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල නාට්‍ය අංශයේ ප්‍රධානී, සංගීතවේදී වජිර ඉන්දික කරුණාසේනයන් විසින් නිෂ්පාදිත ක්‍රිස්තු චරිතය සංගීත සංධ්වනිය (ක්‍රිස්තු චරිතයේ අධ්‍යාත්මික හඬ පටය ගුවන් විදුලි සංස්ථාවේ ගරු සභාපති තුමා විසින් පසුගියදා අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට ප්‍රදානය කරන ලදි. එය උන්වහන්සේගේ පැසසුමට ඇගයීමට ලක්විය. අතිඋත්තම ප්‍රැන්සිස් පාප්තුමාගේ ඉදිරි ශ්‍රී ලංකා සංචාරයට පෙර මෙවැන්නක් නිර්මාණය කිරීමට දායක වීම, ආගමික සංහිඳියාවේ ඉතා හොඳ පැතිකඩක් බවයි කාදිනල් තුමාගේ මතය වී තිබුනේ.

විවිධත්වයේ ඒකත්වය තුළ විචිත්‍ර වන්නට ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ පිළිබිඹු වීමට ඇති සියලු මං මාවත් විවර කොට සමිඳුන්ගේ මාවත පිළියෙල කරන්න මීට අයත් සියලු දෙනාගේම හදවත් පිපාසය වේවායි පැතුම් පතමින් යදිමු.

**ඇන්ටනි ස්ටැන්ලි කීර්ති සිරි පෙරේරා**
කුඩාවැව



# ලූර්දු වන්දනා ගමන කැමරා ඇසින්

**අගරදගුරු පදවිය සංවිධානය කළ ලූර්දු වන්ද**
**සැදැහැවතුන් රැගෙන යන්නට මූලිකත්වය**

★ සුපර්ලින්ක් ට්‍රැවල්ස්හි අධිපතිතුමන්ටත්

★ ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස්හි අධිපති තුමන්ටත් ★ පෙට්වින්ශ

අගරදගුරු පදවිය වෙනුවෙන් ඥානාර්ථ ප්‍රදීපයෙන් පිදෙන හ
















**...නා ගමනට**
**... ගත්**
**...**
**...ිහි අධිපතිතුමන්ටත්**
**...ද බැති තුතියයි මේ.**









## 2014 ලෝක ධර්මදූත ඉරුදින වෙනුවෙන් අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් නිකුත් කළ පණිවුඩය

03 පිටුවෙන්

මෙය අප ගැලවීමට මග පෑදූ ශුභාරංචිය වන්නේය. මරියා ජේසුස් වහන්සේ තම කුසෙහි දරා ගෙන තම බන්දුවරිය වූ එළිසබෙත් හමුවීමට ගොස් ශුද්ධාත්මයාණන් තුළ අපමණ ප්‍රීතියට පත් වෙමින් එම උදාන ගීය ගැයූ බව සුවිශේෂකවරයා සඳහන් කරන්නේ අභිරුචියෙනි. මෙලෙස ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් තමන්ට පවරන ලද ධර්මදානීය කාර්යය සාර්ථකව නිමවා පැමිණි විට ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීති ප්‍රමෝදයට පත් වෙමින් උන් වහන්සේ දෙව් පියාණන් පැසසූ සේක.

ඉහත කී අවස්ථා දෙක තුළදීම අප දකිනුයේ එය ගැලවීමේ ක්‍රියාදාමය සම්පූර්ණ වීම නිසා ඇති වූ ප්‍රීති සන්තෝෂයක් බවයි.

දෙව් පියාණන් වහන්සේ අතිශයින් ප්‍රේම කළ තම ඒකජාතක පුත්‍රයාණන් අපේ ගැලවීම උදෙසා ස්වර්ගයෙන් බැස එවා මනුසත සමඟ එක්වීමට සලස්වා ශුද්ධාත්මයාණන් හරහා අප පූර්ණත්වයට ද පමුණුවා ශුද්ධවූ ත්‍රිත්වීක ජීවිතය තුළ පංගුකාරයින් වීමට ද සැලසූ සේක.

පියාණන් වහන්සේ ප්‍රීතියේ උල්පත වන සේක.

පුත්‍රයාණන් එයින් නික්මෙන ප්‍රකාශනය වේ. ශුද්ධාත්මයාණන් තුළින් සියල්ල ලැබෙනු ඇත. සුවිශේෂක මතෙව් තුමා පවසන පරිදි උන්වහන්සේ පියාණන් වහන්සේට තුති ප්‍රශංසා කිරීමෙන් අනතුරුව "වෙහෙස මහන්සි වන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න. මම ඔබට සහනය දෙමි. මා ගුණවත් මෘදු නිහතමානි කෙනෙකු බැවින් මාගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනය ලැබෙනු ඇත. මාගේ විය ගහ පහසුය. මාගේ බර ද සැහැල්ලුයැ"යි වදාළ සේක.

ශුද්ධවූ ලියවිල්ල තුළින් ජනිත වන සතුට ජේසු සමිඳාණන් හමුවන සියලු දෙනාගේම හදවත් සහ ජීවිත පුරවාලනු දැකිය හැකි වේ. උන්වහන්සේගේ ගැලවීම පිළිගන්නා අයවලුන් පාපයෙන් ද, දුක් වේදනා වලින් ද, ඇතුළාන්ත හිස්කම හා හුදෙකලා වීමෙන්ද මුදා හරිනු ලැබේ. ක්‍රිස්තුන් වහන්සේ තුළ අඛණ්ඩව ජනිත වන ප්‍රීතිය සතුට අලුත්ය. නැවුම්ය.

ජේසුස් වහන්සේ මේ ආකාරයෙන් මුණ ගැසීම තුළින් කන්‍යා මරිය තුමිය ලද අත්දැකීමද ද්වීතිය එකකි. සුබ අස්න දේශනා කිරීම සඳහා ජේසුස් වහන්සේ අනුව යෑමට කැඳවනු ලැබූ ශ්‍රාවකයෝ ද (මාක් 3:14) එම ප්‍රීතිය සතුට අත්වින්දාහ. එසේ නම් මෙකී ප්‍රීතිය අත්විඳීම සඳහා ඊට ප්‍රවිෂ්ට වීමට අපට ද නොහැක්කේ ඇයි?

4. වර්තමාන ලෝකය තුළ පවත්නා ප්‍රබල අනතුරක් වනුයේ අනවශ්‍ය පරිභෝජනය කෙරෙහි ඇති අසීමිත ආශාවයි. කිසිදා සෑහීමකට පත් නොවෙන එම මසුරු ඉල්ලීම අතිශයින් කටුකය. එහෙත් තෘෂ්ණාධික හැඟීම් වලින් මෙහෙය වනු ලබන මිනිසා මෙම තිරසාර ආශාවන් සතපනු සඳහා අවිනිශ්චිත හෘදය සාක්ෂියට තවදුරටත් තමන් රවටාලීමට ඉඩ හරිනු පෙනෙයි. (Evangeli Gaudium)

මුළු මිනිස් සංහතියම ක්‍රිස්තුස් වහන්සේ විසින් ළඟා කර දුන් ගැලවීම සඳහා ශක්තිමත්ව බැඳී සිටිය යුතු වේ. උන්වහන්සේගේ ශ්‍රාවකයන් ජේසුස් වහන්සේගේ ප්‍රේමය සහ දේව රාජ්‍ය ගොඩනැඟීම සඳහා ඇවිලෙන ගින්නක් වැනි බලවත් හැඟීමෙන් යුතුව දේව වචනය පතුරුවා හැරීම තුළින් සතුටට පත් වූහ.

ධර්මදානයේ ප්‍රීති ප්‍රමෝදය තුළ ශක්තිමත් වීම සඳහා ස්වාමින් වහන්සේ සියලුම අනුගාමිකයන් කැඳවා තිබෙයි. දේශීය සභාව තුළ පවත්නා ධර්මදානීය කැපවීම තුළින් එකමුතුකම නංවාලීමේ මූලික වගකීම දෙගුරු උතුමන්ලා වෙත පැවරී තිබෙයි. තම පාලන පදවි පරිමාණය තුළ නොදියුණු ඈත ගම්මාන වෙත ජේසුස් වහන්සේ හඳුන්වා දීම වෙනුවෙන් ඔවුන් කැඳවා ඇත. මෙම ක්‍රියාදාමය මඟින් ළඟා වන ආධ්‍යාත්මික සතුට බැහැර කළ හැකි නොවේ. තවද මෙම දුෂ්කර ප්‍රදේශ තුළ වෙසෙන දුගී දුප්පත් ජනතාව මෙම පණිවුඩය අපේක්ෂාවෙන් සිටිනා බවද අමතක නොකරමු.

නූතන ලෝකයේ නොයෙක් දේශයන් හි පූජක සහ පැවිදි ජීවිත සඳහා පවතින කැඳවීම් ප්‍රමාණය අතිශයින් අල්පය. මීට හේතු සාධක වශයෙන් දැක්විය හැක්කේ ජන සංඝය තුළ පැවිදි සේවාව කෙරෙහි ඇදී යන ආකර්ශනයක් නොමැති වීම සහ ධර්මදානය පිළිබඳව උද්යෝගයක් ඇති කරන උණුසුමක් ද නොතිබීමයි. දේව වචනයේ ප්‍රීතිය ඇති වන්නේ ක්‍රිස්තුස් වහන්සේ හමුවීම තුළින් සහ දුගී දුප්පත් ජනතාව සමඟ එම නිහතමානි ශාන්තිය බෙදා ගැනීමෙන්ය. එබැවින් අපේ මීසම් සංඝයන්ට, සමිති සමාගම් වලට සහ අනිකුත් අපෝස්තලික කණ්ඩායම් ද දිරි ගන්වමින් මා ඉල්ලා සිටින්නේ, ක්‍රිස්තුන් වහන්සේගේ දයාව ආදරය සමඟ මුසු වූ සහෝදරත්වයකින් යුතුව කිසිදු පිළිසරණක් නැතිව ජීවත් වන්නන්ගේ ඕනෑ එපාකම් වලට සංවේදී වන ලෙසයි. ප්‍රීතිය, සාමය, සතුට පවතින යහපත් පරිසරයක් තුළින් පමණක් ක්‍රිස්තු පණිවුඩය අන් අය වෙත රැගෙන යාමේ අව්‍යාජ සාර්ථක කැඳවීම් නිර්මාණය වනු ඇත.

මෙම කැඳවීම් ගැන අවධානය යොමු කරත්දී ධර්මදානය සඳහා අත්‍යවශ්‍ය ගිහි පාර්ශවයේ සහභාගිත්වය කිසිසේත්ම බැහැර නොකරමු. සභාව තුළ ගිහියාගේ ධර්මදානය අප විසින් පුළුල් ලෙස හඳුනා ගත යුතුව තිබෙයි. සුබ අස්න දසත පතුරුවාලීම සඳහා වැදගත් සුවිශාල මෙහෙවරක් ඉටු කිරීමට සිදුව ඇති බවද පසක් කර ගනිමු. සාර්ථක ක්‍රියාකාරී අපෝස්තලික සේවාවක් සඳහා ඒ ඒ අය වෙත සුදුසු පුහුණු වීම් ලබා දීම කෙරෙහි ද අවධානය යොමු කිරීම මෙහිදී වැදගත් වේ.

5. "සතුටු සිතින් දෙන්නාට දෙවියන් වහන්සේ ප්‍රේම කරන සේක." (2 කොරින්ති 9:7) සදාචාරාත්මක ණය යුක්තියක් මෙන් සලකා දේව ජනතාව වෙත කරනු ලබන ධර්මදානයේදි සදාචාරාත්මක ණය යුතුකමක් වශයෙන් සලකා නැවත නැවතත් ඇවිලෙන ආශාව තුළින් ප්‍රීතිය ළඟා කරනු වස් ලෝක ධර්මදාන දිනය අපට ලැබෙන මහඟු අවස්ථාවක් ලෙස සැලකිය යුතුය. මෙහිදී එකිනෙක පුද්ගලයන් විසින් කරනු ලබන මූල්‍යමය ආධාර පළමුව සමිඳුන් වෙත පුද කෙරෙන පඬුරක් වන්නා සේම එය අන් අයගේ යහපත උදෙසා ද දෙනු ලබන්නකි. මෙහිදී දෙනු ලබන ද්‍රව්‍යමය ආධාර ආදරය දයාව මත ගොඩනැගුණු මිනිස් සමාජයේ ධර්මදූත කටයුතු සඳහා වනු ඇත.

මා ප්‍රියාදර සොහොයුර, සොහොයුරිය, ලෝක ධර්මදූත දිනය පවත්වන අද දවසේ මාගේ සිතුවිලි ගලා යන්නේ දේශීය සභා වෙතටයි. ධර්මදානයේ චමත්කාර ප්‍රීතිය කිසිවකු හෝ අපගෙන් සොරා නොගනිත්වා.

ඔබේ ධර්මදාන කටයුතු සහ දේව කැඳවීම් ආලෝකවත් කරන දයා ප්‍රේමයෙන් යුතුව දේව වචනයේ ප්‍රීතිය ළඟා කර ගැනීම සඳහා මම ඔබ සැමට ආරාධනා කරමි. ජේසුස් වහන්සේ සමඟ ඔබ ගිය වන්දනා ගමනකදී උන්වහන්සේ වෙත තැබූ "ප්‍රථම ප්‍රේමය" උණුසුම වැනි දෙයක් ගැන ආයෙමත් සිතා බලන ලෙස මම ඔබ එකිනෙකාගෙන් ඉල්ලා සිටිමි. නිරානුමානවම එදා ඔබේ හදවතට දැනුනේ උන්වහන්සේ සමඟ සිටීමේ ප්‍රීතිය සතුට මිස උන්වහන්සේගෙන් වෙන් වී ගෙදර බලා පැමිණීමේ රුචියක් නොවන්නේ ය. ඒ හා සමානව ස්වාමින් වහන්සේගේ ශ්‍රාවකයන් ද තම ගුරු දේවයාණන්ට සමීපව සිටියදී උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම නිසා ප්‍රීතිය ළඟා කර ගත්හ. තවද විශ්වාසය, බලාපොරොත්තුව සහ ධර්මදානීය දයාව අන්‍යයන් සමඟ බෙදා ගනිමින් මෙම ආධ්‍යාත්මික ප්‍රීතිය ළඟා කර ගැනීමෙහි නිරතව සිටියහ.

බැහැපත් නිහතමානි ප්‍රීතිදායක ධර්මදානයේ අනුරුවක් ආදර්ශයක් බඳු මරියෝත්තමාවන්ගේ මැදිහත්කමින් අප ශුද්ධවූ සභාව හැමෝම සුහදව පිළිගැනීම සඳහා සැදී පැහැදී සිටින මහ ගෙදරක් බවට පත් කරන මෙන් අයැද සිටිමු. එතුමිය අප හැමගේ මාතාවන් වන්නා සේම ලෝකය නැවතත් පුනරුත්ථාපනය කිරීමේ ඒකායන මාර්ගයද වන සේක.

**2014 ජුනි 8 ශුද්ධෝත්තම දින වතිකානයේදී ය**
**ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා**

# පරවර පිරිස කෝට්ටේ ගිහින්

කිතු සමිඳුන් ගේ ගෝල පිරිස අතුරින් තෝමස් අපෝස්තුළුවරයා ක්‍රි.ව. 52 දී දකුණු ඉන්දියාවට පැමිණි බව ඓතිහාසික සත්‍යයක් වන්නේ ය. එතුමා එහි ධර්මදූත කටයුතුවල යෙදී සිටියදී දිවයිනේ කොළඹට ද පැමිණ ඇති බව සඳහන් වී ඇත.

ක්‍රි.ව. 1 සිට 620 දක්වා වන කාලයේ ආසියාව තුළ කිතු දහම් ව්‍යාප්තිය සටහන් කර ඇති ග්‍රීක ඉතිහාසඥ නිකේෆොරෝස් කැලිස්ටෝස් සන්තපොලෝස් තම ග්‍රන්ථයේ මේ වග සඳහන් කරයි. කාණ්ඩ 16 කින් යුත් මෙම ග්‍රන්ථයේ මේ වග පැහැදිලිව සඳහන් වන්නේ ය. කොළඹ කොච්චිකඩේ ශු. අන්තෝනි දෙව්මැඳුරට ඉහළ බිමෙහි පිහිටි ජින්තුපිටියෙහි ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් නමින් ඉදිකොට ඇති කිතුනු දෙව්මැඳුරු බිම එතුමන් දහම් දෙසූ බිම් පෙදෙස ලෙස සැලැකේ.

අද දක්වාම දකුණු ඉන්දියානුවෝ ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් ඉමහත් ගෞරවයෙන් සලකති. තමන් ශු. තෝමස් මුනිවරයාණන් ගේ කිතුනුවන් යැයි පවසත්.

එදා සිට ම මෙම කිතුනු පිරිස (කතෝලික) කොළඹ, ගාල්ල වැනි වරායන් ආශ්‍රිතව සරු වෙළෙඳ ව්‍යාපාරයක් ගෙන ගිය බව සඳහන් වන්නේ ය. වෙසෙසින් ඉංගිරිසි පාලන සමය තුළ දකුණු ඉන්දියාවත් දිවයිනත් අතර වෙළෙහෙළඳාම් ඉතා දියුණු තත්ත්වයක පැවැතිණි. මෙසේ කොළඹ පිටකොටුවේ පදිංචිව සිට වෙළෙඳාමෙහි යෙදී පොහොසත් වූ පිරිස ආගම දහම කෙරෙහි ද සිත් යොමු කළෝ ය.



**යටගිය දවස**

**විශ්‍රාමික අගරදගුරු**
**අති උතුම්**
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**184**

ඉන්දියානුවන් සැටියට භාරතයේ හෙවත් පරවරුන් ලෙස ප්‍රකට වූ මොවුහු ඒ අනුව කුඩා දෙව්මැඳුරක් ඉදිකරගනු වස් නගරාසන්නයේ බිම් කොටසක් සොයා ගියහ. ඔවුන් වැඩියක් යොමු වූයේ කෝට්ටේ දෙසට යි.

මේ දෙසට ඔවුන් වඩාත් ඇලුම් කළේ තම අරමුණ ඉටු කරගනු වස් මේ පළාත වඩාත් මැනැවැයි ඔවුන් සිතූ නිසා ය. එනම් දෙව් මැඳුර ඉදිකිරීම හුදෙක් වන්දනාව සඳහාම නොව වඩාත් දහම් ප්‍රචාරය සඳහා යොදා ගැනීම ඔවුන්ගේ අදහස විය. කෝට්ටේ පෘතුගීසි පාලන කාලය තුළ විශාල කතෝලික පිරිසක් සිටි හෙයින් ඕලන්ද සමයේදී ඔවුන් අතරින් විසිර ගියවුන් යළි දහමට ළං කැර ගැනීම ගැන මෙම පරවර පිරිස සිතූහ.

මෙසේ අපේක්ෂා කළ පරවර පිරිස එම පෙදෙසේ මදටියගහවත්ත හෙවත් මාරගහවත්ත නමින් වූ අක්කර 6 කුත් පර්චස් 5 3/4 යුත් ඉඩමක් එහි විසූ ධනවත් මුදලිතුමකුගෙන් මිලදී ලබා ගත්හ. මෙහි කුඩා දෙව්මැඳුරක් ඔවුන් විසින් ම ඉදිකරන ලදි.

මෙම පරවර පිරිස ශු. තෝමස් අපෝස්තුළුවරයාණන්ට ඉමහත් ගෞරවාදරයක් දැක් වූ දකුණු ඉන්දියාවෙන් පැමිණි පිරිසක් වූ නිසා මෙහි ඉදිකරන ලද තම කුඩා දෙව්මැඳුර එතුමන් ගේ නමින් ශු. තෝමස් දෙව්මැඳුර යනුවෙන් නම් කර කැප කරන ලදි.

මෙම දෙව්මැඳුරේ මංගල්‍යය මොවුන් විසින් වාර්ෂිකව ඉතා උත්සවාකාරයෙන් පවත්වන ලදි. ඒ අවට විසූ බෞද්ධ ජනතා වද ඒ සඳහා පූර්ණ සහයෝගය දැක්වූහ. එහි විසූ බෞද්ධ නායකයකු වූ ඩී. එම්. ඩී. මාටින් මහතා මෙසේ විස්තර කැර තිබේ.

"වාර්ෂිකව පරවර පිරිස මෙම උත්සවය සඳහා මෙහි පැමිණියේ අලංකාර ලෙස සරසන ලද බර කරත්තවල යි. මේවායේ ගෝනි පුරා සම්බා හාල්, කරවල, පරිප්පු, අර්තාපල්, තුන පහ යනාදිය පටවා තිබිණි.

පෙරමුණ ගෙන පැමිණියේ බක්කි කරත්තයකි. එහි පැමිණියේ බොරැල්ල මීසම භාර ගරු පියතුමා ය. උත්සවය මෙහෙය වන ලද්දේ එතුමන් විසිනි. සියලු දෙනා පැමිණියේ මඟ දිගට යාච්ඤාවෙහි යෙදී ගීතිකා ගයමින් ය. ඇතුල්කෝට්ටේ සිට දෙව්මැඳුර දක්වා වූ මාර්ගය ඉතා අලංකාර ලොකු කුඩා කොඩි දමා සරසා තිබිණි.

දෙව්මැඳුර කරා පැමිණි විගස ඒ බඩු බාහිරාදිය ඒ අසළ විසූ පිරිස වෙත බාර කරන ලදි. වන්දනාකරු පරවර පිරිස දෙව්මැඳුර අවට කුඩාරම් ගසා ගෙන ලැගුම් ගත්හ.

මංගල කටයුතු ආරම්භ වූයේ කොඩිගස එසැවීමෙන් ය. මඟුල් බෙර හඬ මැද එය ඔසවන ලදි. ඉනික්බිති සත් දිනක් තුළ නොවාන පැවැත්විණ. මංගල දින දිව්‍ය පූජා යාගය සිදු කෙරිණ. දිව්‍ය පූජාව නිම වූ විගස ගමේ සියලු දෙනාට ම කිසිදු ආගම්, කුල යනාදී භේදයකින් තොරව, දිවා ආහාරය බෙදා දෙන ලදි.

මෙම සමය තුළ මුළු නගරයම මංගල්‍යමය ස්වරූපයක් ගනු ලැබීය. සල්පිල්, කඩ සාප්පු යනාදිය පැතිර ගොස් වලං බඩු, මැටි බඳුන්, වළලු මෙන් ම කෑම වර්ග ද බහුල විය. අච්චාරු වෙළෙඳාම ඉතා ජනප්‍රිය වූ හෙයින් කලකින් මෙය "අච්චාරු මංගල්‍යය" යැයි ද කියනු ලැබී ය.

කල් ගතවීමත් සමඟ මෙහි ඉතා කණගාටුදායක සිදුවීමක් වී තිබේ. වරක් මෙම වෙළෙඳ පරවර පිරිස මංගල්‍ය කටයුතු සූදානම් කරමින් සිටියදී එහි කඩා වැදුනු සොරු කණ්ඩායමක් මුදල් පසුම්බිය පැහැර ගන්නට තැත් කර ඇත. එය වැළැක්වීම වස් දරණ ලද ප්‍රයත්නයේදි ඇති වූ ගැටුම මැද මුදල් අත තිබූ තැනැත්තා වෙත පිහි පාරක් එල්ල කරන ලදි. එයින් හෙතෙම ජීවිතක්ෂයට පත් විය.

මේ කාලයේ ළඟම පිහිටි පොලිස් ස්ථානය බොරැල්ලේ විය. එහි ගොස් දන්වන ලද නමුත් පොලිස් භට පිරිසක් එහි සිට පා ගමනින් පැමිණ ඇත්තේ පසුදින දී ය. මොවුන් පැමිණෙන විට මුදල් පැහැරගත් සොරුන් මෙන් ම පරවර පිරිස ද යළි කවරදාකවත් කෝට්ටේට නොපැමිණෙන බවක් පවසා ගිවිස ගොස් තිබුණි.

එතැන් සිට කෝට්ටේ මංගල උත්සවය සුළුවෙන් පවත්වන ලද්දේ එහි ගම්වාසී සුළු කතෝලික පිරිස විසිනි. කලක් ගෙවී ගිය පසු කෝට්ටේ මීසම බාර ගරු පියතුමා ලෙස පත්වීම් ලබා පැමිණි සැකරියස් දබරේරා පියතුමා ගේ කාර්ය වූයේ සියල්ල යළි පණ ගැන්වීම යි.

ක්‍රි.ව. 1854 ජුනි මස 28 වැනි දින පරවර වෙළෙඳුනට හිමි ව තිබුණු දෙව්මැඳුරු භූමිය එම පිරිස නියෝජනය කළ ජුවාම් සිල්වා පේඩ්‍රෝ පුල්ලෙ මහතාණන් විසින් ගරු කජේටානෝ ඇන්ටෝනියෝ පියතුමන් වෙත පවුල් 50 ක් සහ සිලිං 10 ක මුදලකට පවරා දෙන ලදි. එතැන් සිට එම දෙව්මැඳුරු භූමිය කොළඹ අගරදගුරු හිමිපාණන් සතු විය.

මේ අනුව කෝට්ටේ ශු. තෝමස් මුනිඳුන් නමින් පිහිටා ඇති දෙව්මැඳුර කොළඹ අගරදගුරු පදවි පාලනය යටතේ මීසමක් වන්නේ ය.

**(මෙම ලිපිය සඳහා දත්ත රැසක් එල්. වී. කබ්රාල් වියතාණන් ගේ ග්‍රන්ථයකින් ලබා ගත් බව කරුණාවෙන් සලකන්න)**

කලා සංග්‍රහය

# කිතු යාත්‍රා ලේඛක සංසදයේ ප්‍රථම සාහිත උලෙළට අගැයුම් රැසක්!

බෝපිටිය පමුණුගම අර්ධ ද්වීපයේ ජීවත්වන, කතෝලික 'ඥානාර්ථ ප්‍රදීපය' පුවත්පතේ අත්දැකීම් බහුල පරිණත ලේඛක - ලේඛිකාවන් ප්‍රමුඛව පිහිටුවාගෙනැ'ති කිතු යාත්‍රා ලේඛක සංසදයේ ප්‍රථම සාහිත්‍ය කලා උලෙළ එහි ඉදිරි ගමන් මඟ පෙන්නුම් කරන කැටපතක් බඳුයි.

මෙහි ජනතාව තුළ පවතින සංහිඳියාව, අධ්‍යාත්මිකත්වය, සැනසුම අගය කටයුතුයි. මෙහිදී දොරට වැඩි ග්‍රන්ථ වලින් එහි ලේඛක - ලේඛිකාවන්ගේ ශක්තීන් හා හැකියා කුසලතා පිළිබිඹු වෙනවා. ඔවුනට අපේ ප්‍රණාමය හිමිවෙනවා.

'ඥානාර්ථ ප්‍රදීපය' ප්‍රධාන සංස්කාරක ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා එසේ පල කළේ කිතු යාත්‍රා ලේඛක සංසදයේ සාහිත්‍ය කලා මහෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වෙමිනි.

පමුණුගම මහා විද්‍යාලයීය ශාලාවේදී කලා කාමීන් 500 පමණ පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැති මෙම උළෙට සංසදයේ අනුශාසක ජා ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති



කුමාර් වැලිවිට, දැලතුර මීසම් සේවක ගරු සම්පත් තුෂාර පියතුමන් හා අනුරාධපුරය අබයගිරි විහාර වාසී පූජ්‍ය අඹගස් වැවේ රතන සාර හිමියෝ සහභාගී වූහ.

මෙහි විශේෂත්වය වූයේ සංසදයේ සාමාජික දෙදෙනෙක් හා දරුවන් දෙදෙනෙකුගේ ග්‍රන්ථ 4 ක් දොරට වැඩීමය. ශ්‍යාමලී වසන්තා සුබසිංහ ගේ 'සඳ දුරයි' (කාව්‍ය), සැම්සන් පෙරේරාගේ 'මඟුල් මුද්ද' (කෙටිකතා), පසිඳු නිර්මාල්ගේ 'සඳතරණය කළ සුදු නාගයා' (ළමා කතා) ශාක්‍ය රුදිගුගේ 'හැඳුවා ඒත් පිටසක්වල' (ළමා කතා) එම ග්‍රන්ථද විය.

බස්නාහිර පලාත් සභා මන්ත්‍රී ශිරන්ත අමරසේකර මහතාද සහභාගි විය. තේමා දේශනය ප්‍රවීන මාධ්‍යවේදී තිඹිරියාගම බංඩාරයන් විසින් පවත්වන ලද අතර සංසදයේ සභාපති නිමල් අපෝන්සු, ලේකම් ඇන්ටන් ජයසූරිය වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති ත්‍යාගරත්න අල්විස් මහත්වරුන් ඇතුළු ග්‍රන්ථ කර්තෘවරුන් සිව් දෙනාද මෙහිදී කථා කළහ. වත්තල රාජ් කලායතනය ඉදිරිපත් කරන ලද නර්තන අංග හා කීපදෙනෙකු ඉදිරිපත් කළ ගායනා වලින් උලෙළ විචිත්‍රවත් විය. සාහිත්‍ය තරගාවලියේ තිළිණ ප්‍රදානය ආරාධිත අමුත්තන් අතින් සිදුවිය.

**සටහන - : සී. ආර්. ඩික්සන් ඇන්ටනි, ජෝ. සංගපාලආරච්චි**
**සේයා - : ඒ. ජේ. ඒ. අබේනායක**

## අම්මා ඔබයි




**සම්පාදක - සිසිල් රණතුංග**
**මිළ - රු. 50/=**

පල්ලන්සේන විශෝපප දේවමාතා දෙව්මැඳුරේ 125 ජයන්ති උලෙළට සමගාමීව නිකුත් වූ අම්මා ඔබයි ගීතිකා සමුච්චය රුගත් සංයුක්ත තැටිය සඳහා අත්වැලක් සපයන්නට දෙවසරකට පසු ස්වර ප්‍රස්ථාර හා ගීපද මාලා එක්තැන් කර අම්මා ඔබයි මැයෙන් පොතක් සම්පාදනය කර තිබේ.

ගැයීම දෙවරක් යැදීමක් ලෙස කිතුනු ජනවහරේ දැක්වේ. ඒ අනුව ගීතිකාව කතෝලික ජනවන්දනාවේ අතිශය ජනප්‍රිය අංගයකි. දේවමාතාවන් තේමා කරගනිමින් මරිය වසර තුළ මෙවැනි කටයුත්තක් කිරීම ගැන සිසිල් රණතුංගයන්ට තුති පිදිය යුතුය.

කොච්චිකඩේ ශුද්ධාත්ම දෙව්මැඳුරේ විදුලි ඕගන් වාදනය, ගායනා කණ්ඩායම් සාමාජික, යුද හමුදා තූර්ය වාදක කංඩායමේ සාමාජික හා යුද හමුදා ක්‍රිස්තියානි සංගමයේ ගායනා කණ්ඩායම බාරව ලද සුවිසල් අත්දැකීම් සමුදාය මෙවන් නිර්මාණ කාර්යයකට කදිම පිටිවහලක් වී තිබෙනු දැකිය හැකිය.

## දූවේ බර්නාඩ් ශ්‍රීකාන්ත සම්මානයෙන් පිදුම් ලබයි



මී පුරයේ ඉපිද අනභිභවනීය කෘති රැසක් දේශයට දායාද කළ දූවේ බර්නාඩ් ශ්‍රීකාන්ත සාහිත්‍යධරයා ගම්පහ පළාත් පාලන සාහිත්‍ය උලෙළේදි පුරවැසි සම්මානයෙන් පිදුම් ලැබීය. පළාත්පාලන කොමසාරිස් චන්ද්‍රානි සමරකෝන් මහත්මිය මෙම සම්මානය පිරිනැමූ අතර සහකාර කොමසාරිස් සෙව්වන්දි හෙට්ටිආරච්චි මහත්මියද උත්සවයට සහභාගි වූවාය.

## දහම් පවසට දිය දහරක් වූ වන්නි මඩු පුදබිම




කිතුනු මෙන්ම වෙනත් ආගමික බැතිමතුන්ගේ නොමඳ ගෞරවයට පාත්‍ර වූ අගුණවිල වන්නි මඩු මාතා සිද්ධස්ථානය පිළිබඳව ලියැවුනු පොත් පිංචකි.

මෙහි වන්නිමඩු මාතා පුදබිම පිළිබඳව, ඉතිහාසය මෙහි සිදුවූ හාස්කම් මෙන්ම විශේෂ වරප්‍රසාද ලබා ගැනීම සඳහා වන්නිමඩු මාතාවන්ගේ යැදුම හා වන්නිමඩු ගීතිකාව මෙන්ම ශු. ජපමාල දේව මාතා ප්‍රාර්ථනාවද ඇතුළත්ය.

- **කුමර**

## වාහන සම්ප්‍රේෂණය සුක්කානම හා තිරිංග

**කර්තෘ - ජේ. එල් සුනෙත් පින්තු**
**මිළ - රු. 480/=**




මෝටර් රථ කාර්මික විද්‍යාව හා බැඳි විවිධ විෂයයන් ඉතාමත් සරල සුගම බස් වහරකින් ඉදිරිපත් කරමින් ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් නැති කොයි කාටත් උනන්දුවක් ඇතිකර ඒ වෙත ඇද ගැනීමට සමත් කතුවරයාගේ නවතම මෝටර් කාර්මික විද්‍යා ග්‍රන්ථයයි.

මීට දශක එකහමාරකට, දෙකකට පෙර ඥානාර්ථ ප්‍රදීපය ඔස්සේ මෝටර් කාර්මික විද්‍යාව ගැන ලියන්නට පටන්ගත් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයකු වන ජේ. එල්. සුනෙත් පින්තු මහතා අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරු කරගනිමින් මේ වනවිට පොත් විස්සකට වැඩි ගණනක් රචනා කර ඇත.

මෙම නවතම ග්‍රන්ථය ඔස්සේ නූතන වාහනවල සුලබ ලෙස දක්නට ලැබෙන අංගයන් හඳුන්වා දෙයි. මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ සිංහලෙන් ලියැවුණු පොත්පත් විරල සමයක කතුවරයා ඒ පිළිබඳව නිරන්තරයෙන් වෙහෙස මහන්සි වෙමින් විවිධ විෂයයන් ඔස්සේ පොත්පත් පළ කරන්නට දරණ වෑයම අගය කටයුතුය. කතුවරයාට අපෙන් සුපැතුම්! - **මෛත්‍රී**

## සිනමා නළු බොනිෆස් ප්‍රනාන්දු මහතාට උපහාර



ප්‍රවීන සිනමා නළු කලා භූෂණ බොනිෆස් ප්‍රනාන්දු මහතාට උපහාර පිණිස පවත්වන ලද උපහාර උලෙළ පහල මඩම්පැල්ල, කටුලන්ද මඩු මාතා ප්‍රජා ශාලාවේදි ඉකුත්දා පැවැත්විණි. බෝලගල ජයසුමනාරාම විහාරාධිපති පූජ්‍ය බදුල්ලේ නන්දාරාම හිමි හා මඩම්පැල්ල මීසම් සේවක ගරු ලක්නාත් කුරේ පියතුමන් ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

**සටහන - සුභාෂිණී මදුරාවල / සේයා - එච්. ඒ. කල්දේරා**

ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 281

## හිමිපාණෝ නාහිමි

ස්වාමිපාදයාණෝ හිමිපාණෝ වෙති. ස්ථවිර පාදයෝ, ආචාර්යපාදයෝ, ගුරුපාදයෝ, තෙරපාණෝ, ඇඳුරුපාණෝ ව්‍යවහාරයේය. පාද පදය ගෞරවවාචී වූයේ උතුමන්ගේ පා නැමදෙන බැවිනි.

නාහිමි නායක ස්වාමීන් වහන්සේය. මානාහිමි මහා නායක ස්වාමීන්වහන්සේය. අනුනාහිමි අනුනායක ස්වාමීන් වහන්සේය. අනුනායක නාහිමි යයි මෑතදී ප්‍රදීප මංගල්ල දැන්වීමක දිටිමි. නාහිමි යනු නායක හිමි බව නොදැන සිදුවූ වරදකි.

හිමිපාණෝ, නාහිමි, අනුනාහිමි කිතුනු වහරේ දැන් මුල් බැසගත්තද මාහිමි ගරු පදය පෙනෙන්නේ විරලවය. භාග්‍යවත් ජුසේවාස් මුනිතුමන් ලංකාවේ විකර් ජනරාල් පදවියට පත්වූ පසු මහාස්වාමි ලෙස හැඳින් වුණ බව එතුමන්ගේ ජීවිත කථාවේ සඳහන්ය.

මාහිමි, මහසාමි, මහාස්වාමි යන අභිධාන සංඝරාජ නාමයට සමානාර්ථ ගරු පද වශයෙන් අතීතයේ භාවිතවිණ. හංස සන්දේශයේ මෙයිදු මිහිඳු මාහිමියන් පැමිණි වැනි යයි අනුබුදු හිමියන්ට පවා මාහිමි බුහුමන් පදය පිරිනැමී ඇති හෙයින් මාහිමි උපාධිය හිමිපාණෝ, නාහිමි. අනුනාහිමි අභිධානවලට වඩා අග්‍රගණ්‍ය බව පැහැදිලිය.

මාහිමි මහතෙර නොවේ. මහතෙර මහාස්ථවිරයි. උපසම්පන්නවු ජ්‍යෙෂ්ඨ යතිවරු මහතෙර නම දරති. ස්ථවිර යන්නෙහි නියම අර්ථය මහල්ලාය. උතුමන්ට පිදෙන මේ ගරුතර නම් රැසකට පදනම වන ස්වාමි හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානි ආගම්වලට පොදු පූජනීය වචනයකි. බුදුනු, කිතුනු දන අතර ස්වාමි දරුවෝ හා ස්වාමීන් වහන්සේත්, හින්දු දන අතර ක්‍රිෂ්ණසාමි නාරායණසාමි, කන්දසාමි, කුමාරසාමි හා සිවසාමිත් විමසා බලන්න.

අපේ සතුරන්ගෙන් අප ගලවා දේවා, අපගේ දෙවි ස්වාමි.

## කරුණාවේ බලය




**කර්තෘ : ලූෂන් එඩ්වඩ් පෙරේරා**
**මිල : රුපියල් 150/=**

ලේක්හවුස් ආයතනයෙන් පුංචි දුවා දරුවන් වෙනුවෙන් නිකුත් කෙරෙන 'මිහිර' පුවත් පතේ සතියෙන් සතිය පුංචි දුවා දරුවන්ට ආදර්ශයක් දිය හැකි කතා මාලාවක් 'කරුණාවේ බලය' නමින් පොත් පිංචක් ලෙස පසුගියදා එළිදක්වා තිබින. පළපුරුදු ලේඛකයකු වන ලූෂන් එඩ්වඩ් පෙරේරා ශූරීන් විසින් රචිත එම ග්‍රන්ථය දැයේ දූ දරුවනට ආකර්ශනය වනසේ අලංකාර, නිර්මාණාත්මක පිටකවරයකින්ද සමන්විතය. අදවන විට පරිඝණක, ජංගම, දුරකතන, රූපවාහිනිය, ලැප්ටොප් වැනි නූතන ව්‍යසනයන් ගෙන් දැයේ දරුවන්ව මොහොතකට හෝ මුදාගෙන දහම, ධර්මය තුළ ළමයාව යහ මග යැවීමටත්, ඉහත සඳහන් දෑ මගින් කලාව, සාහිත්‍යය, සෞන්දර්යය වැනි විෂයයන්ගෙන් දුරස්වන දරුවන් තුළ ආධ්‍යාත්මික ගුණ වගාවන් ළදරු මනස තුළ ඇති කිරීම වේ. එහි කර්තෘගේ ඒකායන අරමුණය.

වන සතුන්ගේ ක්‍රියාවක් උදාහරණයට ගෙන එමගින් ඕනෑම වයස් මට්ටමක දුවෙකුට, පුතෙකුට පහසුවෙන් කියවා, වටහා ගත හැකි අන්දමින්ද, වැඩිහිටියනටද එම කතා රසකර දරු දැරියනට පහදා දිය හැකි අයුරින්ද ඉතා සරලව, තේරුම් කෙරෙන බසින් ලියා තිබීමද විශේෂත්වයකි. මෙම පොත් පිංච කියවන දුවල පුතාලගේ මනසට අපගෙන් සිදුවිය යුතු දරුවන් වෙතින් සමාජයට පිදිය යුතු, සාරධර්මයන්, යහපත් ක්‍රියාවන් ඉතාමත් සරල, කෙටි ක්‍රම අනුගමනය කරමින් ඉදිරිපත් කිරීමද කර්තෘගේ විශේෂත්වයකි. දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද අගනා උපදෙස් සහිතව එළිදක්වා ඇති මෙම පොත් පිංච තුළින් දහමට, රටට, සමාජයට හිතැති දරුපරපුරක් දැයට දායාද කරනට කර්තෘ ගත් තැත සාර්ථක වී ඇත.

මෙවන් අගනා සාහිත්‍ය පොත් තව තවත් එළිදක්වන්නට ලූෂන් එඩ්වඩ් පෙරේරා නම්වූ සුන්දර මිනිසාට තව තවත් දෙව් අසිරිය ලැබේවා.

**වැලිවිට එම්. ජෝ පාරිස්**



# 'තෙරේසා මව' නමැති විශ්ව විද්‍යාල පීඨය ඉවත් කැරේ

ගාන්ධි ජාතික විවෘත විශ්ව විද්‍යාලයේ 'තෙරේසා මව' නම් පීඨය පිහිටුවනු ලැබුවේ, වර්ෂ 2010 දීය; එම අදහස ඉදිරිපත් කරනු ලැබුවේ, හිටපු අගමැති මන්මෝහන් සිං මහතා විසිනි.

එලෙසින් එම විශ්ව විද්‍යාල පීඨය පිහිටුවනු ලැබුවේ, තෙරේසා මව් තුමියගේ 100 වැනි උපන් දිනය සමරා එතුමියට ගෞරව කිරීම සඳහාය; එහෙත් මෑතදී තෙරේසා මව් නම් ලත් පීඨය මෙන්මැ තවත් නම් ලත් පීඨයන් කීපයක් විශ්ව විද්‍යාල වලින් ඉවත් කරනු ලැබීමට පියවර ගෙන ඇත්තේ, පීඨ හා බැඳි මුදල් වියදම් තත්ත්වයක් කපා හැරීමට යයි ප්‍රකාශ වේ. එහෙත් පරෝපාකාර සේවයෙන් ඉන්දියාව ජගත් කීර්තියට පත් කළ තෙරේසා මවගේ නමින් යුත් විශ්ව විද්‍යාල පීඨය ඉවත් කරනු ලැබීම කෙරෙහි ඉන්දීය කිතුනු ජනතාව මෙන්මැ තවත් බොහෝ මධ්‍යස්ථ මතධාරි ඉන්දියානුවෝ ද ශෝකයටත් කළ කිරීමටත් පත්ව සිටිති.

# ඉරාක පූජක දිවි ගැළවුමට ඇදැහිලි වන්තයන් අතහැර නොයයි

ඉරාක ජාතික ගර්වාන් යුසිෆ් බාහෝ පියතුමා දැනටමත් ඉස්ලාම් දේශය ලෙසින් ප්‍රකාශිත ප්‍රදේශයකට ආසන්න අල්ගෝස් නම් කුඩා නගරයේ මීසමක සේවය කරයි.

එම ප්‍රදේශය ද කොයි මොහොතේ ඉස්ලාම් රාජ්‍යයට ඈඳ ගනීවිදෝ යන බියද පවතී. බාහෝ පියතුමා සිය මීසමේ ඇදැහිලි වන්තයන්ගේ ආගමික අවැසිතාවන් නොපිරිහෙලා ඉටු කරනා අතර, රෝමයේ පොන්ටිෆිලේ විශ්ව විද්‍යාලයේ ආරාධිත කතිකාචාර්ය වරයෙක් වශයෙන් ද ක්‍රියා කරයි; ඒ සඳහා එතුමා කාල සටහනක් අනුව රෝමයට ද පැමිණෙයි.

ඉරාකයේ පවත්නා අනාරක්ෂිත තත්ත්වය අනුව, ඉරාකය අතහැර රෝමයට යාම සඳහා ඔහු බොහෝ වාරයක් පෙළඹීමට ලක්වූ බැව් ද ඔහු විසින් පවසා ඇත.

ඒ අතර තුරේදී රෝම බලධාරීන් විසින් ඔහු වෙත ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, සැමදා රෝමයේ වාසය කිරීමට අවකාශය සළසා දිය හැකි බවයි; එහෙත් එම ආරාධනාව ඔහු විසින් පිළිගෙන නැත්තේ, පීඩා විඳින ඔහුගේ මීසමේ ජනයා අත්හැර නොයෑමට ඔහු නොවෙනස් තීරණයකට එළැඹ සිටිනා නිසාය.

"මම කිසිදා මගේ ඇදැහිලි වන්තයන් අත්හැර නොයමි." මෙලෙසින් ඔහු අවධාරණයෙන් ප්‍රකාශ කොට තිබේ. පියතුමාගේ අවසන් තීරණය දැනගත් මීසම් වැසියෝ කඳුළු පිරි දෙනෙතින් පියතුමාට ආචාර කළ බැව් කිතුනු පුවත් වාර්තා කරයි.

# නේපාලයේ රදගුරු තුමෝ දෛනික ජපමාල උච්චාරණය ඉල්ලති



බෙහෙවින්මැ හින්දු රාජ්‍යයක් වන නේපාලයේ වෙසෙන සුළුතර කතෝලිකයන්ගේ අධ්‍යාත්මික මඟ පෙන්වීම භාරව ක්‍රියා කරනු ලබන්නේ, රදගුරු පෝල් ස්මිත් තුමාය. පසුගිය සතියේ කතෝලික පවුල් වෙතැ එතුමා විසින් ඉල්ලීමක් කරනු ලැබුවේ, දිනපතා මුළු පවුලම එකතු වී ජපමාලය උච්චාරණය කරනා ලෙසටයි.

රදගුරු තුමා නේපාලයේ සැම කතෝලික පවුලක් වෙතද ඉදිරිපත් කරන ලද ලිපියේ මෙලෙසින් දක්වා තිබිණි. 'ඔක්තෝබර් මාසයේදී නේපාල දේශය පුරා මංගල්‍ය ගණනාවක් පවත්වනු ලබයි. මංගල්‍ය හයක් ජාතික මට්ටමින් මහා ඉහළින් පවත්වනු ලැබේ; කතෝලික අපද ඔක්තෝබර් මාසය පුරා ජපමාලයේ කන්‍යාමරිය තුමියගේ මංගල්‍යද පවත්වන්නෙමු; මරිය තුමියගේ එම මංගල්‍යයේ විශේෂත්වය වන්නේ සැම කතෝලික පවුලක්මැ එකට රැස් වී සිය ගෘහය තුළ ජපමාලය උච්චාරණය කිරීමයි.' එතුමා විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ජපමාලය උච්චාරණය කිරීම තුළින් දේව මාතාවන්ගේ මැදිහත් බවින්, අප සියලු දෙනා පුද්ගලයන් ද, පවුල් ද, සමාජය ද, දේශය ද වශයෙන් අත්දකිනා ප්‍රශ්න හා බැරි භාවයන් ජය ගත හැකි බවයි.

# දෙමසකදී නයිජීරියාවේ දෙව් මැඳුරු 185 ක් නිවාස 20,000 විනාශයි

පසුගිය දෙමසක කාලය තුළදී, නයිජීරියාවේ 'බොකෝ හරාම්' නමැති අති දරුණු ත්‍රස්ත කණ්ඩායම විසින්, උතුරු කරයේ පමණක් දෙව් මැඳුරු 185 ක් ගිනි බත් කොට, 20,000 වැඩි කිතුනුවන් සංඛ්‍යාවකගේ ගේදොර විනාශ කොට ඇතැයි, කතෝලික පුවත් වාර්තා කරයි. මෙම කිතුනුවන් ජීවත් වූ ප්‍රදේශයෙන් පලා ගොස් හිත මිත්‍රාදීන්ගේ නිවෙස් වලැ තාවකාලිකව ජීවත්වන බැව් ද වාර්තා වේ.

ඊයේ පෙරේදා මෙම විනාශය උතුරු නයිජීරියාවේ වයිදුගුරි නම් කතෝලික පදවිය පුරා සිදුවී ඇත. මෙම තොරතුරු ජාත්‍යන්තර මාධ්‍ය වෙතැ ප්‍රකාශ කරනු ලැබුවේ, යම්තම් දිවි ගළවාගෙන සිටිනා ගිඩෝන් ඔබාසොගී පියතුමාය. තවදුරටත් එතුමා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ, නයිජීරියාවේ උතුරු කරයේ නගර 11 ක් දැනටමත් එම ත්‍රස්ත කණ්ඩායම විසින් සිය ග්‍රහණයට ගෙන ඇති බවයි; ඒ නගරවලැ වෙසෙන කිතුනුවන්ගේ ජීවිත බොහෝමයක් දැනටමත් විනාශ වී ඇතැයි ද වාර්තා වී ඇත.

# තුන් වසරක සිර දඬුවමින් පසු දහම් සේවක නිදහස් කැරේ

වියට්නාම් රජයට එරෙහිව ජනතාව දැනුම්වත් කිරීමේ චෝදනාව මත අන්තෝනි ඩෝ වැන් ඩූඩං නම් කතෝලික දහම් සේවකයා කිසිදු නඩු විභාගයකින් තොරව සිරගත කොට තිබිණි. එසේ තුන් වසරක් ගත කිරීමෙන් පසුව පසුගිය සතියේ බලාපොරොත්තු නොවූ පරිදි ඔහු නිදහස් කර ඇත.

ඔහු එසේ නිදහස් කරනු ලැබුවත්, සිර කූඩුවේ ගත කළ කාලය විසින් ඔහුගේ ජීවිත කාලයද කෙටි කරනු ලැබ ඇතැයි ද වාර්තා වේ. මන්ද එම තුන් වසරක කාල පරාසයේදී, ඔහු වින්ද ශාරීරික දුක් කන්දරාව වදනින් කියා නිම කරන්නට බැරි යයි ද ඔහු ප්‍රකාශ කරයි. සම කාලීන සිර කරුවන්ගෙන් ද ආරක්ෂක බළධාරින්ගෙන් ද ඔහු නිරන්තරයෙන් පහර කෑවේය. ඔහු අත් දුටුවේ දේව කරුණාව හා සවිය පමණයි යයි ඔහු දැන් සාක්ෂි දරයි. තමන් ජීවත් වන්නේ, හාස් කමකින් යයි ඔහු ප්‍රකාශ කරයි; එහෙත් තවදුරටත් දහම් සේවාවේ නිරත වන බවද ප්‍රකාශ කරයි.

# වහල් භාවය දිළිඳු රටවලට පමණක් සීමා නොවේ

ජිනීවා හී එක්සත් ජාතීන්ගේ සංගමයේ ශුද්ධාසන නිත්‍ය නියෝජිත සිල්වානෝ තොමාසි රදගුරු හිමිපාණෝ, මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කවුන්සලයේදී ලොවැ පවත්නා වහල් භාවය පිළිබඳව සිය අදහස් පළ කළ සේක.



අන්තවාදී ආගමික කණ්ඩායම් විසින් කාන්තාවන් පැහැරගෙන ගොස් වහලියන් සේ ඔවුන් සිය කාමුක අතවරයන්ට භාජනය කරනා අයුරු එතුමන් විසින් පෙන්වා දෙනු ලැබීය. නයිජීරියාව වැනි රටවලැ පාසල් දරුවන් පවා පැහැර ගෙන ගොස්, ඔවුන් සටනෙහි පුහුණු කරවා මිනිස් ඝාතනයන් කරනා බැව් එතුමා සංඛ්‍යා ලේඛන සහිතව පෙන්වා දුන් සේක. නයිජිරියාව විසින් පමණක් දරුවන් 250,000 කට වැඩි සංඛ්‍යාවක් පැහැර ගැනීමෙන් පසුව යුද්ධයේ නිරත කරවා ඇතැයි ද පෙන්වා දෙන ලදී.

එහෙත් වහල් භාවය මෙවැනි දේට පමණක් සීමා වී නොමැති බැව් ද එතුමන් විසින් හෙළි දක්වනු ලැබීය. බලහත්කාරයෙන් විවාහ බන්ධනයට ඇතුළත් කිරීම, දරුවන් අති දුෂ්කර වැඩෙහි බලහත්කාරයෙන් නිරත කරවීම, කුල භේදයන් මත කුල හීනයන් යැයි පැවැසෙන දනා සමාජයේ කොන් කර දැමීම ආදී ක්‍රියාදාමයන් ඔස්සේ, විවිධ ජන කොටස් ඊනියා බලවතුන් විසින් වහල් භාවයෙන් සිය ප්‍රයෝජනයට යොදා ගන්නා අයුරු ද අගරදගුරු හිමිපාණන් විසින් මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කවුන්සලය වෙතැ ඉදිරිපත් කළේ. මෙම මිනිස් වහල් භාවය තුරන් කරවීමට, වහා ක්‍රියාමාර්ග යන් දියත් කැරුමට කැපැවුණු පිරිසක් පත් කළ යුතු යැයි අවධාරණය කරමිනි.

# ඊජිප්තුවේ කොප්ටික් කිතුනුවන් දිගින් දිගට පැහැර ගැනේ

ඊජිප්තුවේ කොප්ටික් කිතුනුවන් නිරන්තරයෙන් පැහැර ගනු ලබනා බැව් ඔතොඩොක්ස් හා කතෝලික සභා නායකයෝ කිතුනු පුවත් වලට වාර්තා කරති.

ඔවුන් පැහැරගෙන ගොස් කිතුනු දහම අත් හැරීමට බලකරනා අතර එය සිදු නොවන කල්හී, මරණයට පාත්‍ර කැරෙනා බැව් ද වාර්තා වේ. මෑතදී සොරා ගනු ලැබූ, කිතුනු දන්ත වෛද්‍ය වරයකු මරා දමා තිබිණි; එවන් ඝාතනයන් මගින්, කිතුනුවන් බිය වද්දමින් කිතුනු ආගම අත්හැරීමට කටයුතු කරනා අතර, එසේ සිදු නොවෙද්දී, තව තවත් පැහැර ගැනීම් කැරෙනා බැව් ද කිතුනු පුවත් වාර්තා කරයි.

ඊජිප්තුවේ පවත්නා මෙම කිතුනු පීඩනය පිළිබඳ කොප්ටික් සභාවේ කමාල් විලියම් කොප්ටික් රදගුරු හිමිපාණෝ මෙලෙසින් පවසත්; 'පැහැර ගැනීම් දිගින් දිගට සිදු වූවත්, එය නවතාලීමේ ස්ථිරසාර ක්‍රියාමාර්ගයන් බළධාරින් විසින් ඉදිරිපත් කොට නැත; පොලීසිය ද සිය කාර්යයන් ඉටු කිරීමේදී මන්දගාමීය; ඒ අනුව පැහැර ගැනීම් බරපතළ තත්ත්වයක පවතී.'

# මධ්‍ය කාලීන යුගයේ දෙව් මැඳුරක් විනාශ කැරේ

ඉස්ලාම් දේශයයි (IS) පවසනු ලබන ඉරාකයේ උතුරු මැද ප්‍රදේශයේ 'ටික්රිට්' නම් නගරයක් වේ. එම ඓතිහාසිගත නගරයේ කලින් 260,000 ක් පමණ ජනතාවක් ජීවත් වූහ. ඉරාක ත්‍රස්තයන්ගේ විනාශකාරී ක්‍රියාකාරීත්වය හමුවේ, ඉන් බොහෝදෙනා මරණයට පත්ව තවත් පිරිස් ඒ ඒ ප්‍රදේශයන් අතහැර දමා ගොස් ඇත.

එම කොටස් වලින් වැඩි පිරිසක් කිතුනුවන් යැයි ප්‍රකාශිතය. එම ජනතාවන් පමණක් නොව, ක්‍රිස්තියානිය හා ඇදැහිල්ල පිළිබඳ සංස්කෘතීන් අගයන ලෝක ජනතාවන්ද සංතාපයට පත් කරමින්, වසර 1300 ක් ඉපැරණි දෙව් මැඳුරක් කඩා බිඳ දමා පොළවට සමතලා කර ඇතැයි වාර්තා වේ. එම දෙව් මැඳුර තුළ කිතුනු සංස්කෘතික වස්තූන් සුරැකිව තබා තුබු බැව් ද හෙළි දක්වා ඇත. ඉරාකය විසින් ප්‍රකාශ කැරෙනි (IS) නොහොත් 'ඉස්ලාම් රාජ්‍ය' සංකල්පය ලෝ වටා ක්‍රියාත්මක කිරීමේ තවත් එක සළකුණක් ලෙසින් ඔවුන් විසින් හුවා දක්වා ඇතැයි ද ප්‍රකාශ කරත.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# මනෝ උපදේශනය තුළින් සාර්ථක හෙටක්



වර්තමාන සමාජයේ ජීවත්වන සියලු දෙනා බොහෝ කාර්ය බහුලයි. කඳු, හෙල්, ගස් අතරින් එන හිරු එළිය මහ පොළොව සිපගන්නටත් පෙර අවදි වන බොහෝ දෙනා මළ හිරු ද බැස යන තෙක් විවිධ රාජකාරි වල යෙදෙති.

පාසල් යන දරුවාගේ සිට රැකියාවට යන වැඩිහිටියා දක්වා සියලු දෙනා එදිනෙදා වැඩකටයුතු නිම කිරීමෙහිලා දැඩි වෙහෙසක් දරති. මහපාරේ වැඩ කරන කම්කරුවා මෙන්ම සීතල කාමරයක වැඩ කරන විධායක නිළධාරියා ද ශාරීරික වෙහෙසට පත්වේ. වෙහෙස නිවාගන්නට සමහරෙක් හොඳ කෑම වේලක් පිළියෙල කරගනියි. තවත් සමහරෙක් මධුවිත, දුම්පානය, සූදුව සොයා යයි.

දීර්ඝ කාලීනව මෙවන් ක්‍රියාවල යෙදීම විනාශය කරා යන අනාගතයකට පෙර නිමිති කියාපායි. විවිධාකාරයෙන් ශාරීරික විඩාව පහකර ගත්තද එවන් කෙටි මාර්ග වලින් ලැබෙන සුවයෙහි තාවකාලික බව බොහෝ විට බහුතරයක් වටහා ගනියි. එනමුදු එවැනි ක්‍රියාවලින් මිදීමට නොහැකි වන්නේ තම ක්‍රියාවන් වලින් මනස පාලනය කරන බැවිනි. මෙවැනි තත්වයන් හේතු කරගෙන වැඩිහිටියන්, දරුවන්, තරුණ තරුණියන් විශාද තත්වයන් කරා ඇද දමයි.

කල්යත්ම සිදුවන්නේ බොහෝ දෙනා නොදන්නා හේතූන් මත රෝගාතුර වීමයි; ශරීර අභ්‍යන්තරයේ ඇතිවන අහිතකර රසායනිකයන් හේතුකර ගෙන සිදුවන විපර්යාසයන් නිසා, අධික ලෙස කෝපයට පත්වීම (කෝපයට පත්වන සෑම අවස්ථාවකදීම ශරීර අභ්‍යන්තරයේ හටගන්නා කෝටිසෝල් සාන්ද්‍රණය ශරීරයට බෙහෙවින් අහිතකරයි) තද හිසරදය, දියවැඩියා රෝග තත්වයන් හා අධික රුධිර පීඩනය, මතක ශක්තිය දුර්වල වීම, ජීර්ණ පද්ධතියෙහි සිදුවන අක්‍රමිකතා මෙන්ම කලහකාරී මනසක් ඇතිවීම දැක්විය හැක.

මෙවැනි තත්වයන් පාදක කරගෙන එදිනෙදා වැඩ කටයුතු වලදී එකිනෙකා තුළ මානසික ශක්තිය බිඳ වැටීමක් සිදුවෙයි. මෙම තත්වය ආතති (Stress) තත්වයක් ලෙස දැක්විය හැක. මනෝ විද්‍යාත්මක දත්තයන්ට අනුව වර්තමානයේ 25% ක් (සෑම හතර දෙනෙකුගෙන් එක් අයකු) මානසික රෝග වලට ගොදුරු වෙයි. එම නිසා මනෝ උපදේශනය වර්තමාන සමාජයේ අවශ්‍යතාවයක් ලෙස දැක්විය හැක. මානසික විඩාව නිසා හට ගන්නා ආතති තත්වයන් හේතු කරගෙන පවුලේ සාමාජිකයන් තුළම අවිශ්වාසය පිළිනොගැනීම වැනි දේ සිදුවෙයි. එවිට පවුලේ සමගිය බිඳ වැටෙයි. එකිනෙකා විවිධ වැරදි වලට යොමු වෙයි.

මෙසේ ශාරීරික මෙන්ම මානසිකව බිඳ වැටෙන බොහෝ දෙනා තුළ තම ආගමික විශ්වාසය පවා ක්‍රමයෙන් දුර්වල වෙයි. දෙවියන්ට පවා දොස් තබයි. එයට හේතුව මානසික දුබලකම් ඇති කල තම යාච්ඤාවේ ප්‍රතිඵල ප්‍රමාද වේ. නැතහොත් ප්‍රතිඵල දැරීමක් සිදු නොවෙයි. මානසික සුවතාව නැතිකල, රෝග තත්වයන් පාලනය කිරීමෙහිලා දැඩි වෙහෙසක් දරන්නට සිදුවෙයි. ආර්ථික පරිහානිය ඇතිවේ.

මෙවැනි තත්වයන් ඇති වුවද ඒවා පාලනය කර ගැනීම මෙන්ම ඒවායින් මිදීමේ මනෝ විද්‍යාත්මක ක්‍රමෝපායන්ද තිබේ. අධ්‍යාත්මික ශක්තිය වර්ධනය කිරීමෙහිලා විවිධ භාවනා ක්‍රම සහ රෝග තත්වයන්ගෙන් මිදීමට සහ පාලනයට ශාරීරික අංග හැසිරවීම සහ චිත්තවේග පාලනය තුළ අරමුණු ඉෂ්ටකර ගැනීම වැනි ක්‍රමෝපායන් ද ඇති අතර ඒවා ක්‍රමානුකූලව සහ නිවැරදිව ඉගෙනීම තුළින් ජීවිතය ජය ගත හැක.

පෞරුෂ වර්ධනය, මතක ශක්තිය, සහ නිරවුල් මනසක් ඇති කර ගැනීම තුළින් සතුට සෞභාග්‍ය ළඟා කර ගත හැක. වර්තමානයේ සෑම අයකුම තම ගමන් මග පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලයකි. ඔබගේ දේවස්ථානයේ, පාසලේ එමෙන් ම රාජකාරී කරන ආයතනයේ සේවක අභිප්‍රේරණය ඇතිකර ඵලදායීතාව වැඩිකර ගැනීම සඳහා වැඩසටහන් පිළියෙල කිරීමට කාලය පැමිණ ඇත.

පැහැදිලි සහ නිරවුල් මනසකින් යුතුව ඔබේ සාධාරණ ඉල්ලීම් දෙවිඳුන් ඉදිරියෙහි තබන්න. ඔබ මවිත කරමින් ඒවා ඉටුවනවා නිසැකයි.

**මනෝ උපදේශක**
**රොෂාන් බොතේජු**
**071-7769262, 011-2910974**
roshanindikahb@gmail.com

## පැලේ කවිය



එකම පුරවරේ සුපතල දෙදෙනෙක් ය | අනේ අපේ මල් වන් මල් දරු කැකුළු
රටම හිනස්සා දැන් බලු පොරයක් ය | පරෙවි රෑනකි යන එන පා මුකුළු
නහයක් පොවන්නට බැරි කුණු කන්දක් ය | සිනහ සපිරි වන පුරවා ලේ කඳුළු
මේවා අපේකම වනසන උගුලක් ය | කළා විපත් 'වග වලසුන් කොටි සළෙළු'

ඉස්සර මෙවන් දේ තිබුනද සොයනු වටි | අදහන ආගමක් දහමක් කෝ මුන්ට
දෙපිලම වාසියට කොටවන නරින් දිටි | ලේ රහ පමණි ඇත්තේ නිති සැන සෙන්ට
දැන දැන අනුන් හාන මඩ වළට වැටි | අයියෝ දහම් දීපේ නම රැක ගන්ට
මේ දෙදෙනාම අග මුල පටලවා සිටි | බැරිනම් එපා සුදු සිල් රෙදි පොරවන්ට

රාළ මීගමුවේ

# නූතන සමාජ අභියෝග හමුවේ කිතුනු ජීවිතය කොයිබට ද?

**පසුගිය සතියෙන්...**

**ආගමික වශයෙන් ද කිතුනු ජීවිතයට අභියෝග එල්ල නොවන්නේ නොවේ. ආගමික වත් පිළිවෙත් හා පිළිපැදිය යුතු ඇතැම් දේ එකිනෙකාට අවශ්‍ය ආකාරයට වෙනස් කිරීම හා වෙනස් වන්නට ඉඩ දී සභාව නිහඬ වීම ද ඇතැම් සැදැහැතියන්ගේ කුකුසට හේතු වෙයි.**

ඇතැම් විට ජනවන්දනා පිළිවෙත ද හැල්ලුවට ලක් කෙරෙමින් දේවස්ථාන තුළ කෙරෙන සමහර දේ අනුමත කළ නොහැකිය. බාහිර වත් පිළිවෙත් හා පිළිපැදිය යුතු සාරධර්ම ලිහිල් කිරීම නිසා ද දෙවිඳුන් කෙරෙහි වූ ගෞරවය හා භක්තිය කෙමෙන් කෙමෙන් ගිලිහී යන්නට පටන් ගෙන තිබීම ද කණගාටුවට කරුණකි. මූලධර්මවාදීන්ගේ මුලා කිරීම් හා වැරදි ඉගැන්වීම් නිසාද කිතු දහම අතහැර ගියවුන් බොහෝ වෙති. එමෙන්ම ලොව පුරා පැතිර ඇති අන්‍යාගමික අන්තවාදීන්ගේ හිරිහැර හා තාඩන පීඩන කිතුනු ඇදහිල්ලට එල්ල කරන්නේ විශාල බලපෑමකි. අලුයට ගිනි පුපුරු සේ අප රටේ ද කිතුනුවනට බලපෑම් හා අභියෝග එල්ල නොවන්නේ නොවේ.

කිතුනු ජීවිතය ලෝක ස්වභාවයට අභියෝග යක් විය යුතුය යන්න ශු. පාවුළු තුමන්ගේ ඉගැන්වීම සත්‍යයකි. අප එසේ විය යුතුය. අද නූතන සමාජ අභියෝග හමුවේ කිතුනු ජීවිතය සසල වීමට ඇති ඉඩකඩ බොහෝ දුරට වැඩි වී ඇත. එහෙත් කුමන අභියෝග හා බලපෑම් තිබුණද විශ්වාසයේ ස්ථිරව පැවතීම ම මෙම අභියෝග යන් ජයගැනීමේ එකම මාර්ගය බව අපි පිළිගත යුතුය. ශු. බයිබලයේ පරණ ගිවිසුම තුළ වූ ප්‍රබල චරිත මෙන්ම ඊශ්‍රායෙල් ජනයා ද ඒක දේව වාදය තුළ තම ඇදහිල්ල හා විශ්වාසය ශක්තිමත් කරගත් බව අප දනිමු. එමෙන්ම නව ගිවිසුම තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධවූ ජීවිතය හා එම දැහැමි මඟ අනුගමනය කළ ශුද්ධවර චරිත හාවර්තමානයේ ජීවත්වන සැදැහැවතුන් වෙත ද මෙම සමාජ අභියෝග එල්ල වූවාක් මෙන්ම එල්ල වීමට ඇති ඉඩකඩ හා වෙනස් විය හැකි පරිසර තත්ත්වයන් බොහෝ වැඩිය. කෙසේ වුවද අප විශ්වාසයේ ප්‍රබල සාක්ෂිකරුවන් විය යුතුය. ශු. බයිබලයේ පුරාණ ගිවිසුම මෙන්ම නව ගිවිසුම තුළ වූ බොහෝ චරිත එම කාල වකවානුව තුළ පැවති සමාජ අභියෝගයන්ට මුහුණ දෙමින් විශ්වාසයේ සාක්ෂිකරුවන් ලෙස තම ජීවිත ගත කළ බව අපි දනිමු. අප ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේද එදා පැවති ජුදා ආගමික අභියෝග හමුවේ තම ජීවිතය ගත කළා පමණක් නොව දෙවි පිය කැමැත්තට යටත්ව සකල මනුෂ්‍යයන්වම පාපයෙන් ගලවා ගැනීමේ උත්තරීතර පූජාවට ද යොමු වෙමින් ප්‍රාණය පූජා කළ සේක. තම කර මත තැබූ කුරුසය ද ඔවුන් වහන්සේ අභියෝගයක් කර නොගත් සේක. ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කළ ශ්‍රාවක සාන්තුවර සාන්තුවරියන් ද ඔවුන් වහන්සේ අනුව යමින් තම ජීවිත අභියෝගය ජය ගත්හ.

එහෙයින් තමන් ජීවත්වන කුමන පරිසරයක හෝ කුමන සමාජ තලයක හෝ කුමන කාල වකවානුවක හෝ ඇතිවන බලපෑම් හෝ අභියෝග ජයගැනීමට, ඒවාට මුහුණ දීමට ශක්තිය හා ධෛර්යය මෙන්ම ආත්ම විශ්වාසය ද ලබා ගත හැක්කේ දෙවිඳුන් කෙරෙහි වූ අචල විශ්වාසය තුළින් ය.

✍ **රංජිත් නෝනිස්**
නාගොඩ

# ඉස්ලාමීය මූලධර්මවාදය පරාජය කිරීම සඳහා සමස්ත ලෝකයම ඒකරාශී විය යුතුය

**පසුගිය සතියෙන්**

ඉස්ලාමීය මූලධර්මවාදය තීරණාත්මකව පරාජය කිරීමට සමස්ත ලෝකයම එකට ඒකරාශී විය යුතුය.

ඉස්ලාමීය මූලධර්මවාදීන් විසින් කරනු ලබන මානව විරෝධී, තිරිසන්, ම්ලේච්ඡ, ලේ පිපාසිත, හිංසාකාරී, පීඩාකාරී, අහස පොළොව නුහුලන, භීෂණ ක්‍රියාවන් තීරණාත්මකව සහ නිශ්චිත ලෙස පරාජය කිරීම සඳහා සාමය අගය කරන සෑම මුස්ලිම් බැතිමතෙක්ම, බෞද්ධයෙක්ම, හින්දුවරයෙක්ම, කිතුනුවෙක්ම, මාක්ස්වාදියෙක්ම, අදේව වාදියෙක්ම එකට එකමුතු විය යුතු වේ.

එමෙන්ම ඉස්ලාමීය මූලධර්මවාදයට විසඳුම බෞද්ධ මූලධර්මවාදය හෝ හින්දු මූලධර්මවාදය හෝ ක්‍රිස්තියානි මූලධර්මවාදය හෝ මාක්ස්වාදී මූලධර්ම වාදය හෝ අදේවවාදී මූලධර්ම වාදය හෝ නොවේ. එක් අන්දමක මූලධර්මවාදයක් තවත් අන්දමක මූලධර්මවාදයකින් පරාජය කළ නොහැකිය.

සෑම ආකාරයකම මූලධර්මවාදී ප්‍රවනතාවයක් මානව විරෝධී වේ. මූලධර්මවාදී ප්‍රවනතාවයන් මගින් නිරෝගී ආධ්‍යාත්මිකත්වයක් මානව වාදී වටිනාකම් සමූහයක් පිළිබිඹු නොවේ. මූලධර්මවාදීන් මානසික රෝගීන්ය. වෛරයෙන්, පළිගැනීමේ චේතනාවෙන්, කුහකකමින්, ද්වේෂයෙන්,



මෝහයෙන්, ඊර්ෂ්‍යාවෙන් පිරුණු පුද්ගලයන් ය. ඔවුන් සමස්ත මානව සංහතයටම සාපයක් වී ඇත්තේ ඒ නිසාය. සෑම මූලධර්මවාදී බලවේග යක්ම දේව විරෝධී බලවේගයන් ය. එම නිසාම මානව විරෝධී බලවේගයක් ය.

පීඩනය, හිංසාකාරිත්වය, භීෂණය, කොන්කිරීම අධික වන තරමට අන්‍යයන්ට ආදරය කිරීමට සේවය කිරීමට ලැබෙන අවස්ථාවද අධික වේ. තම පීඩකයාට ආදරය කරන, සේවය කරන පීඩිතයා ශ්‍රේෂ්ඨ, උදාර, වීරෝදාර පුද්ගලයෙකි. දෙවියන් වහන්සේගේ සැබෑ නියෝජිතයෙකි. දෙවියන් වහන්සේ පිළිබඳව නිවැරදි අවබෝධයක් ඇත්තේ ඔවුන්ට පමණය.

දෙවියන් වහන්සේගේ නාමයෙන් අහිංසක මිනිසුන් ඝාතනය කරන්නා, අහිංසක මිනිසුන්ට පීඩා කරන්නා දෙවියන් වහන්සේගේ පරම සතුරෙකි. එවැනි පුද්ගලයෙක් සාතන්ගේ නියෝජිතයෙකි. සාතන්ගේ මිතුරෙකි. දෙවියන් වහන්සේගේ උතුම් නමට නිගරු කරන්නෙකි. එවැන්නෙකුගෙන් උන්වහන්සේව මහිමයට පත් කිරීම සඳහා කිසිදු දායකත්වයක් සිදු වන්නේ නැත. එවැනි පුද්ගලයෙක් දෙවියන් වහන්සේගේ සැලැස්මට එරෙහිව යන පුද්ගලයෙකි. සෑම හිංසාකාරී, පීඩාකාරී තත්ත්වයක්ම දෙවියන් වහන්සේට තව තවත් සමීප වීම සඳහා ඇති අවස්ථාවකි. උන්වහන්සේ මත පමණක් යැපීම සඳහා අපගේ සර්ව සම්පූර්ණ විශ්වාසය උන්වහන්සේ මත පමණක් තැබීම සඳහා අවස්ථාවකි. සෑම පීඩාකාරී අවස්ථාවක්ම ජේසුස් වහන්සේගේ දුක් විඳීම සහ කුරුසිය අපටත් අත්දැකීම සඳහා ඇති අවස්ථාවකි.

වර්තමානයේ ලෝකය පුරාම සිදුවෙමින් පවතින සෑම කිතුනු විරෝධී හිංසනයක්ම ක්‍රිස්තු විරෝධී පුද්ගලයන්ට ආදරය කිරීම සඳහා ඇති අවස්ථාවකි. අවසාන විග්‍රහයේ දී, මූලධර්මවාදය පරාජය කළ හැක්කේ ආදරයේ බලයෙනි.

පීඩකයාට ආදරය කරන පීඩිතයා විජයග්‍රාහී පීඩිතයෙකි. එම නිසාම පීඩකයා පරාජයට පත් වී ඇත. පීඩකයා වියරුවෙන් මෙන් කටයුතු කරන්නේ ඔහු අනිවාර්යයෙන්ම පරාජයට පත් වී ඇති බව ඔහුට අවබෝධ වී ඇති නිසාය. පරාජයට පත් වූ මිනිසා වියරු වැටුනු මිනිසෙකි.

☛ ලබන සතියට

✍ **මහාචාර්ය**
**ඇන්ටන් මීමන**

# හතලිස් වසරක් සපිරූ මරිය වන්දනය පිළිබඳ එඬේරීය උපදේශනය

දේව මාතාවන් වෙත දක්වන භක්තිය කෙසේ විය යුතුද යන්න විස්තරාත්මකව විශ්ලේෂණය කොට දක්වන අතිඋතුම් හයවන පාවුළු ශුද්ධෝත්තම පියාණන්ගේ 'මරියාලිස් කුල්ටුස්' (Marialis cultus) හෙවත් 'මරිය වන්දනය' නමැති එඬේරිය උපදේශනය ප්‍රකාශයට පත්කොට 2014 පෙබරවාරි මස 02 දිනට හතලිස් වසරක් පිරිණි.

එය දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් මරියතුමිය පිළිබඳව කළ ඉගැන්වීම් ද අතිඋතුම් හයවන පාවුළු ශුද්ධෝත්තම පියාණන් විසින්ම 1963 දෙසැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලද සිග්නුම් මාඤ්ඤුම් (Signum Magnum) නම් අපෝස්තලික අනුශාසනාවේත් 1969 ඔක්තෝබර් මස හත්වන දින ප්‍රකාශයට පත් කළ රෙකුරෙන්ස් මෙන්සිස් (Recurens Mensis) නම් විශ්ව ලේඛනයේත් එන ඉගැන්වීම් වැඩි දියුණු කිරීමකි. එහෙයින්ම මරියතුමිය ගැන විශේෂ අවධානය යොමුකරන මෙම වසරෙහි සැබෑ ලෙසම මරියතුමිය ගැන සභාවේ ආකල්පය කුමක්ද යන්න වටහා ගැනීම පිණිස මරිය වන්දනයෙහි එන ඉගැන්වීම් විමසා බැලීම සුදුසු යයි සිතෙයි.

### දෙවන වතිකාන මන්ත්‍රණ සභාව හා මරියතුමිය

බොහෝ දෙනෙකුගේ මතය වූයේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් මරියතුමියට දක්වන භක්තිය අඩු තක්සේරුවට ලක් කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදුකළ බවකි. එය සැබවින්ම සත්‍යයෙන් තොරවූවකි. මන්ත්‍රණ සභාවේ මතය වූයේ මරිය තුමිය වෙත දක්වන භක්ති ප්‍රණාමය නැතිකර දැමීම නොව අනෙකුත් ශාන්තුවර ශාන්තුවරියන් වෙත දක්වන භක්තිය මෙන් මරියතුමිය වෙත පිදෙන භක්තිය ද ක්‍රමවත් හා නිවැරදි මගකට ගෙන ඒමයි. වඩාත් හොඳින් නිරීක්ෂණය කළ විට පෙනීයන්නේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් මරියතුමියට සභාව තුළ වඩාත් උතුම් ස්ථානයක් හිමිකර දෙමින් සභාව තව තවත් එතුමිය වෙත ළංකිරීමක් කර ඇති බවයි.

### මරිය වන්දනය අනුශාසනයෙහි පණිවුඩය

මරිය වන්දනය එඬේරිය අනුශාසනයෙහි හැඳින්වීමෙහි මෙසේ සඳහන් වෙයි. ක්‍රිස්තුන්වහන්සේ පිළිබඳ අභිරහසත්, සභාවෙම සත්‍ය ස්වභාවයත් ගැන සභාව වත්මන් අවධියෙහි කරන මෙනෙහි කිරීම, පළමුවැන්නෙහි සම්භවයත් දෙවැන්න මගින් එය මුදුන්පත් වීමට තුඩු දෙන ක්‍රිස්තුන්වහන්සේගේත්, සභාවේත් මව වන මරියතුමිය තුළ සෙවීමට සභාව පෙළඹී සිටින්නීය. (මරියාලිස් කල්ටුස් හැඳින්වීම අංක 1) මේ නිසා දෙවියන්වහන්සේගේ ගැලවීමදායක සැලැස්මත් ක්‍රිස්තුන්වහන්සේ මගින් ඉටුවන එහි සම්පූර්ණත්වයත්, ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් දෙව්පියාණන් වහන්සේ වෙත ළඟාවීමත් පිළිබිඹු කරන ක්‍රිස්තියානි දේව වන්දනාවේ නවීකරණය වීම දේව සැලැස්ම තුළ උත්කෘෂ්ඨ ස්ථානයක් හිමිකරගෙන සිටින දෙවියන් වහන්සේගේ මාතාවනට පිදෙන භක්තියේ වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.

ලෝකය තුළ විවිධ ගැටලු හා ප්‍රශ්න මතු වී ඇත. මරිය වන්දනය උපදේශනය පවසන්නේ, මරිය තුමියට දක්වන භක්තිය ලොව තුළ තිබෙන මෙම අර්බුදකාරි තත්ත්වයට හා මිනිසා මුහුණපාන විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට හැකිවනසේ සකස් විය යුතු බවයි. මරියතුමියට කරන යාච්ඤාවන් මරියතුමිය වෙත දක්වන භක්තියේ ස්වරූපය කියා පායි.

මරිය වන්දනය එඬේරීය අනුශාසනය හැඳින්වීම හා සමාප්තිය සමග තවත් කොටස් තුනකින් සමන්විත වෙයි.

### හැඳින්වීම

- දේව වන්දනාව තුළ මරිය වන්දනය (1-23)
- මරිය වන්දනය හා බැඳුණු දේව වන්දනාත්මක නොවන අතිරික්ත වත් පිළිවෙත් (24-39)
- දේව මාතා භක්තිය හා බැඳුණු දේව වන්දනාත්මක නොවන භක්ති අභ්‍යාසයන් දෙකක් වන ශුද්ධ වූ ජපමාලය සහ තුන්කාල ආරාධනාව පිළිබඳ පිරික්සුම (46-55)
- දේව මාතා භක්ති අභ්‍යාසයන්හි අඩංගු දේව ධර්මීය හා එඬේරිය වටිනාකම සාරංශ කොට දක්වන පසුවදන හා සමාප්තිය.

### දේව වන්දනාව තුළ මරිය වන්දනය

මෙම කොටසේ විශේෂ කොට මරිය දහම පිළිබඳව සභාවේ ඉගැන්වීම් විස්තර වෙයි. මරිය තුමිය කෙරෙහි දක්වන භක්තිය පිළිබඳව සම්ප්‍රදායෙහි එන දේ හා දේව වන්දනාවට ඇතුළත් දේ ඒ ආකාරයෙන් ගෙන හැර දක්වා ඇත. එලෙසම එම විස්තර කිරීම් දේව ධර්මීයවද ඉදිරිපත් කොට ඇත. මරිය වන්දනය පිළිබඳ අංග දෙකක් මෙම පළමු කොටසට ඇතුළත් වෙයි. එනම් දේව වන්දනාව තුළ මරියතුමිය පිළිබඳව සඳහන් වන පාඨ හා ඒවාට පදනම් වූ කරුණුත්, ඒවායේ සැකැස්මත් පළමු වගන්තියෙහි අඩංගු වී ඇත. දෙවැනි වගන්තිය මගින් සභාවේ දේව වන්දනාවේ අනුරූපය ලෙස මරිය තුමිය යෝජනා කරමින් සභාව මෙහෙයවන සිද්ධාන්ත හා ස්ප්‍රිතුව විස්තර කොට දක්වයි.

### මරියතුමිය පිළිබඳව සඳහන් පාඨ

නැවත සකස් කරන ලද දේව වන්දනා ලිත මරිය තුමිය පිළිබඳ වූ මංගල්‍යයන් ක්‍රිස්තුන් වහන්සේගේ අභිරහසට වඩාත් ඒකාබද්ධ කිරීමට උත්සාහ දරා ඇත. සමහරුන් බිය පලකළ ආකාරයට මරියතුමිය පිළිබඳ දේව වන්දනාත්මක වතාවත් හා භක්තිය සීමාකරනු හෝ අහෝසි කරනු වෙනුවට මරියතුමියව ක්‍රිස්තුන් වහන්සේගේ අභිරහස සමග වඩාත් සම්බන්ධ කිරීමට උත්සාහ දරා ඇති බව මෙකී පාඨ පෙන්වා දෙයි. මෙලෙස ආගමන සමය තුළ මරියතුමියට ගෞරවය පිදෙන නිර්මල පිළිසිඳීමේ මංගල්‍යයත්, නත්තල් සමයේ පවත්වන මරියතුමිය දෙවියන්වහන්සේගේ මව්වීමේ මංගල්‍යයත් හැරෙන්නට. මෙම කාල දෙක තුළ කියැවෙන දේව වාක්‍ය පාඨ හා යාච්ඤා මගින් මරියතුමිය පිළිබඳ මතකය දේව වන්දනාවට එක්කොට ඇත.

මේ හැරෙන්නට නැවත නම් කොට ඇති මරියතුමියගේ මංගල්‍ය දෙක එනම්, ජේසු බිළිඳාව දේව මාලිගාවේ ඔප්පු කිරීමේ මංගල්ලය (කානික්ක මංගල්‍ය හෝ දේව මාතාවන්ගේ පිරිසිදුවීමේ මංගල්‍යය) හා මාංශගතවීමේ මංගල්‍යය (දේව මාතාවන්ට මංගලම් කීමේ මංගල්ලය) ලෙස නැවත නම් කොට ඇත. (6-7) ශුද්ධෝත්තම පියාණන් විසින් තම එඬේරිය අනුශාසනාව මගින් ඕනෑකමින්ම ආගමන සමය සහ දෙසැම්බර් මාසය මරිය වන්දනයට සරිලන සේ සකස් කොට ඇති බව පෙනෙයි.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු සැකසුන දේව වන්දනා ලිත මගින් මරියතුමිය පිළිබඳ මංගල්‍යයන් මෙසේ බෙදා වෙන්කොට ඇත. මංගලෝත්සව හතරකි. මරියතුමිය දෙවියන් වහන්සේගේ මව වීමේ මංගලෝත්සවය, මාංශගතවීමේ මංගලෝත්සවය, ස්වර්ගාරෝපණ මංගලෝත්සවය සහ නිර්මල පිළිසිඳීමේ මංගලෝත්සවය මංගල්‍ය තුනකි: ජේසු බිළිඳාව දේව මාලිගාවේ ඔප්පු කිරීමේ මංගල්‍ය, එළිසබෙත්තුමිය බැහැදැකීමට යාමේ මංගල්‍යය. මරියතුමියගේ උපන් මංගල්‍යය අනිවාර්ය අනුස්මරණ සහ අනුස්මරණ අටකිඃමින් මරියතුමිය ස්වර්ගීය රාජේශ්වරිය වීමේ මංගල්ලය, වික්ෂෝප මංගල්‍යය, ජපමාල මංගල්‍යය සහ මරියතුමියට දේව මාළිගාවේ ඔප්පු කිරීමේ මංගල්‍යය සිදුකළ යුතු ඒවා වන අතර නිර්මල හෘදයේ මංගල්‍යය, ලූර්දු මංගල්‍යය කාර්මෙල් මාතා මංගල්‍යය සහ දේව මාතා මහා බැසිලිකාවේ මංගල්‍යය වෛකල්පිත ඒවා ලෙස ගැනෙයි.

මරියතුමිය පිළිබඳව සමහර මංගල්‍යයන් දේව වන්දනා ලිතෙන් ඉවත්කර තිබුණත් (නිදසුන් මරියතුමියගේ ශ්‍රී නාමයේ මංගල්‍යය, දයාවේ මරියතුමියගේ මංගල්‍යය) ඒවා ප්‍රාදේශිය වශයෙන් පැවැත්වීමට බාධාවක් නැති බව මරිය වන්දනය එඬේරිය අනුශාසනාව පැහැදිලිකර දී ඇත.

මංගල්ලයෙහි අරුත හා පරමාර්ථය විස්තර කර දීමටත් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට අනුව මරියතුමිය සහ සභාවත් අතර වූ සම්බන්ධතාවය පහදා දීමටත් දිව්‍ය පූජා නියමයෙහි මරියතුමිය පිළිබඳ එකිනෙක මංගල්‍ය දිනයෙහි කියැවෙන යාච්ඤාවන් බොහෝසේ උපයෝගි කොටගෙන ඇත. දිව්‍ය පූජා සංග්‍රහයෙහි මරියතුමියගේ මංගල්‍යයන් වෙනුවෙන් තෝරාගත හැකි දේව වාක්‍යය පාඨ විශාල සංඛ්‍යාවක් හඳුන්වා දී ඇති අතර යාම යැදුමෙහි මරියතුමියට ගැයෙන ගීතිකා, ස්තෝත්‍ර ගී හා යැදුම් හා දේව වාක්‍ය පාඨ ද මරියතුමියට සභාවේ භක්තිය කියාපාන ආකාරයට සකසා ඇත.

ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ පිළිවෙතේදීත්, රෝගීන් ආලේප කිරීමේදීත්, පැවිදි පොරොන්දු දීමේදීත් හා තවත් එවන් වත් පිළිවෙත් වලදීත් මරියතුමියගේ මැදිහත්වීම අපේක්ෂා කරනු දැකිය හැකිය. වෙනත් වචනයෙන් කිවහොත් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් කර ඇත්තේ මරියතුමිය කිතුනු ජීවිතය තුළින් ඉවත්කිරීම නොව, ක්‍රිස්තියානි ජීවිතයේ සෑම අත්‍යවශ්‍ය මොහොතකටම ඇතුළත් කිරීමය. මරිය වන්දනය එඬේරීය උපදේශනය පිරික්සීමේදී පෙනීයන්නේ මරියතුමිය සභාව තුළ වඩාත් සමීප කොට ගනිමින් සංඛ්‍යාත්මක නොව, ගුණාත්මකව හා යෝග්‍යාකාරයෙන් එතුමිය සභා වන්දනාව තුළට ඇතුළත් කොටගෙන ඇති බවකි. මෙලෙස හයවන පාවුලු පාප්තුමන් විසින් මරිය භක්තිය පිළිබඳව දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු ඇතිවූ දූර්මතවලට පිළිතුරු සපයා ඇත.



### දේව වන්දනාව තුළ මරියතුමිය සභාවේ ආකෘතියක් ලෙස

පළමු කොටසේ දෙවන වගන්තියෙන් මරියතුමිය සභාවෙහි දේව වන්දනාව හා සම්බන්ධ වන ආකාරය ගැන මෙනෙහි කිරීමක යෙදෙයි. මෙයට මූලික හේතුව වන්නේ, සභාව මෙම වත්මන් යුගයෙහි ජීවත්වන පිණිස දේව වන්දනාව ක්‍රිස්තුන් වහන්සේගේ අභිරහස සක්‍රමේන්තු ආකාරයෙන් ප්‍රකාශ වීමට සලසා ඇති හෙයිනි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ශුද්ධ වූ සභාව පිළිබඳව ප්‍රකාශයෙහි ඒ ගැන මෙවන් අදහසක් දක්වා ඇත. 'මරියතුමිය සැම විටකම මෙම අභිරහස සමග ඉතා සමීප සම්බන්ධතාවයකින් බැඳී සිටි අතර, තවමත් එසේ වන්නීය. එලෙසම එතුමිය විශ්වාසයේත් දේව ප්‍රේමයේත් ශ්‍රෙෂ්ඨතම නිදර්ශනය ලෙස ක්‍රිස්තුන් වහන්සේගේ අභිරහසට ක්‍රියාකාරි ලෙස සහභාගිවන්නීය.

ශුද්ධ වු සභාව පිළිබඳ ප්‍රකාශය අංක 63, බලන්න) කෙනෙකු තම ජීවිතය දෙවියන් වහන්සේ වෙත මුළුමනින් ඔප්පුකිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි එම තැනැත්තා තුළ අවබෝධයක් තිබිය යුතුය. ඔබගේ කැමැත්ත සිදුවේවා'යි (මතෙව් 16:10) යනුවෙන් ස්වාමිවාක් ආරාධනයෙහි ඇති ඉල්ලීම තමන් තුළ ඉටුවන ආකාරය බලාපොරොත්තු වෙමින් "මම ස්වාමින්වහන්සේගේ දාසිය වෙමි" යි (ලූක් 1:38) පැවසීමට මරිය තුමියට හැකිවිය. මරියතුමියගේ මෙම කැමැත්ත ප්‍රකාශ කිරීම සියලුම ක්‍රිස්තියානින් වෙනුවෙන් කළ එකකි. එය දෙවියන් වහන්සේගේ කැමැත්තට කීකරුකම දැක්වීමේ ආදර්ශය අඩංගු කෙනෙකුගේ 'ස්ව-තෘප්තිය' ප්‍රකාශ කරන මාර්ග යයි. (අංක 21)

මරියතුමිය වෙත සභාව දක්වන භක්තිය ශත වර්ෂ ගණනාවක් පුරා පැවතෙමින් එන්නක් බව මරිය වන්දනය එඬේරිය උපදේශනය පවසයි. ක්‍රිස්තියානින්ගේ වන්දනාව ක්‍රිස්තුන්වහන්සේ තුළ ශුද්ධාත්මයාණන් මගින් දෙව්පියාණන්ට ඔප්පු කරන්නකි. (25) මුල් අවධියෙහි පෙරදිග මෙන්ම බටහිර ද දේව වන්දනා පිළිවෙතෙහි සභාවේ යාච්ඤාවට මරියතුමිය ද ඇතුළත් කොටගෙන ඇති බව දක්නට ලැබෙයි (10) මරියතුමියගේ යාච්ඤාවට එක්ව සභාවද පියාණන් වහන්සේට යාච්ඤා කරන අතරම සභාව සෘජුවම මරියතුමියට ද යාච්ඤා කරන්නීය; එතුමිය පසසන්නීය; එතුමිය ගැන මෙනෙහි කරන්නීය. අංක 13 සහ 14 හි සඳහන් වන 'දෙවියන් වහන්සේගේ ශුවිශුද්ධ වූ මාතාවෙනි' යන යාච්ඤාවෙහි මෙය පැහැදිලි ලෙස දැකිය හැකිය. (මෙය 3 වන ශත වර්ෂයේදී ඊජිප්තුවේ ගලක කොන තිබි හමුවු යාච්ඤාවකි.)

සැබවින්ම දේව වන්දනාවෙහි එන මරිය වන්දනය එතුමියට පුදකෙරෙන පුද්ගලික යාච්ඤාවලට සමීප බවක් දැක්වෙයි. මුල් අවධියේ සිටම සභාව තම වන්දනාවෙහිදී ආදර්ශය වශයෙන් ගුරුකොට ගත්තේ මරියතුමිය නමැති ආකෘතියයි. ශුද්ධෝත්තම පියාණන් පවසන ආකාරයට සභාවේ මුල් යුගයේ සිට සිදුවූවාක් මෙන්, ඇනුදු දේව වචනයට ඇහුම්කන් දෙන විටත්, දිනපතාම ලෝකයේ ගැළවීම සඳහා යදින විටත් ප්‍රසාද ස්නාපනය මගින් සභාවට නව සාමාජිකයන් ඇතුළුකර ගන්නා විටත් දිව්‍ය සත්ප්‍රසාදීය යාගයේදීත් සභාව මරියතුමිය තම යාච්ඤාවට එක්කර ගනියි. (16-20) සභාව මරියතුමිය තම ගුරුවරිය වශයෙන් ගන්නා අතරම, එතුමිය වෙත දක්වන ආදරය හා එතුමියගේ ආරක්ෂාවට භාරවීම ආදිය ගැන මරිය වන්දනය දීර්ඝ ලෙස කරුණු දක්වයි. (22) ශුද්ධෝත්තම පියාණන් ඒ ගැන මෙවැන්නක් පවසයි. මරියතුමිය ගැන කරන උපදේශනය කුමක් විය යුතු දැයි තමන් හොඳාකාර දන්නා බව පවසන ශුද්ධෝත්තම පියතුමා, මරිය වන්දනාව විශේෂයෙන්ම දේව වන්දනාව තුළ මරිය වන්දනය මනා ලෙස වැඩි වර්ධනය කළ යුතු බව තවදුරටත් පවසයි. (26 සහ 67)

මතු සම්බන්ධයි »

දොමිනිකාන නිකායික
**ගරු ජයලත් බලගල්ල පියතුමා**

### රජරට විසූ තවත් එක් රජෙක්

# ගරු රෙජිනෝල්ඩ් සිල්වා නි. ම. නි. පියතුමා

**ශ්‍රී ලංකා ඉතිහාසයේ රන් අකුරෙන් ලියවී ඇති මුළු රටටම කීර්තිය ලබාදුන් රජරට විසූ රජවරු මෙන්ම ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙන කතෝලික සභාවට කීර්තිය ලබාදුන් සිය පූජක දිවියේ අඩකට වඩා රජරටටම කැපව ආත්මයන් දෙවියන් වෙත දිනාදීමේ මහඟු කාර්යේ යෙදමින් වැඩවිසූ මෙතුමා නිර්මලමරිය නිකායේ ගරු රෙජිනෝල්ඩ් සිල්වා පියතුමාය.**

අදමෙන් සංවර්ධනය නොවූ ඒ යුගයේ වනාන්තර මැදින් අඩි පාරවල්, කරත්ත පාරවල් ඔස්සේ ගමන් කරමින් අලි, කොටි, වලසුන් නයි පොළොන්ගු වැනි විෂඝෝර සර්පයින්ගේද, 1957 සිදුවූ මහ ගංවතුර, දැඩි නියය, භීෂණය. තාඩන පීඩන වලට මුහුණදී රජරට මංමුලාවී සිටි කිතුනුවන්ට දේව රාජ්‍යයට මඟපෙන්වීම සඳහා මෙතුමා තරම් වෙහෙසවූ තවත් පියතුමකු නැති තරම්ය. දේව නීතිය අකුරටම පිළිපදින මෙතුමා එවකට තිබූ සතුරු බලවේග යනට නොබියව නොසැලී එඩිතරව මුහුණදී කිතුනුවන් ආක්‍රමණය කළේ ඉවසීම කරුණාව පෙරදැරිකරගෙනය.

එතුමාට රජබොජුන් තිබුනේ නැත. රොටිය, ලුණු මිරිස, බඩ ඉරිඟු කරල, බොරදිය හොඳට හුරු පුරුදුය. රජරට විසිරී සිටි ආගම ධර්මය උගැනීමට අපහසු ප්‍රසාද නිධාන ලබාගැනීමට අවස්ථාව නොලත් දරුවන් සඳහා අලගොල්ලෑව ග්‍රාමයේ තිබූ රෝ. ක. පාසලට ඇතුලත් කිරීම සඳහා ගැහැනු පිරිමි කුඩා නේවාසිකාගාර දෙකක් සාදා එතුමන් විසින් මසකට වරක්



දිව්‍ය පූජාවා පවත්වන නිවෙස් පිහිටා තිබුනු ගම්වල එනම් තලාව, තඹුත්තේගම, සේනපුර, කාගම, නිකවැව, හොරව්පතාන, මරදංකඩවල යන ග්‍රාමයන්ගෙන්ද මැදවච්චිය, නොච්චියාගම කලාඔය යන ස්ථානයන්ගෙන්ද ළමයිනට ඉගැනීම ආගම ධර්මය හැදෑරීම සහ ප්‍රසාද නිධාන ලබාගැනීම සඳහාද නේවාසිකව රඳවා දරුවනට පහසුකම් සලසා දෙන ලදි.

තරුණ අවධියේ සිටම රජරට විසූ මෙතුමාට කෘෂිකර්මාන්තය ගැන හසල දැනුමක් ඇත. කැත්ත උදැල්ලේ වැඩ හොඳට හුරුපුරුදුය. එතුමන් 'ගොවිරජා' යන නාමයෙන් පිදුම් ලද්දෙකි. විශේෂයෙන් කලාඔය අලගොල්ලෑව ඇතුළු සේවය ලද සැම ස්ථානයකම අඹ, පොල්, දොඩම්, දෙළුම්, පේර වැනි ස්ථිර බෝග වගාවන් මෙතුමා අතින්ම සිටුවන ලද ඒවා විය අදටත් දක්නටත් භුක්ති විඳින්නටත් හැකිය.

1957 දෙසැම්බර් මස රජරට මහා විනාශයක් කළ මහ ගංවතුර එවකට කලාඔය තිබූ කුඩා දේවස්ථානය සම්පූර්ණයෙන්ම විනාශවී ගියත් දේවමාතා ප්‍රතිමාව එලෙසින් විනාශ නොවී ඉතිරිවූ ප්‍රාතිහාර්යෙන් පසුව ගරු පියතුමන් විසින් දැනට අලංකාරව සාදා නිමකර ඇති ලූර්දු මාතා දෙව්මැඳුරේ අවසන් කාලයේදී සේවයේ යෙදී සිට මේ ධෛර්යමත්වූ පියතුමා අමිලවූ උතුම් වූ සේවාවෙනුත් වැව්බැඳි රාජ්‍යයෙන්ද පිටමංවී මග්ගොන සහ කොහුවල වැඩිහිටි නිවාසයන්හි විවේක සුවයෙන් සිට පූජක දිවියේ හැටවසරකුත් නිමාකොට විසූ මෙතුමන් උපත ලද්දේ 1922 අගෝස්තු මස 5 වනදාය.

අඩ සිය වසරකට ආසන්න කලක් රජරට සේවය කළ මෙතුමා 2010.07.10 දින සග සැපත්විය. රජරට රජෙකු වූ මෙතුමා මිහිදන්කර ඇත්තේද එතුමන් විසින් සාදා නිම කරන ලද රජරට කලාඔය ලූර්දු මාතා දේව මාලිගාවේය.

**මාරි පැන්සි පෙරේරා**

# පැවිදි වරයේ හැටවන සංවත්සරය සැමරූ ගරු මැක්ෂිමා රූපසිංහ පැවිදි සොයුරිය

**ගුරු වෘත්තියේ වසර තිස් දෙකක් සපුරමින් ගාල්ල, ශ්‍රී හෘදය, නුවරඑළිය කරිටාස් මාතර සාන්ත මරියා රත්නපුර ජේසු බිළිඳුන් යන කන්‍යාරාමයන්හි ශ්‍රේෂ්ඨ මව්තුමිය ලෙසින් සේවය කළ මාතර සාන්ත මරියා කන්‍යාරාම විදුහලේ විදුහල්පතිනිය ලෙස අමිල සේවාවන් ඉටු කළ ගරු මැක්ෂිමා රූපසිංහ සොයුරි 2014 අගෝස්තු 20 දින පැවිදි වරයේ හැට වසර දෙවි සමිඳුන්ට තුති පුදමින් සමරනු ලැබුවාය.**

අගරදගුරු පදවියේ වැලිකන්න ග්‍රාමයේ විසූ මිගෙල් රූපසිංහ හා කැතරින් රූපසිංහ යුවලගේ බාල දියණිය ලෙස 1930 ජූනි 30 උපත ලද ගරු මැක්ෂිමා සොයුරිය සොයුරන් දෙදෙනකුගේ සහ සොයුරියන් හයදෙනෙකුගේ කණිටු නැගනියද වෙයි. වැලිකන්න සාන්ත මරියා රෝ. ක. පාසලින් මූලික අධ්‍යාපනයෙන් අනතුරුව අගනුවර යහපත් එඬේරා සහ රත්නපුර ජේසු බිළිඳා කන්‍යාරාම විදුහල්වලින් අධ්‍යාපනය ලබා ඉංග්‍රීසි ගුරුවරියක ලෙස ගුරු සේවාවට අත්පොත් තැබුවාය. දේව සේවයට නොතිත් ආශාවෙන් පසුවූ



ඇය 1952 පෙබරවාරි 11 දින පැවිදි වරයට ඇතුල්වීමේ පරම පවිත්‍ර චේතනාවෙන් ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාමයට ඇතුලු වූවාය. 1954 අගෝස්තු 20 සාන්ත බර්නාඩ් මුනිවර මංගල දින පොරොන්දු දීමෙන් පසු 1958 ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාම විදුහලේත් 1962 මාතර සාන්ත මරියා කන්‍යාරාම විදුහලේත් සේවය කර 1968 දී මාතර සාන්ත මරියා කන්‍යාරාම විදුහල්පතිනිය ලෙස විවිධ අභියෝග හමුවේ අඛණ්ඩ අමිල සේවාවක් ඉටුකර 1990 ජූනි 30 ඉසුඹු ලැබුවාය. මාතර සාන්ත මරියා කන්‍යාරාම විදුහල පුද්ගලික පාසලක් වශයෙන් පවත්වාගෙන යෑමට හැකිවීම කැපී පෙනෙන සිද්ධියක් විය.

ඉසුඹු ලැබීමෙන් පසුව වුවද එතුමිය සුනාමියෙන් විනාශ වූ මාතර සාන්ත මරියා විදුහල ගොඩනැගීම සඳහා නැවත මාතරට කැඳවා ගැනීම තුළින් ගම්‍ය වූයේ සේවා අවශ්‍යතාවයන් සඳහා නැතුවම බැරි චරිතයක් වූ බවය. වර්තමානයේ රත්නපුර ජේසු බිළිඳු කන්‍යාරාමයේ දේව සේවයේ නියැලෙන ගරු මැක්ෂ්මා සොයුරියට නිරෝගි සම්පන්න ජීවිතයක් තුළින් ඉදිරියටත් සුවිශාල මෙහෙවරක් ඉටුකිරීමට දේව වරප්‍රසාද බහුලව ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

**තියබෝල්ඩ් සමරතුංග**

# නිහතමානි දේශපාලන චරිතයක් වන මිල්රෝයි ප්‍රනාන්දු මහතා

**විසිපස් වසරක් මෙරට මැතිසබය නියෝජනය කළ මිල්රෝයි ප්‍රනාන්දු මහතා අපේ කිතුනු කමට ප්‍රමුඛ තැන දුන්නෙකි.**

සරල දිවිපැවැත්මක් ඇති මෙතුමා ඉතා නිහතමානිය. නිලයෙන් හා බලයෙන් හිස උදුම්මා ගත් නිසරුවන් වැඩි පිරිසක් සිරිලක දේශපාලන බිමේ සැරිසරන අද වැනි යුගයක මේ මහතා ඒ අතින් ඉතා ආදර්ශමත් තැනක සිටී. මොහුට ඒ ගුණයුත් යහපත් දිවිය හුරු කළේ අපේ දෙව්මැඳුර හා කිතුනු අධ්‍යාපනයැයි සක් සුදක් සේ පැහැදිළිය. පාවහන් යුගලක්ද නොමැතිව බොහෝ අවස්ථා වලදී යන එන මිල්රෝයි ප්‍රනාන්දු නමැති දේශපාලකයා තුළින් පිළිබිඹු වෙන්නේ 'පාලකයෙක්' නොව 'සේවකයෙකි.' ඕනෑම කෙනෙකුට ළංවී කතා බහ කළ හැකි නිසා ජනතා හිතවාදි මිත්‍රශීලි මිනිසෙකි. කුමන තරාතිරමක කෙනෙකු වුව සතුටු සිතින් දෙන කෑමක් - බීමක් හොඳ හිතින් කන බොන හොඳ හිතක් ඇති ජනතා මිත්‍රයෙකි. අතිගරු ජනාධිපතිතුමා කීවා සේ පාරවල් මං මාවත් කොතෙක් තැනුවත් ජනතාවට ගතින් සිතින් සමීපවිය නොහැකි නම් ඉන් පලක් නැත. මෙතුමා ජනතාවගේ දුකේදී



හා සැපේදී ළඟ සිටිනුයේ ඉතා සුහදශීලිවය. උඩඟුකම, උජාරුව, සෝබනය නැත. කුමන උස් තැනක සිටියත් සිය පරණ මිතුරුකම් කිසි දිනෙක අමතක නොකළේය. මුහුදු වැල්ලේ සුවඳ නිසිලෙස හඳුනන ධීවර ජීවිතයේ රිද්මය මනාසේ දත් ධීවර ජනතාවගේ සැබෑ ධීවර නියෝජිතයෙකි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ධීවර ඇමතිව සිටියදී මිල්රෝයි ප්‍රනාන්දු මහතා ධීවර නියෝජ්‍ය ඇමතිතුමාය එකල ධීවර ජනතාවට දැක්වූ ප්‍රතිචාරය ඉතා අගේය. ලංකාවේ ප්‍රථම 'ඉදිවර' ධීවර බැංකුව ස්ථාපිත කළේ ද මේ යුගයේදීය. මීගමුව අමතක නොකළ අපේ ධීවර යුග පුරුෂයෙකි.

මෙවන් කතෝලික දේශපාලකයින් රටේ සියලුම පක්ෂ තුළ ගොනුවේනම් එමගින් රටට - සමාජයට - ලොවට හෙළ කතෝලික හැදියාවේ ගුණ සුවඳ විහිදෙ. පක්ෂය කුමක් වුවද අදත් මිගමුවේ ගරු ඩෙන්සිල් ප්‍රනාන්දු මැතිතුමාව අගයනුයේ ඒ හැදුනු - අවංක - කිතුනු දම්මග අනුව ජීවිතේ සියලු කටයුතු ඉටු කිරීමට ගත් හරි උත්සහය නිසාය. පුහුදුන් මිනිසුන් හැටියට අපි දෙව්වරු නොවෙමු. එහෙත් උත්තරීතර තැනක් වන මැතිසබය තුළ ගරු මිල්රෝයි මැතිතුමා කිතුනුවකු ලෙස කළ කී දෑ සුවඳ දේ! ගිය ගමන අහිංසාවාදිවේ!

**පිටිපන මා ජයවීර**

# දේවමාතා බැතියට යාවජීව වෙමින් අඩසිය වසර සපිරූ ජාඇල ඊ පිලොමිනා ප්‍රනාන්දු මෙනවිය

**පෙර දවස සාන්ත සභා මාතාව දේව මාතාවහන්සේගේ දරු සමාගම ලෙස හඳුන්වා දෙමින් ඕතුමියට බැතිබර භක්ති අභ්‍යාසයක් ඇරැඹිණි.**

ජාඇල සභාව ඉහත කාල වලදී අයත්ව තිබුණේ තුඩැල්ල සහ වැලිගම්පිටිය මීසම් වලටය. එම කාල වකවානුවලදී ඊ. පිලොමිනා ප්‍රනාන්දු මෙනවිය දේව මාතා දරු සමාගමේ සාමාජිකත්වය උසුලමින් යාවජීව සාමාජිකාවක ලෙස නියැලින. පසුකාලයේදී ස්වාධීන මීසමක් බවට පරිවර්තනය වෙමින් ජාඇල සභාව, මෙම සමිති සමාගම් වල ක්‍රියාකාරීත්වය අඛණ්ඩව පවත්වාගෙන ආහ. දැනුදු ක්‍රියාකාරීව පවතී.

කාලයාගේ ඇවෑමෙන් දේවමාතා දරු සමාගම මරිය හමුදාව හා ඒකාබද්ධ කෙරිනි. මෙසමයේ මරිය ගැති ගරු කේ. විලියම් පෙරේරා පියතුමන් ජාඇල මීසම පාලනාධිපති විය. ඉන් ඉක්බිති තෙවන මීසම්පති ලෙස පත්වූ ගරු හියුගෝ ජේසුදාස ප්‍රනාන්දු පියනම, මරිය හමුදා ජාඇල ශාඛාව වැඩිදියුණු කරනු අටියෙන් මාළිය සභාවද ඊට එක්කෙරින, මෙසමයේ මරිය හමුදා අධ්‍යක්ෂ වූයේ එතුමන්ය.

එදාමෙන්ම අදත්, පිලොමිනා ප්‍රනාන්දු මරිය හමුදාවේ ක්‍රියාකාරී සමාජිකාවක් වන අතර දිව්‍ය හෘද සමිතියේද සාමාජිකත්වය වර්ෂ 1950 දී ලබාගත්තාය. වසර 40 හා 50 සම්පූර්ණ කරමින් පදක්කම් ලබාගෙන ඇත. මීට අමතරව, මීසමේ පොදු වැඩවලදී ඇය කාර්යක්ෂමවේ. වසරක් පාසා සිදුකරන පාස්කු දර්ශන පෙන්වීම සඳහා උපයෝගි කරගන්නා වූ ප්‍රතිමා ඇඳුම් (ලෝගු) සැකසීම සඳහා ඇය ඉමහත් වෙහෙසක් දරන්නීය. අන් අයද ඈඳා ගනිමින් ඇය නායකත්වය ගනී.

අප ශුද්ධ වූ සභා මාතාව දේව අම්මාගේ උපන් දිනය සමරන සැප්තැම්බර් මස 08 වෙනිදා ඇයගෙ'ද ජම්ම දිනය යෙදීම දෛවෝපගත සිද්ධියකි. මේ බව අනාවරණය කළේ එදින පැවති මංගල දිව්‍ය පූජා යාගය අවස්ථාවේදී පිලොමිනා ප්‍රනාන්දු මෙනවියගේ සේවය අගයමින් ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු මීසම් පාලක පියතුමන් විසිනි. එය අගනේය. ඇයගේ ජ්‍යෝෂ්ඨත්වයට උපහාරයක් බඳුන් වන ලෙසය.

අප සුපෙම්බර වික්ෂෝප දේව මෑණියන් වහන්සේගේ මධ්‍යස්ථකමින්, දෙවි සමිඳුන්ගේ පිහිටාශිර්වාදයෙන් නිදුක්, නිරෝගී, යහපත් ජීවිත දීර්ඝ ගමනක් යෑම සඳහා අවැසි සියලු වරම් බහුලව දානය කරත්වා! යනු අපගේ සුභාශිංසන පැතුමවේ.

ඊ. පිලොමිනා ප්‍රනාන්දු මෙනවියනි ඔබට අසිරිමත් උපන් දිනයක් වේවා!

**එල්. එස්.**
**නෙල්සන් ප්‍රනාන්දු**



**පවුල් හා පැවිදි වර්ෂයක් .. 1 පිටුවෙන්**

සමාරම්භක මෙහෙය නොවැම්බර් 29 හෝ 30 මීසම් හා දේවස්ථාන මට්ටමින් පැවැත්වෙන අතර පදවි මෙහෙය නොවැම්බර් 30 දා කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ රදගුරු හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ. මේ වසරේ දෙසැ. 28 වැනිදාට යෙදෙන ශුද්ධවූ පවුලේ මංගල්‍යය දින පවුල් දිවියේ උදාරත්වය සහ පාරිශුද්ධත්වය මතු කරන වැඩසටහන් මීසම් මට්ටමින් පැවැත්වෙන පවුල් දිනයේ දී සිදු කිරීමට බලාපොරොත්තු වේ.

මේ අතර කැපකළ ජීවිත ඔප් නංවන පැවිදි දිනයක් 2015 පෙබරවාරි 1 හෝ 8 ඉරුදින වලින් එකක දී පැවැත්වෙනු ඇත. පවුල තුළින් එන දේව කැඳවීම් ප්‍රවර්ධනය පිණිස කටයුතු කැරේ.

පවුල් දූත සේවාව මඟින් ජාතික සමුළුවක් ජාත්‍යන්තර සම්පත් දායකයන්ගේ ද සහභාගිත්වයෙන් පැවැත්වේ. අගරදගුරු වසමේ සිද්ධස්ථානයන්හි ධර්ම විවේක පැවැත්වේ.

මිශ්‍ර විවාහ පිළිබඳ පූර්ණ අවධානයක් යොමු කරන අතර ඒ පවුල්වල දරුවන් ගැන දැඩි සැලකිල්ලෙන් විමසා බලනු ඇත. පවුල් උපදේශනයට විශේෂ තැනක් හිමිවන අතර පූර්ව හා පශ්චාත් විවාහ සමුළු දෙදිනක් පුරා පැවැත්වීමට සැලසුම් කැරේ. මීසම්වල පවුල් බැහැදැකීම වඩාත් සක්‍රීය කරමින් ඒ සඳහා පැවිදි සහෝදර සහෝදරියන් මීසම් සේවක පියවරුන් සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරන්නට යොමු කරනු ඇත. දේව කැඳවීම් ප්‍රදර්ශන මගින් පැවිදි දිවියට තරුණ තරුණියන් යොමු කිරීම ගැන ද අවධානය යොමු වේ.

යෝජිත වසර වෙනුවෙන් විශේෂ අපෝස්තලික අනුශාසනා පත්‍රයක් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් නිකුත් කරනු ලැබීමට නියමිත අතර එය ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ පළ කැරෙනු ඇත.

**දේව සේවක .. 1 පිටුවෙන්**

මෙයට දේව සේවකයාණන්ගේ සේවය ලැබූ අනුරාධපුර රදගුරු පදවියේ කාගම හා අලගොල්ලෑව ජනතා නියෝජනයක් ද වෙසෙසින් මීගමුව පුරවරයේ සැදැහැවත් ජනතාවක් ද සහභාගි වෙතැයි අපේක්ෂා කැරේ.

අනුස්මරණ දිව්‍ය යාගයෙන් අනතුරුව බැසිලිකා දෙව් විමනේ භූගර්භ දේවස්ථානයේ (යට පල්ලිය) දේව සේවකයාණන්ගේ දේහය තැන්පත් කර ඇති ස්ථානයේ දී අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පුෂ්පෝපහාර පිදීමද සිදු කෙරේ. දිව්‍ය යාගයට සහභාගි වන සැදැහැවතුන් සුදු මල් මිටක් රැගෙන පැමිණ එයට සහභාගි වන ලෙස අනුස්මරණ කමිටුව ඉල්ලා සිටී.

# ඉදිගොල්ල සා. ජූඩ් සිද්ධස්ථාන වාර්ෂික මංගල්‍යය

ගම්පහ, ඉදිගොල්ල සා. ජූඩ් සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය 62 වරට ඔක්තෝබර් 25-26 දිනවල පැවැත්වේ. මංගල මහා පූජාව 26 ඉරුදින පෙ.ව. 8.30 ට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.



ඉදිගොල්ල සා. ජූඩ් දෙව්මැඳුර ශුද්ධවූ ජූඩ් තද්දේවුස් මුනිතුමා නමින් ඉදිවුණු දිවයිනේ පළමුවන දේවස්ථානය වන අතර එතුමාගේ නමින් කැපවුණු ලංකාවේ එකම ජාතික සිද්ධස්ථානය ද වේ. එවකට ගම්පහ මීසම පාලනය කළ ගරු පිලිප් දිසානායක නි.ම.නි. පියතුමාගේ සංකල්පයකට අනුව 1950 පමණ වන විට ඉදිගොල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි කතෝලික පවුල් දහයක් වෙනුවෙන් මෙම දෙව්මැඳුර ඉදිවුණි. 1952 වර්ෂයේ මාර්තු 29 වන දින එවකට කොළඹ අගරදගුරු අති උතුම් තෝමස් කුරේ (පසුව කාදිනල් පදවියට පත්) හිමිපාණන්ගේ අතින් මුල්ගල තබා දේවස්ථානයේ වැඩ ආරම්භ කැරිණ. මෙම දෙව්මැඳුර සා. ජූඩ් මුනි නමට කැප කළ යුතුය යන්න ගරු පිලිප් දිසානායක පියතුමාගේ සිතුවිල්ලකි.

දේවස්ථානයේ වැඩකටයුතු සුළුවෙන් ආරම්භ කළත් ශුද්ධවූ ජූඩ් මුනිතුමාගේ වරප්‍රසාද බහුලව ලැබෙන්නට වීමත්, බලාපොරොත්තු රහිත අවස්ථාවලදී පිහිට පතා පැමිණෙන්නන්ගේ ඉල්ලීම් ඉටුවීමත්, දස දෙසින් දහස් සංඛ්‍යාත වන්දනාකරුවන් පැමිණීමත් නිසා දේවස්ථානය ඉතා වේගයෙන් දියුණු වන්නට විය.

හැටේ දශකයේ මුල ඉදිගොල්ල සා. ජූඩ් දේවස්ථානයේ භාරකාරත්වයට පත් වුයේ කාර්මලයිට් නිකායට අයත් පියවරුන් ය. විදේශීය පියවරුන් තිදෙනෙක් (බෙල්ජියම්) හා දේශීය පියවරු දෙදෙනකුගෙන් යුත් මෙම කණ්ඩායම පාලනය කළ කාලය තුළ ඉදිගොල්ල දේවස්ථානයේ විශාල දියුණුවක් ඇති විය. දේවස්ථාන ගොඩනැගිල්ලේ සියලු වැඩ නිම කළ අතර විශාල මීසම් ගෘහයක් ද තනවන ලදි. අක්කර පහක ඉඩමක් මිලදී ගෙන දේවස්ථාන භූමිය අක්කර 10 දක්වා පුළුල් කර මුළු ඉඩම වටාම අදත් පවතින කොන්ක්‍රීට් තාප්පය තනවන ලදි. කාර්මලයිට් පියවරුන්ගෙන් පසුව කොළඹ පදවියේ පියවරුන්ගේ පාලනයට සිද්ධස්ථානය අයත් විය.

1992 වර්ෂයේ ඉදිගොල්ල සිද්ධස්ථාන පාලක තනතුරට පත්ව ආයේ වත්මන් අම්පිටිය ජාතික දෙව්සත්හලේ අදියුරු අතිගරු එල්මෝ ඩයස් පියතුමා ය. ඉතා ක්‍රියාශීලි මෙන්ම මනා කළමනාකරණයෙන් පරිපූර්ණ අති දක්ෂ පාලකයකු වන එතුමෝ දේවස්ථානය හා සම්බන්ධ සමිති සමාගම් පණ ගන්වා සුබසාධන වැඩසටහන් ආරම්භ කළහ. විශේෂයෙන් ඉදිගොල්ල දේවස්ථානයට වසර 50 පිරීමේ ස්වර්ණ ජයන්ති ජුබිලි උත්සවය උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමේ මහා කාර්යයට මාර්ගෝපදේශකත්වය දීම හා එය ක්‍රියාත්මක කිරීමේ වගකීම උන්වහන්සේට පැවරිණි. මේ වන විට දහස් ගණනින් පැමිණෙන වන්දනාකරුවනට මුල් දෙව්මැඳුර ඉඩ මදකම දුටු උන්වහන්සේට නව දෙව්මැඳුරක අවශ්‍යතාව පෙනී ගියේය. උන්වහන්සේගේ උපදේශකත්වය ඇතිව ඉදිගොල්ල සභාවේ සහ කිතුනු සභා පාලකයන්ගේ අනුදැනුමෙන් දෙස් විදෙස් සැදැහැවතුන්ගේ උපකාරයෙන් හා විශේෂිත පුද්ගලයකුගේ ධන පරිත්‍යාග යකින් ඉදි කළ දහස් ගණනකට එකවර රැස්විය හැකි, අති විශාල නව දෙව්මැඳුර ස්වර්ණ ජයන්තියේ තිළිණය මෙන්ම දැවැන්ත සිහිවටනය බවට පත්ව ඇත.

සැම ඉරුදින පෙ.ව. 7.00 ට පෙ.ව. 10.00 හා ප.ව. 5.00 ට දිව්‍ය පූජා යාගයන් පැවැත්වේ. සඳුදා හැර සතියේ දිනවල ප.ව. 5.00 ට බ්‍රහස්පතින්දා දින පෙ.ව. 6.30 ට පෙ.ව. 10.00 ට ප.ව 5.00 ට දිව්‍ය පූජා පැවැත්වේ. මාසයේ පළමු බ්‍රහස්පතින්දා පෙ.ව. 6.30, 8.30, 10.., 11.30 ට හා ප.ව. 5.00 ට දිව්‍ය පූජාවන් පැවැත්වෙන අතර ප.ව. 7.30 ට දිව්‍ය සත්ප්‍රසාද පෙරහර සහ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පැවැත්වේ. සැම පසළොස්වක පොහොය දින පෙ.ව. 10.00 ට සුව මෙහෙය පැවැත්වේ.

වත්මන් සිද්ධස්ථාන පාලක අතිගරු නොයෙල් නෝනිස් පියතුමා සිද්ධස්ථානයේ ප්‍රගතියට විශාල වැඩ කොටසක් කරන අතර දහම් පාසල පැවැත්වීම හා වන්දනාකරුවන් වෙනුවෙන් දැනට ඉදිවෙමින් පවත්නා විශාල දෙමහල් ගොඩනැගිල්ලද එතුමාගේ සිතුවිල්ලක ප්‍රතිඵලයකි. ලංකාවේ ප්‍රථම වතාවට සා. ජූඩ් මුනිතුමන් වෙනුවෙන් ගැයුනු ගීතිකා 12 කින් සමන්විත සී. ඩී. තැටියක් ද මෙවර එළි දකී.

**(ප්‍රැන්සිස් ජයකොඩි)**

# සෙත් සරණින් නීති සරණ

සෙත් සරණ - කරිටාස් කොළඹ ආයතනය සංවිධානය කරන නීති සායන පෙළක් පහත සඳහන් පරිදි පැවැත්වේ.

**2014 ඔක්. 18** - පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මට්ටක්කුළිය සා. මරියා දෙව්මැඳුරු ශාලාවේදී, **2014. ඔක්. 22** - පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මීගමුව තිල්ලන්දූව සා. ජෝශප් දෙව්මැඳුරු ශාලාවේදී, **2014 නොවැ. 08** - පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දැලතුර කනිෂ්ඨ ද්වීතිය විද්‍යාලයේ දී, **2014 නොවැ. 22** - පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මොරටුව සා. සෙබස්තියන් දෙව්මැදුරු ශාලාවේදී, **2014 නොවැ. 29** - පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කළුතර කටුකුරුන්ද රෝ.ක. විද්‍යාලයේ දී

මෙම නීති සායනයන් සඳහා දිවයිනේ අති දක්ෂ නීතිඥ කණ්ඩායමක් සහභාගි වීමට නියමිතය. මහ ජනතාවගේ නීතිමය ගැටලු කුමක් වුවත් ඕනෑම නීතිමය ගැටලුවකට අවශ්‍ය විසඳුම් මෙම නීති සායනයන්හිදී ලබා ගත හැකි බව සංවිධායකයෝ පවසති. කලාතුරකින් ලැබෙන මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා ලෙස සෙත් සරණ ආයතනය අදාළ ප්‍රදේශවාසී ජනතාවගෙන් ඉල්ලා සිටී. මෙම නීති සායනයන් සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ. **(විධායක කළමනාකරු කේ. ඩී. ජේ. ටයිටස් විමලසිරි)**

# දේවස්ථාන හා පාසල් ගායනා කණ්ඩායම් සඳහා එක්දින පුහුණු වැඩමුළුවක්

අගරදගුරු වසමේ මීසම් හෝ, පාසල්වල ගීතිකා කණ්ඩායම් සාමාජික සාමාජිකාවන් සඳහා එක්දින පුහුණු වැඩමුළුවක් නොවැම්බර් 06 පසලොස්වක පොහෝ දින පෙ.ව. 8.00 සිට ප.ව. 5.30 දක්වා මරදාන සාන්ත ජෝශප් විද්‍යාලීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

කොළඹ අගරදගුරු වසමේ ජනවන්දනා කොමිසම මෙය සංවිධානය කරන අතර ජෝශප් වාස් භාරය ඊට අනුග්‍රහය දක්වයි. මීට අමතරව සාන්ත ජෝශප් විදුහල වැඩසටහන කළමනාකරණය කරයි. ප්‍රකට සංගීත අධ්‍යක්ෂවරයකු වන ප්‍රැන්සිස් ඩී. අල්මේදා ඇතුලු ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් අදාළ පුහුණුව ලබා දෙනු ඇත.

දෙදහසකට වැඩි පිරිසක් සහභාගි වෙතැයි අපේක්ෂා කරන අතර වැඩ සටහන අවසානයේ දේවමාතා පෙරහරක් සමග දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය සිදු කැරේ. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය සිය ගීතිකා කණ්ඩායම් නායක නායිකාවන්/ ගුරුවරුන්, මීසම් සේවක පියතුමන් හෝ පාසල් අධ්‍යක්ෂ පියතුමන් මගින් ඉල්ලුම් කළ හැකිය. සහභාගි වන සැමට සහතික පතක් ප්‍රදානය කරන අතර ඔක්තෝබර් 25 වැනිදාට පෙර අයදුම්පත් යොමු කළ යුතු ය.

**ලිපිනය:**
**ගරු ඉන්ද්‍රජිත් පෙරේරා පියතුමා,**
**අගරදගුරු පදවි ජනවන්දනා කොමිසමේ කාර්යාලය, අගරදගුරු මැදුර, කොළඹ 08.**



**දිවයිනේ ප්‍රධාන කතෝලික පාසලක් වන කෝට්ටේ සා. තෝමස් විදුහලේ විදුහල්පති පියතුමාගේ අදහසක් අනුව සිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා අභිනවයෙන් ඉදිවූ දිව්‍ය හෘදයේ ප්‍රතිමා මණ්ඩපය පාසලට මහත් ආශිර්වාදයක් හා ආලෝකයක් වී ඇත.**

පසුගිය දා කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් මේ ප්‍රතිමාව ආසිරි ගැන්වූ අතර එම ප්‍රතිමාව පරිත්‍යාග කළ නිව් ඇන්ටනිස් ආයතනයේ අධිපති චමල් මහතා ඇතුළු සැමට විදුහල්පති නිලන්ත උඩුවක පියතුමා පාසල වෙනුවෙන් ස්තුතිය පුදකර සිටී.



ලූර්දුව බලා පියාසර කළ ගුවන් යානය තුළ හදිසි අනතුරකට භාජනය වූ ප්‍රදීප ලේඛක කැලිස්ටස් ජයමාන්න මහතා පුද බිම කරා රෝද පුටුවකින් මොරිස් බොල්ලෑගල මහතා විසින් කැඳවාගෙන එනු ලබන අයුරු. බිරින්දෑවරු ද දෙපසින් සිටිති.

ලූර්දු ජලය ස්නානයෙන් පසු ජයමාන්න මහතාට රෝද පුටුව තවදුරටත් අවශ්‍ය නොවීම කාගේත් අවධානයට ලක්වූ සිද්ධියක් විය.

# මරිය හටයා සග සුව දිනයි



**වසර 50 කට අධික කාලයක් විල්ලෝරාවත්ත ජෝෂ්ඨ පිරිමි ප්‍රසිඩියමේ සහ මේ වනතුරු මොරටුව මරිය වහන්සේගේ අති පාරිශුද්ධ නාමයේ ප්‍රසිඩියමේ සාමාජිකත්වය දැරූ හොරේතුඩුවේ පදිංචිව සිටි ඇන්ටනි ලියනගේ සහෝදරයා පසුගියදා සගසුව දිනීය.**

මොරටුව ජෝෂ්ඨ ක්‍යූරියාවේ වසර 9ක් සභාපති ධුරයද, කනිෂ්ඨ ක්‍යූරියාවේ වසර 6ක් සභාපති ධුරයද ඉසුලු ඔහු අගරදගුරු පදවියේ ලංකා අප ස්වාමිදූවගේ කොමිට්සියම් සභාවේ උපලේකම් ධුරය වසර තුනක කාලයක් උසුලන ලදී. මොරටුව සාන්ත සෙබස්තියන් දෙව්මැඳුරේ මීසම් ධර්ම සේවා සභාවේ ලේකම් වශයෙන් වසර 18ක් (1979-1997) සේවය කළ අතර ගිහි තේවාධාරියකු ලෙස එම දේවස්ථානයේ සහ තේවත්ත බැසිලිකා දේවස්ථානයේ ද, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදාදීමට සහය විය. ඉරුදින දහම් පාසල් අවස්ථාවේ දී දෙමව්පියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා සහය ලබා දී ඇති අතර මරිය හමුදා තූර්යවාදක කණ්ඩායම ආරම්භ කිරීම සඳහා කැපවූ සහෝදරයෙකි.

**(සනී ප්‍රැන්සිස් ප්‍රනාන්දු)**

# මුළු දිවයිනටම සාම විනිසුරු



**උඩුබද්දාව පදිංචි ඒ. ඒ. ඇන්ටනි හියුබට් මහතා මුළු දිවයිනටම සාම විනිසුරුවකු ලෙස කුලියාපිටිය ගරු දිසා විනිසුරු තුමා ඉදිරිපිට පසුගියදා දිවුරුම් දුන්නේ ය.**

උඩුබද්දාව ශු. ජුවානාදාර්ක් කනිටු විදුහලේ අවු. 15 පමණ විදුහල්පති ලෙස සේවය කොට විශ්‍රාම ලැබූ ඒ මහතා සමථ මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද ප්‍රදේශයේ විවිධ සමිති රැසකද නිලතල හොබවයි. උඩුබද්දාව ශු. ජුවානාදාර්ක් දෙව්මැඳුරේකිතුනු දූත සේවා මණ්ඩලයේ හා වින්සන් ද පාවුලා සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙසද තම සේවය ලබා දෙයි. **(මයිකල් කැනිසියුස්)**



**1872 වර්ෂයේ පොල්අතු පැලකින් ආරම්භ වූ වසර 142 ක අතීතයකට උරුමකම් කියන ගලගෙදර ශුද්ධවූ රෆායෙල් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්විණ.**

සන්ධ්‍යා මෙහෙය කුරුණෑගල පදවි අනුනායක අතිගරු මිල්රෝයි ෆොන්සේකා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර මංගල්‍ය මෙහෙය අතිගරු චන්දන පෙරේරා පියතුමා විසින් පැවැත්වීය. 2009 දෙසැම්බර් 19 වනදා සිදු වූ රිය අනතුරකින් මෙම ඉපැරණි දෙව්මඳුර සම්පූර්ණයෙන් විනාශ විය. වර්තමාන මීසම්භාර පියතුමන් වන ගරු මයිකල් සන්දනම් පියතුමාගේ අප්‍රතිහත ධෛර්යය මත 2012 වර්ෂයේ අප්‍රේල් 19 වන දින ඉතාමත් මනරම් දෙව්මැඳුරක් දේව වරප්‍රසාදයෙන් තිළිණ විය. මෙම ඓතිහාසික දෙව්මැඳුර භාග්‍යවර ජුසේ වාස් සමිඳුන්ගේ ශුද්ධවූ පහසින් ආශිර්වාද ලත් දෙව්මැඳුරකි. **(ධම්මිකා බණ්ඩාර)**


## කාරුණික දැනුම් දීමයි

**pradeepaya@yahoo.com සහ pradeepaya@sltnet.lk ඊ මේල් ලිපිනයන් ප්‍රදීපය පුවත්පත් ලිපි එවීම සඳහා පමණක් භාවිත කරන්න.**
**ප්‍රදීපය දැන්වීම් එවීම සඳහා පමණක් pradeepayaadds@yahoo.com භාවිත කරන්න.**


# උපත නත්තල් සඟරාවට ලිපි භාර ගැනේ

**උපත නත්තල් සඟරාවේ පස්වන කලාපය සඳහා ඔබේ ගද්‍ය, පද්‍ය ලිපි නිර්මාණ භාර ගැනීම දැන් සිදු කෙරේ. ඔබගේ නිර්මාණ කෙටියෙන් ලියා ඔබේ නම ලිපිනය සහ ඡායාරූපයක් ද සමඟ පහත ලිපිනයට යොමු කරන්න.**
**සංස්කාරක, උපත 'ප්‍රියන්ත' නිමල මරිය මාවත, වෙන්නප්පුව.**



# ප්‍රදීපය
## මංගල යෝජනා
### මනාලියෝ

මීගමුවට නුදුරු, කතෝලික, 1976 ජුනි උපන්, උස 5' 1", Bsc උපාධිධාරී දියණියට සහකරුවකු දෙමව්පියෝ සොයති. පියා ඉංජිනේරුවකු වන අතර මව උපාධිධාරිනියකි. කොම්පියුටර් ඉංජිනේරුවරියක ලෙස කොළඹ සේවය කරයි. නිවසක්, ඉඩමක් සහ අනිකුත් ඇද ඇයට හිමිය. දු.අ. 077-3747432. **e-mail: jad mdon1946@gmail.com** අංක **NG7441**, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**



## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු
## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/- ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- දැන්වීම ෆැක්ස් කළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (3 1/2' 6") එවන්න.

**ගරු අධ්‍යක්ෂ පියතුමා,**
**කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**
**දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692586**